*2 වැනි පරිච්ඡේදය*

# ජාතික නිෂ්පාදිතය හා වියදම

## 2.1 සමස්ත නිරීක්ෂණ


- **2004 වසරේ සියයට 5.4 ක වර්ධනය සමඟ සැසඳීමේදී, දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මූර්ත වශයෙන් සියයට 6.0 කින් වර්ධනය විය**. විශේෂයෙන්ම ධීවර සහ හෝටල් අංශ කෙරෙහි සුනාමියේ සෘණාත්මක බලපෑම සමඟ, පළමු කාර්තුවේදී ආර්ථික වර්ධනය සියයට 4.4 දක්වා පහත වැටිණි. කෙසේ වෙතත්, විවිධ කම්පනයන්ට ඔරොත්තු දීමට ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති හැකියාව පිළිබිඹු කරමින් වර්ෂයේ ඉතිරි කාර්තු තුන තුළදී ආර්ථිකය සියයට 6 කට වඩා වැඩි අගයකින් වර්ධනය විය. තෙල් මිල වැඩිවීම සහ අපනයනය සඳහා පැවති දැඩි ජාත්‍යන්තර තරගකාරීත්වය මධ්‍යයේ මෙම වර්ධනය සාක්ෂාත් කර ගැනීම ප්‍රශංසනීය වේ. සිව් වන කාර්තුව වන විට සුනාමියේ අහිතකර බලපෑමෙහි ක්‍රමික අඩුවීමක් දැකිය හැකි විය.

- **2005 වසරේදී, ප්‍රධාන ආර්ථික අංශ තුන අතුරින් කර්මාන්ත අංශය සියයට 8.3 ක ඉහළම වර්ධනය ඇතිකර ගනු ලැබූ අතර එය සමස්ත වර්ධනයට සියයට 36.3 කින් දායක විය**. පුළුල් පදනමකින් යුතු වූ මෙම වර්ධනය, තුළින්, නිමැවුම් කර්මාන්ත, පතල් හා කැනීම්, ඉදිකිරීම් සහ විදුලිය හා ජලය යන උප අංශ හතරෙහිම ඉහළ ක්‍රියාකාරීත්වය පිළිබිඹු කළේය. තෙල් මිල ඉහළ යාම සහ බහු කෙඳි ගිවිසුම අවසන් වීම මගින් ඇති වූ අභියෝග තිබියදීත්, කම්හල් කර්මාන්ත උප අංශයෙහි ඉහළ ක්‍රියාකාරිත්වයක් දැකිය හැකිවිය. විදේශීය වෙළෙඳපොළ සහ දේශීය ඉල්ලුම අඛණ්ඩව පුළුල් වීම මෙන්ම අපනයන නිෂ්පාදන අංශයේ ඔරොත්තුදීමේ හැකියාව, මෙම වර්ධනය සඳහා දායක විය.

- **සේවා අංශය සියයට 6.4 කින් වර්ධනය වූ අතර, එය සමස්ත වර්ධනයට සියයට 59.3 කින් දායක විය**. මෙම අංශයේ මන්දගාමී වර්ධනයට ප්‍රධාන වශයෙන් හෝටල් අංශයේ කටයුතුවල පහත වැටීම සහ ආනයන වෙළෙඳාමේ අඩු වර්ධනය හේතු විය. විදුලි සංදේශ, මූල්‍ය සේවා සහ දේශීය වෙළෙඳාම, සේවා අංශයේ වර්ධනයට වඩාත් දායක වූ අංශයන් විය.

**2.1 රූප සටහන**

**වාර්ෂික වර්ධන අනුපාතික**




- **2004 වර්ෂයේ දී, පසුබෑමකට ලක්වූ කෘෂිකාර්මික අංශය, සුනාමි ව්‍යසනයට පසු ධීවර කර්මාන්ත උප අංශයේ ක්‍රියාකාරීත්වයේ පසුබෑම මධ්‍යයේ වුවද, සියයට 1.5 කින් වර්ධනය වී සියයට 4.4 කින් ආර්ථික වර්ධනයට ධනාත්මකව දායක විය**. මහ සහ යල දෙකන්නයේම වී අස්වැන්න වාර්තාගත මට්ටමකට ළඟාවීමට සතුටුදායක කාලගුණ තත්ත්වය උපකාරී විය. එමෙන්ම, සතුටුදායක කාලගුණ තත්ත්වයේ ආධාරයෙන් සුළු අපනයන භෝග, අතුරු ආහාර භෝග සහ එළවළු නිෂ්පාදනයේ ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් අනෙකුත් කෘෂිකාර්මික උප අංශයද, වී වගාව තරමටම කෘෂිකාර්මික අංශයේ වර්ධනයට දායක විය.

- **සියයට 16.6 ක වර්ධනයක් වාර්තා කරමින්, 2005 දී පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. රුපියල් බිලියන 2,366 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත**. මෙම වර්ධනය මූර්ත ආර්ථික වර්ධනය වේගවත් වීම මෙන්ම පසුගිය වසරට සාපේක්ෂව සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ වැඩි වීමද පිළිබිඹු කළේය.

- **සමස්ත මිල උද්ධමනය මනිනු ලබන ද.දේ.නි. අවධමනකය සියයට 9.9 ක් වූ අතර එය 2004 වර්ෂයේදී වාර්තා වූ සියයට 9.3 ට වඩා ඉහළ අගයක් විය**. ඉහළ යන තෙල් මිලද ඇතුළත් ඉහළ යෙදවුම් පිරිවැය සහ ඉහළ ණය වර්ධනය මගින් මෙන්ම රාජ්‍ය අංශයේ වැටුප් වර්ධනය මගින් ජනිත කළ ඉල්ලුම නිසා මිල මත වූ පීඩනය මෙම ඉහළ යාම තුළින් පැහැදිලි වේ. 2004 වසර සමඟ සැසඳීමේදී, සියයට 0.7 ක සාමාන්‍යයකින් අති ප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, සාපේක්ෂව ස්ථාවරව පැවති අතර, එය දේශීය මිල මත පීඩනයක් ඇති නොකළේය.

- **2005 සඳහා ඒක පුද්ගල ද.දේ.නි. රුපියල් 120,282 ලෙස ඇස්තමේන්තු කර ඇත. එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 15.4 ක වර්ධනයකි**. එක්සත් ජනපද ඩොලර් අගයෙන් ඒක පුද්ගල ද.දේ.නි. 2004 වසරේ එ.ජ. ඩොලර් 1,030 සිට එ.ජ. ඩොලර් 1,197 දක්වා සියයට 16.1 කින් වර්ධනය විය.

- **දේශීය හා විදේශීය යන දෙ අංශයෙන්ම ඇති වූ පරිභෝජන හා ආයෝජන ඉල්ලුම 2005 වර්ෂයේ ද.දේ.නි. වර්ධනයට දායක විය**. භාණ්ඩ අපනයන වර්ධනය, මූර්ත වශයෙන් 2005 වර්ෂයේ සියලුම කාර්තු වල සියයට 6 කට වැඩි අගයකින් ඉහළ ගියේය. දේශීයව නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවා සඳහා වූ දේශීය ඉල්ලුමද වර්ධනය වූ නමුත්, එය 2002 වර්ෂයේ සටන් විරාමයෙන් ඇති වූ සුභවාදී තත්වයට පසුව එළඹි වර්ෂ දෙකට වඩා අඩු මට්ටමක පැවතිණි. එසේම, පසුගිය වර්ෂ දෙක හා සැසඳීමේදී දේශීය නිෂ්පාදනය, ඉල්ලුමේ

**2.1 සංඛ්‍යා සටහන**

**ස්ථාවර (1996) සාධක වියදම් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය**

| අංශය | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි.හි වෙනස්වීමේ දයකත්වය (%) | | ද.දේ.නි.යට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2004 (අ) | 2005 (ආ) | 2004 (අ) | 2005 (ආ) | 2004 (අ) | 2005 (ආ) |
| **කෘෂිකාර්මික** | **- 0.3** | **1.5** | **- 1.2** | **4.4** | **17.9** | **17.2** |
| **1 කෘෂිකර්මය. දුව ආදී වන ද්‍රව්‍ය සහ ධීවර කර්මාන්තය** | **- 0.3** | **1.5** | **- 1.2** | **4.4** | **17.9** | **17.2** |
| 1.1 කෘෂිකර්මය | - 0.9 | 8.8 | - 2.3 | 20.2 | 13.9 | 14.2 |
| තේ | 1.5 | 2.5 | 0.4 | 0.5 | 1.3 | 1.2 |
| රබර් | 3.2 | 10.8 | 0.2 | 0.6 | 0.3 | 0.4 |
| පොල් | 0.1 | - 2.2 | 0.0 | - 0.5 | 1.2 | 1.1 |
| වී | - 15.1 | 24.4 | - 8.8 | 10.4 | 2.6 | 3.0 |
| අනෙකුත් | 3.7 | 6.5 | 5.9 | 9.2 | 8.5 | 8.5 |
| 1.2 දුව ආදී වන ද්‍රව්‍ය | 1.3 | 1.7 | 0.4 | 0.5 | 1.7 | 1.7 |
| 1.3 ධීවර කර්මාන්තය | 1.6 | - 42.2 | 0.7 | - 16.3 | 2.3 | 1.3 |
| **කාර්මික** | **5.2** | **8.3** | **25.4** | **36.3** | **26.4** | **27.0** |
| **2 පතල් සහ කැනීම් කටයුතු** | **7.9** | **14.1** | **2.5** | **4.0** | **1.7** | **1.9** |
| **3 නිමැවුම් කර්මාන්ත** | **5.1** | **6.0** | **15.3** | **16.3** | **16.3** | **16.3** |
| 3.1 තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම් | 1.3 | 2.7 | 0.4 | 0.8 | 1.7 | 1.7 |
| 3.2 නිෂ්පාදන කර්මාන්ත | 6.1 | 6.1 | 14.9 | 13.6 | 13.4 | 13.4 |
| 3.3 කුඩා කර්මාන්ත | 0.0 | 9.8 | 0.0 | 1.9 | 1.2 | 1.2 |
| **4 විදුලිය සහ ජලය** | **- 2.5** | **23.3** | **- 0.7** | **5.6** | **1.5** | **1.7** |
| 4.1 විදුලිය | - 3.6 | 26.3 | - 0.9 | 5.5 | 1.3 | 1.5 |
| 4.2 ජලය | 5.2 | 3.8 | 0.2 | 0.1 | 0.2 | 0.2 |
| **5 ඉදිකිරීම්** | **6.6** | **8.9** | **8.3** | **10.3** | **7.0** | **7.2** |
| **සේවා** | **7.6** | **6.4** | **75.8** | **59.3** | **55.6** | **55.8** |
| **6 තොග හා සිල්ලර වෙළෙඳම සහ හෝටල් හා ආපනශාලා** | **6.1** | **2.6** | **24.7** | **9.5** | **22.3** | **21.6** |
| 6.1 ආනයන වෙළෙඳම | 9.0 | 2.3 | 16.3 | 3.8 | 10.2 | 9.8 |
| 6.2 අපනයන වෙළෙඳම | 7.7 | 6.9 | 3.4 | 2.8 | 2.5 | 2.5 |
| 6.3 දේශීය වෙළෙඳම | 2.0 | 4.2 | 3.4 | 6.3 | 9.0 | 8.8 |
| 6.4 හෝටල් සහ ආපන ශාලා | 13.1 | - 29.0 | 1.6 | - 3.4 | 0.7 | 0.5 |
| **7 ප්‍රවාහනය. ගබඩා කිරීම සහ සන්නිවේදනය** | **13.7** | **12.7** | **33.9** | **30.8** | **14.6** | **15.5** |
| 7.1 ප්‍රවාහනය | 4.2 | 3.3 | 6.3 | 4.5 | 8.1 | 7.9 |
| 7.2 භාණ්ඩ මෙහෙයවීම සහ ගබඩා කිරීම | 12.8 | 9.8 | 2.1 | 1.6 | 0.9 | 1.0 |
| 7.3 තැපැල් සහ විදුලි සංදේශ | 31.4 | 27.0 | 25.5 | 24.7 | 5.5 | 6.6 |
| **8 මූල්‍ය සේවා. දේපල වෙළෙඳම් සහ ව්‍යාපාරික සේවා** | **5.6** | **6.5** | **12.0** | **12.7** | **11.7** | **11.7** |
| 8.1 මූල්‍ය සේවා | 6.6 | 7.5 | 11.2 | 11.6 | 9.3 | 9.5 |
| 8.2 දේපල වෙළෙඳම්, බදු දීම් සහ ව්‍යාපාරික සේවා | 1.7 | 2.8 | 0.8 | 1.1 | 2.4 | 2.3 |
| **9 රාජ්‍ය පරිපාලනය. අනෙකුත් රාජ්‍ය සේවා හා ආරක්ෂක කටයුතු සහ අනෙකුත් ප්‍රජා. සාමාජ්ය හා පෞද්ගලික සේවා** | **3.9** | **5.4** | **5.1** | **6.4** | **7.1** | **7.0** |
| 9.1 රාජ්‍ය පරිපාලනය, අනෙකුත් රාජ්‍ය සේවා සහ ආරක්ෂක කටයුතු | 2.0 | 5.1 | 1.7 | 3.7 | 4.4 | 4.3 |
| 9.2 අනෙකුත් ප්‍රජා, සාමාජීය සහ පෞද්ගලික සේවා | 7.1 | 6.0 | 3.4 | 2.6 | 2.7 | 2.7 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **5.4** | **6.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | 19.3 | 46.2 | | | | |
| **දළ ජාතික නිෂ්පාදිතය** | **5.3** | **5.5** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ධනය සපුරා ලීම සඳහා, ආනයනයන්ට වඩා වැඩි වේගයකින් මූර්ත වශයෙන් වර්ධනය විය.

- **2005 වර්ෂය තුළදී පරිභෝජනය මධ්‍යස්ථව වර්ධනය විය**. වේතන වියදම් හා සුනාමියෙන් පසු මානුෂීය ආධාර සඳහා වූ වියදම් නිසා, රාජ්‍ය පරිභෝජනය, පෞද්ගලික පරිභෝජනයට වඩා වැඩි අනුපාතයකින් වර්ධනය විය.

- **2003 වර්ෂයේ දෙවන අර්ධයේ සිට සැලකිය යුතු ලෙස වර්ධනය වූ ආයෝජන වාතාවරණය. 2005 වර්ෂයේදී තව දුරටත් පැවතියේය**. සුනාමිය බලපෑ ප්‍රදේශවල ජනජීවිතය සාමාන්‍ය අතට පත්කිරීමේ පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා, පෞද්ගලික සහ රාජ්‍ය අංශයන් යන දෙකෙහිම ආයෝජනවලින් කොටසක් යොදවනු ලැබීය. මේ අතර, සුනාමිය බල

නොපෑ ප්‍රදේශවල ආයෝජන කටයුතු අඛණ්ඩව පැවතිණි.

- **සම්පූර්ණයෙන්ම රජයේ ආයෝජන හේතුවෙන්, මුළු ආයෝජන/ද.දේ.නි. අනුපාතය සියයට 25 සිට 26.5 දක්වා ඉහළ ගියේය.** රජයේ ආයෝජන සියයට 119.4 කින් ඉහළ ගිය අතර, එමගින් දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය ආයෝජන අනුපාතය සියයට 4.2 ක් දක්වා දෙගුණ විය. මෙම ඉහළයාම පෞද්ගලික ආයෝජන/ද.දේ.නි. අනුපාතය මෙන්ම රාජ්‍ය සංස්ථා (Public Corporations) ආයෝජන අනුපාතය ද ආන්තිකව අඩු කිරීමට බලපෑවේය.

- **විදේශ හා දේශීය ඉල්ලුම යන දෙකෙහිම ප්‍රතිලාභ ලබමින් පෞද්ගලික ආයෝජන අඛණ්ඩව ඉහළ ගිය නමුත්, එම වේගය පසුගිය වර්ෂ දෙකට සාපේක්ෂව මන්දගාමී විය.** පසුගිය කාලපරිච්ඡේදය තුළ, සටන් විරාම ගිවිසුමෙන් අනතුරුව සහ බහු කෙඳි ගිවිසුමෙන් ලැබුණු ආරක්ෂණය අහිමි වීමට මුහුණ දීමේ පෙර සූදානමක් ලෙස විදුලි සංදේශ, ප්‍රවාහන හා නිමැවුම් කර්මාන්ත යන ක්ෂේත්‍රවල පෞද්ගලික ආයෝජන සැලකිය යුතු ලෙස වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික ආයෝජන ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් එය තවදුරටත් එම වර්ධනයේම පවත්වාගැනීමේ අසීරුතාවයන්ද ඇති කෙරිණි.

- **විදේශීය ශුද්ධ සාධක ආදායම සඳහා ගලපන ලද ද.දේ.නි. වශයෙන් නිර්වචනය කළ දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.), ද.දේ.නි. වර්ධනයට වඩා අඩු අනුපාතිකයකින්, එනම් මූර්ත වශයෙන් සියයට 5.5 වූ අතර එය පසුගිය වර්ෂයට වඩා ආන්තිකව වැඩි වර්ධනයකි.** 2005 වර්ෂය තුළදී තව දුරටත් සෘණ අගයක් පවතිමින් විදේශ ශුද්ධ සාධක ආදායම සියයට 46 කින් පිරිහීමට ලක් විය. ණය පමා සහන කාලයේ ප්‍රතිලාභයක් ලෙස පොලී ගෙවීම් සඳහා පිටතට ගලා යන මුදල් ප්‍රවාහ අඩු නමුත්, රුපියල අධි ප්‍රමාණය වීම සහ අදල තක්සේරු වටිනාකම හීන වීම නිසා රට තුළට ගලා එන මුදල් ප්‍රවාහ සාපේක්ෂව වැඩි අගයකින් පහත වැටීම හේතුවෙන්, දළ ජාතික නිෂ්පාදිතය මත ඉහළ දල දේශීය නිෂ්පාදිතයේ ධනාත්මක බලපෑම අඩුකරන ලදී.

- **දේශීය හා ජාතික ඉතුරුම් ඉහළ ගියේය.** රජයේ නිර්-ඉතුරුම් පහත වැටුණු අතර ආයතනික අංශයේ ඉහළ ලාභදායීත්වය හේතුවෙන් දේශීය පෞද්ගලික ඉතුරුම් ඉහළ ගියේය. මේ අතර ජාතික ඉතුරුම්වල වර්ධනයට උපකාර වෙමින් පෞද්ගලික සංක්‍රාමවල වැඩිවීම විදේශීය ශුද්ධ සාධක ආදායමේ පිරිහීම අභිබවා ගියේය.

- **2004 වර්ෂයේ දෙසැම්බර් 26 දින සිදුවූ සුනාමි ව්‍යසනය, හානියට පත්වූ පළාත්වල සංවර්ධන අපේක්ෂාවලට අහිතකර බලපෑමක් ඇති කළේය.** එය වෙරළ තීරයෙන් තුනෙන් දෙකක් පමණ වන උතුර, නැගෙනහිර, දකුණ හා වයඹ වෙරළබඩ පළාත් වලටද, මුළු ජනගහනයෙන් සියයට 2 සිට 3 දක්වා ප්‍රමාණයකට පමණ ද බලපෑවේය. සුනාමියෙන් විනාශ කළ ජීවිත හා ජීවිකාවන් නැවත ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි අතර, සුනාමිය නිසා ඇතිවූ හානිය දළ ජාතික නිෂ්පාදියෙන් සියයට 4.5 ක් වේ යැයි ඇස්තමේන්තු කර ඇත. ධීවර හා සංචාරක අංශයන්ගේ අනාගතය ප්‍රධාන වශයෙන්ම පීඩාවට ලක් වූ අතර, තොග හා සිල්ලර වෙළඳාම සහ ප්‍රවාහනය මෙන්ම කුඩා කර්මාන්තද සාපේක්ෂව අඩු වශයෙන් ඊට ගොදුරු විය. මත්ස්‍ය නිෂ්පාදනය 2006 වසර අග භාගය වන විට සුනාමියට පෙර පැවති මට්ටමට පත්වේ යැයි අපේක්ෂා කෙරේ. සංචාරක කර්මාන්තය යථාතත්ත්වයට පත්වීම පිළිබඳව අනාවැකි පළ කිරීම අසීරු වන්නේ නැවත යථාතත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන්ම සංචාරකයන්ගේ ආකල්ප හා අවබෝධය මත රඳ පවතින බැවිනි. තාවකාලික හා ස්ථිර වාසස්ථාන ඉදි කිරීම, මාර්ග සහ වෙනත් යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සමඟ 2005 වර්ෂය තුළදී නැවත ඉදිකිරීම් කටයුතු සිදු වුවද, බලපෑමට ලක්වූ ප්‍රදේශ සම්පූර්ණ වශයෙන් යථා තත්ත්වයට පත් කිරීමට සහ ඉදිරියට ගෙන ඒමට තව බොහෝ දේ ඉදිරි වසර තුළදී කළ යුතු වේ. ස්ථිර නිවාස ඉදි කිරීමේ සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ බොහෝ ව්‍යාපෘති ගණනක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉදිරියේදීද ක්‍රියාත්මක වීමට නියමිතය.

## 2.2 ආංශික ප්‍රතිපත්ති සහ ආයතනික පහසුකම්

- **2005 වසරෙහි ජාතික නිෂ්පාදිතයේ වර්ධනය හිතකර දේශීය හා විදේශීය සාධක කිහිපයක මෙන්ම අහිතකර විදේශීය හා අභ්‍යන්තර බලපෑම් හා අභියෝගවලට මුහුණ දීමට ආර්ථිකයට ඇති හැකියාවෙහි ප්‍රතිඵලයක් විය.** මේ අනුව, රජයේ නව ආර්ථික ප්‍රතිපත්ති මාලාව යටතේ නව ආංශික ප්‍රතිපත්ති මෙන්ම, රජය හා පුද්ගලික අංශය මගින් සපයන ලද ආයතනික පහසුකම් තුළින් යහපත් ආර්ථික ක්‍රියාකාරිත්වයක් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය විය. කෘෂිකාර්මික අංශයට හා කාර්මික අංශයට සපයන ලද ආයතනික පහසුකම් මෙම කොටසෙහි විස්තර කෙරෙන අතර, ඒවායේ බලපෑම සහ අතුරු සම්බන්ධතා පිළිබඳ විශ්ලේෂණයක් පසු කොටස්වලින් සිදු කෙරෙනු ඇත.

### කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ ආයතනික පහසුකම්

- **පසුගිය දශක පහ තුළ බලයට පත් වූ සියලුම රජයයන් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ප්‍රයත්න දරා ඇත.** නිදහස ලැබුද සිට, කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා විශාල වශයෙන් රාජ්‍ය ආයෝජනයන් සිදුකර තිබේ. විශේෂයෙන්ම, වාරිමාර්ග යටිතල පහසුකම් ඇති කිරීමට සහ පර්යේෂණ, ව්‍යාප්ති සේවා, වෙළෙඳපොළ යටිතල පහසුකම් සැපයීම, සහනාධාර සැපයීම සහ සමාජ ආරක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කෘෂිකාර්මික ආයතන වලින් සැදුම්ලත් පුළුල් ආයතනික ජාලයක් පිහිටුවීමට ආයෝජනය කර ඇත. එනමුත්, ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ හා ව්‍යාප්ති සේවා තුළින් අධි තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා වඩා හොඳින් ඉලක්ක කරගත්

ක්‍රියාකාරී සහායක් ලබා ගැනීමට මෙම ජාලය වඩාත් හොඳින් සම්බන්ධීකරණය විය යුතුව ඇත.

- **කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය අරමුණු කර ගනිමින් 2005 නොවැම්බර් මාසයේ බලයට පත් වූ නව රජය වඩාත් පුළුල් වූ ප්‍රතිපත්ති මාලාවක් යෝජනා කර තිබේ.** කෘෂිකාර්මික වර්ධනය ලබාගත යුතු වන්නේ වාරි ජලය සැපයීම, වගා කිරීම සඳහා ඉඩම් ලබාදීම, හොඳ තත්ත්වයේ බීජ සැපයීම, සහනදායී මිලකට පොහොර ලබාදීම, කෘෂි තාක්ෂණය, මූල්‍ය සම්පත්, කෘෂි ව්‍යාප්ති සේවා, කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම සහ ගබඩාකරණය සඳහා යටිතල පහසුකම් ඇති කිරීම, ආයෝජකයන්ට රාජ්‍ය මූල්‍ය දිරි ගැන්වීම් සැපයීම, කුඩා ඉඩම් හිමියන් දිරි ගැන්වීම සහ විශේෂිත ප්‍රතිපත්ති හා දිරිගැන්වීම් මගින් තේ, රබර්, පොල්, කිරි පට්ටි පාලනය සහ ධීවර අංශ සංවර්ධනය කිරීම තුළිනි. කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා 2006 අයවැයෙන් ප්‍රතිපත්ති මාලාවක් හඳුන්වා දී තිබේ. මේවා අතුරින් විශේෂයෙන්, දැනට පවතින පොහොර සහනාධාරය යටතේ සියළුම ගොවියන්ට කිලෝ ග්‍රෑම් 50 ක යූරියා පොහොර මිටියක් රුපියල් 550 කට ලබා දීමට අමතරව, වී ගොවියන් සඳහා කිලෝ ග්‍රෑම් 50 ක පොහොර මිටියක් රුපියල් 350 ක සහන මිලකට සැපයීම; 2005/06 මහ කන්නයේ සිට රජයේ වී ගැණුම් මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 16.50 - රුපියල් 17.50 දක්වා ඉහළ නැංවීම; කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ලබා දෙන ණය ප්‍රමාණය මුළු ණයදීම්වලින් සියයට 10 ක් වන පරිදි කෘෂි ක්ෂේත්‍රයට සපයන ණය පහසුකම් වැඩි කරන ලෙස බැංකුවලට නියම කිරීම; පළතුරු, එළවළු, සහල්, කැපූ මල්, විසිතුරු පැල, සහ කාබනික කෘෂි නිෂ්පාදන අපනයනය කිරීමෙන් ලබන ආදායම මත පනවන ලද සියයට 15 බද්ද ඉවත් කිරීම; කුඩා වතු හිමියන් සඳහා විශේෂ අවධානයක් සහිතව වැවිලි බෝග අංශයේ සංවර්ධනය සඳහා රුපියල් බිලියන 10 ක චක්‍රීය අරමුදලක් ස්ථාපිත කිරීම; තේ, පොල්, රබර් නව වගාව සහ නැවත වගාව සඳහා ලබාදෙන සහනාධාරය සියයට 25 කින් වැඩි කිරීම; තේ, පොල් සහ රබර් සකස් කිරීමේ කර්මාන්තශාලා සඳහා පනවා තිබෙන ආර්ථික සේවා ගාස්තුව සියයට 1 සිට සියයට 0.5 දක්වා පහත හෙළීම; කිරි සඳහා ගෙවන මිල වැඩි කිරීම; සහ කිරි ගොවීන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ කිරි සකස් කිරීම සඳහා ආනයනය කෙරෙන යන්ත්‍ර සූත්‍ර ආනයන බදු සහ එකතු කළ අගය මත අය කරන බද්දෙන් නිදහස් කිරීම එකී ප්‍රතිපත්ති මාලාවට ඇතුළත් වේ.

- **තේ, රබර්, පොල් සහ උක් වගා අංශ ආවරණය වන පරිදි වැවිලි කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ජාතික සැලැස්මක් පිළියෙල කර තිබේ.** මෙම දිගුකාලීන සංවර්ධන සැලැස්මෙන් බලාපොරොත්තු වන්නේ ඵලදායිතාව වැඩි කිරීම, තත්ත්වය ඉහළ නැංවීම සහ නිෂ්පාදන පිරිවැය අඩු කිරීම තුළින් තරඟකාරිත්වය ඉහළ නැංවීමයි. එකතු කළ අගය වැඩි කිරීමට යොදා ගන්නා ක්‍රමෝපායයන්, ජගත් වෙළෙඳපොළ අවස්ථා ප්‍රයෝජනයට ගැනීම, කර්මාන්තශාලා නවීකරණය සහ පරිසර හානිය අවම කරමින් නැවත වගා කිරීමේ සහ අළුතින් වගා කිරීමේ වැඩ සටහන් මෙම සැලැස්මට ඇතුළත් කර තිබේ.

- **තේ නිෂ්පාදනය, ඵලදායිතාව සහ තත්ත්වය ඉහළ නැංවීම පිණිස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පියවර කිහිපයක් ගෙන තිබේ.** ඒ අනුව නව තේ කම්හල් ගොඩනැගීමට පෙර ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය කිරීම සහ පවත්වා ගත යුතු අවම ප්‍රමිති මට්ටම ද නියම කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදු කරන ලදී. මෙයට අමතරව, තත්ත්වයෙන් උසස් තේ අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අමු තේ දළුවල තත්ත්වය සඳහා ප්‍රමිතියක් ද 'ලංකා තේ තත්ත්ව සහතිකය' ක්‍රමය සහ තේ අපනයන සඳහා පවත්වා ගත යුතු අවම තත්ත්ව නිර්ණායකයන් ද හඳුන්වා දෙන ලදී. 2006 ජූනි මස සිට යුරෝපා සංගමයට තේ අපනයනය කිරීමේදී, එම තේ නිෂ්පාදනයේ සෑම අවස්ථාවක්ම උසස් සැකසුම් ප්‍රමිතියක් සහ මනා සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වයක් පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා එම තේ සකස් කරන කම්හල් උපද්‍රව විශ්ලේෂණ සහ අවධි ලක්ෂණ පාලන පද්ධතිය (Hazard Analysis and Critical Control Risk Certification -HACCP) පිළිබඳ සහතිකයක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. මේ වනවිට මෙම සහතිකය ලබාගෙන ඇත්තේ කම්හල් 25 ක් පමණි. මේ සඳහා වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කම්හල් නවීකරණය හා ප්‍රතිසංස්කරණය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් රුපියල් දශ ලක්ෂ 250 ක් වෙන්කර ඇත. ආනයනික තේ පිළිබඳව අවධානයෙන් සිටීමට ද තේ මණ්ඩලය පියවර ගෙන ඇත.

- **ස්වාභාවික රබර් සඳහා ඉහළ යමින් පවතින ඉල්ලුමෙන් වාසි ලබාගැනීම පිණිස රබර් වගාව වැඩි දියුණු කිරීමට රජය වැඩ පිළිවෙළ කිහිපයක් දියත් කර තිබේ.** රබර් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස සහනදායී මිලකට වැසි ආවරණ සැපයීමට සහ වැඩුණු රබර් වගාවල පොහොර භාවිතය ඉහළ නැංවීම පිණිස 'තුරු සවිය' අරමුදල යටතේ මූල්‍ය ආධාර සපයන ලදී. වයඹ පළාතේ රබර් වගාව සංවර්ධනය කිරීම සඳහා ආරම්භක පියවරක් ලෙස රබර් පර්යේෂණ ආයතනයේ උප කාර්යාලයක් පොල්ගහවෙල ස්ථාපිත කිරීමට කටයුතු කර තිබේ. මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ද රජය විසින් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

- **පොල් වගා අංශයේ සංවර්ධනය සඳහා ක්‍රමෝපායයන් කිහිපයක් හඳුන්වා දී ඇත.** දකුණු පළාතේ මිද්දෙනිය, තංගල්ල සහ මාතර ප්‍රදේශ ආවරණය වන පරිදි දෙවන පොල් ත්‍රිකෝණය නම් කිරීම, 2005 අප්‍රේල් 1 ද සිට ක්‍රියාත්මක වන පරිදි කපාපු පොල් අපනයනය කිරීමේදී අය කෙරෙන සෙස් බද්ද මෙට්‍රික් ටොන් එකකට


රුපියල් 1,000 සිට මෙට්‍රික් ටොන් එකකට රුපියල් 2,000 දක්වා වැඩි කිරීම සහ පොල් කර්මාන්තය නගා සිටුවීම සඳහා 'කප් රුක' නමින් අරමුදලක් පිහිටුවීම ද මීට ඇතුළත් වේ. අධික වශයෙන් පොල් ඉඩම් කැබලි කිරීම වළක්වාලීම සඳහා අවශ්‍ය නීති ද හඳුන්වා දී තිබේ.

- **අපනයන කෘෂිකර්මාන්ත අංශය සංවර්ධනය සඳහා ඊට අදාළ ආයතන වලින් අඛණ්ඩව සහාය ලැබුණි.** පොකුරු ගම්මාන හරහා යෙදවුම් බෙදාහැරීම, පසුඅස්වනු හසුරුවීමේ පහසුකම් සහ උපකරණ බෙදාහැරීම, තාක්ෂණික උපදෙස් සැපයීම, වෙළෙඳපොළ සම්බන්ධතා ස්ථාපනය කිරීම සහ මූල්‍ය ආධාර සැපයීම තුළින් මෙම අංශයට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ලැබී ඇත. පළපුරුදු කුරුඳු තලන්නන්ගේ හිඟය සැලකිල්ලට ගෙන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2005 දී කුරුඳු සැකසීම පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් කොස්ගොඩ පිහිටුවන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණය සැපයීම, පුහුණු කිරීම සහ මූල්‍ය පහසුකම් සැපයීම තුළින් කාබනික බෝග වගාව සහ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ගොවියන්ට අනුබල දෙන ලදී.

- **වී අලෙවිය ඉහළ නැංවීම සඳහා දිරිගැන්වීම් ගණනාවක් සහ මිල මට්ටම් ස්ථාවරව පවත්වා ගැනීම සඳහා පියවර රැසක් රජය මගින් හඳුන්වා දී ඇත.** 2004/05 මහ කන්නය සඳහා සහල් මෝල් හිමියන් ලබාගත් බැංකු ණය පියවීමේ කාලය 2006 මාර්තු දක්වා දීර්ඝ කරන ලදී. වාර්තාගත වී නිෂ්පාදනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස මිල පහත වැටීම හේතුවෙන් 2005 වසරේදී රජය වී මිලදී ගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. සමූපකාර, ගොවිජන සේවා කේන්ද්‍ර සහ ගොවි සංවිධාන හරහා විශේෂ අවම මිල ගණන්වලට විවිධ වර්ගයේ වී මිලදී ගැනීම සඳහා රජය විසින් කටයුතු සලසන ලදී. මේ යටතේ වී කිලෝ ග්‍රෑමයක් සඳහා අවම මිල ගණන් රුපියල් 15.50 ක් (නාඩු) සහ රුපියල් 16.50 ක් (සම්බා සහ රතු කැකුළු)

**2.2 රූප සටහන**

**සහල් : සැපයුම සහ ඉල්ලුම**




දක්වා පරාසයක විය. මෙම වැඩ පිළිවෙල සඳහා මහ සහ යල කන්නවලදී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,325 ක හා රුපියල් දශ ලක්ෂ 1,251 ක පිරිවැයක් දරන ලදී. ඒ අනුව, මෙම වැඩ පිළිවෙල යටතේ මහ කන්නයේ දී වී මෙට්‍රික් ටොන් 83,000 ක් පමණ (මහ අස්වැන්නෙන් සියයට 4 ක්) සහ යල කන්නයේ වී මෙට්‍රික් ටොන් 52,000 ක් පමණ (යල අස්වැන්නෙන් සියයට 4 ක්) මිලදී ගන්නා ලදී. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ වී මිලදී ගැනීම සඳහා එක් අයෙකුට ලබා දුන් වී මිලදී ගැනීමේ ණය සීමාව මහ කන්නයේදී රුපියල් දශ ලක්ෂ 25 සිට රුපියල් දශ ලක්ෂ 50 දක්වා වැඩි කළ අතර විශේෂිත මිල යටතේ වී මිලදී ගැනීම සඳහා එම ණය සීමාව යල කන්නයේ සිට එක් අයකුට රුපියල් දශ ලක්ෂ 75 දක්වා වැඩි කරන ලදී.

- **2005 දී සහල් සහ උක් පර්යේෂණවල ප්‍රගතියක් දක්නට ලැබුණි.** සහල් පර්යේෂණ ආයතනය විසින් විභවතා මට්ටමින් සියයට 20 කට වඩා වැඩි ඵලදායිතාවයක් සහිත, නියඟයට හා ගංවතුරට ඔරොත්තු දෙන, කෙටිකාලීන නව වී ප්‍රභේද ගණනාවක් හඳුන්වා දෙන ලදී. තවද, එම ආයතනය මගින් වී වැපිරීමේ වැඩි දියුණු කරන ලද ක්‍රමයක් (පැරචූට් ක්‍රමය) හඳුන්වා දෙන ලද අතර, එමගින් බිත්තර වී ප්‍රමාණය හා ශ්‍රමය සඳහා පිරිවැය විශාල වශයෙන් අඩුකරගත හැකිවේ. දේශීය උක් කර්මාන්තය පුළුල් කිරීම සඳහා උක් පර්යේෂණ ආයතනය විසින් එහි පර්යේෂණ කටයුතු සහ උපදේශන සේවා අඛණ්ඩව කරගෙන යන ලදී. පොල් වගා කරනලද බිම්වල අතුරු වගාවක් වශයෙන් උක් වගා කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන සිදුකරන ලදී. ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනය මගින් ඵලදාව සියයට 54 කින් වැඩි කරගත හැකි උක් ප්‍රභේදයක් (SL94-3325) හඳුන්වා දී ඇත.

- **කිරි නිෂ්පාදන කර්මාන්තයෙහි නව පිබිදීමක් ඇති කිරීම ඉලක්ක කර ගනිමින් පසුගිය වසර කීපය තුළ ප්‍රතිපත්ති මාලාවක් හඳුන්වා දී තිබේ.** ගොවීන් පුහුණු කිරීම සඳහා කිරි ගොවීන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියක් රජය මගින් ආරම්භ කළ අතර, අලෙවිය වැඩි දියුණු කිරීමට සහ සතුන් සඳහා පශු සායන පැවැත්වීමට ද කටයුතු කරන ලදී. මීට අමතරව, එක ගමකින් අවම වශයෙන් කිරි ගොවීන් 20 දෙනෙක් ඇතුළත් වන පරිදි කිරි ගම්මාන 50 ක් පිහිටුවීමට ද පියවර ගන්නා ලදී. කිරි පට්ටි පාලනය දිරි ගැන්වීම සඳහා වසර තුළදී රජය විසින් කිරි සඳහා ගෙවන මිල ලීටරයට රුපියල් 18 සිට ලීටරයට රුපියල් 20 දක්වා ඉහළ නංවන ලදී. අභිජනනය සඳහා සතුන් සැපයීම පුළුල් කිරීම, පශු වෛද්‍ය සේවා වැඩි දියුණු කිරීම සහ පශු සම්පත් අංශය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පශු පර්යේෂණ ආයතනයට පහසුකම් සැලසීම තුළින් කිරි නිෂ්පාදනය දෙගුණයක් කිරීමේ පස් අවුරුදු සංවර්ධන සැලැස්ම මුදුන්පත්කර ගැනීම සඳහා රජය විසින් පියවර රාශියක් ගෙන ඇත.

- **සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ධීවර අංශය යළි නගා සිටුවීම සඳහා රජය පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී.** ආධාර සපයන්නන්ගේ සහාය ඇතිව රජය බෝට්ටු බෙදාහරින ලද අතර පීඩාවට පත් ධීවරයින් වෙත ඩීසල් සහනාධාරයක් ද සපයන ලදී. ගැඹුරු මුහුදේ සහ අක් වෙරළ ධීවර කර්මාන්තය වැඩි දියුණු කිරීම පිණිස බහු දින යාත්‍රා නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය සංවර්ධනය කිරීම මෙන්ම ධීවරයින්ට මෙවැනි යාත්‍රා මිලදී ගැනීම සඳහා පහසු ගෙවීමේ ක්‍රමයක් ඇති කිරීම සඳහා ධීවර කටයුතු ප්‍රවර්ධන අරමුදලක් පිහිටුවීමට 2006 අයවැයෙන් රුපියල් දශ ලක්ෂ 700 ක් වෙන් කර ඇත. අදාළ ව්‍යාපෘති තුළින් විසිතුරු මසුන් අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා ද, රජය විසින් රුපියල් දශ ලක්ෂ 50 ක් වෙන්කර ඇත. මේ අතරතුර, ඉස්සන් වගාව යළි නගා සිටුවීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, පුත්තලම සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ඉස්සන් වගාව වැඩි දියුණු කිරීම සඳහා ද රුපියල් දශ ලක්ෂ 100 ක් වෙන් කර ඇත.
- **විශේෂයෙන් ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු විදේශ ආධාර සපයන ආයතනවල සහයෝගයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන වගා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති තොකඩවා කරගෙන ගියේය.** වන සංරක්ෂණ ප්‍රධාන සැලැස්මට අනුව, 2005 දී ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර වලින් වන සම්පත් කළමණාකරන ව්‍යාපෘති ආරම්භ කළ අතර දැනට ඒවා ක්‍රියාත්මක වෙමින් පවතී. නැවත වනාන්තර ඇති කිරීම ඉහළ නැංවීම පිණිස ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ගස් කපන ලද ප්‍රදේශ යළි වගා කිරීම, මංමාවත් දෙපස පැල සිටුවීම සහ මුහුදුබඩ ප්‍රදේශවල වන වගා කිරීම වැනි කටයුතු කරගෙන යන ලදී. ජෛව විවිධත්වය, වන සංරක්ෂණය, පරිසර විද්‍යාව සහ සිංහරාජ වනාන්තරය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් පාසල් සිසු සිසුවියන් සහ අනෙකුත් ජනතාව දැනුවත් කිරීම පිණිස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපන සම්මන්ත්‍රණ, වැඩ මුළු, දේශන, වීඩියෝ චිත්‍රපට සංදර්ශණ ඇතුළු දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවන ලදී.

**කාර්මික ප්‍රතිපත්තිය සහ ආයතනික පහසුකම්**

- **2006 අයවැය මගින් නැවත වරක් ප්‍රකාශයට පත්කර ඇති පරිදි රජයේ කාර්මික ප්‍රතිපත්තියේ මූලික අරමුණ වනුයේ සමාජීය වගකීමකින් යුක්ත පෞද්ගලික අංශයක සහ පහසුකම් සපයනු ලබන ශක්තිමත් රාජ්‍ය අංශයක සහභාගිත්වය ඇතිව, ආයෝජන සහ නව සොයාගැනීම් වර්ධනය කිරීම තුළින් ගෝලීය තරඟකාරීත්වයට මුහුණ දිය හැකි මෙන්ම පරිසර හිතකාමී කාර්මික අංශයක් ඇති කිරීම සඳහා දිරිගැන්වීම් සහ පහසුකම් සැපයීම වේ.** ගෝලීය වෙළෙඳපොළට ප්‍රවිෂ්ටවීමේ මාර්ග තවදුරටත් පුළුල් කිරීම, උසස් තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම, ප්‍රාදේශීය කාර්මීකරණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම, කර්මාන්තයන්හි පසුබැඳීම් වර්ධනය කිරීම මෙන්ම දේශීය සම්පත් පදනම් කරගත් අපනයන කර්මාන්ත දිරිමත් කිරීමේ අවශ්‍යතාවය ද කාර්මික ප්‍රතිපත්තිය මගින් තවදුරටත් අවධාරණය කර ඇත. රජයේ පහසුකම් සැපයීම මගින් අරමුණු කර ඇත්තේ වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ටවීමේ මාර්ග වැඩි දියුණු කිරීම, නෛතික සහ ව්‍යවස්ථාපිත රාමුව ශක්තිමත් කිරීම, ආයතනික යහ පාලනය ශක්තිමත් කිරීම, විදේශීය තාක්ෂණය සහ විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, ස්ථාවර සාර්ව ආර්ථික රාමුවක් ඇති කිරීම මෙන්ම දැනුම හා මානව ප්‍රාග්ධන ආයෝජනවල ප්‍රතිලාභ ආයතනවලට පහසුවෙන් ළඟාකර ගැනීමේ හැකියාව පුළුල් කිරීම යනාදියයි.
- **විදේශ වෙළෙඳපොළට ප්‍රවිෂ්ටවීමේ මාර්ග වැඩි දියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත.** මේ සම්බන්ධයෙන් එක්සත් ජනපදය සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර, පොදු වරණීය තීරු බදු ක්‍රමය (GSP+) මගින් යුරෝපා සංගමය සමඟ ද, නිදහස් වෙළෙඳ ගිවිසුම තුළින් පකිස්ථානය සමඟ ද, දැනට පවතින නිදහස් වෙළෙඳ ගිවිසුම විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමක් ලෙස දීර්ඝ කිරීම තුළින් ඉන්දියාව සමඟ ද, බිම්ස්ටෙක් (BIMST-EC) වෙළෙඳ ගිවිසුම තුළින් දකුණු සහ නැගෙනහිර ආසියාතික රටවල් සමඟ ද, දකුණු ආසියාතික නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA) තුළින් සාර්ක් රටවල් සමඟ ද සාකච්ඡා පවත්වා ඇත.
- **රජය විසින් උසස් තාක්ෂණය භාවිතය සඳහා රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් ලබා දී ඇති අතර, ඉලක්කගත දිරිගැන්වීම් තුළින් ප්‍රාදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇත.** අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර තීරු බදු රහිතව ආනයනය කිරීම සඳහා දී ඇති රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර භාවිතය සඳහා දිරිගැන්වීම් ලබා දීමට හඳුනාගෙන ඇති කර්මාන්ත වනුයේ මුද්‍රණ, සෞඛ්‍ය සේවා, මැණික් කැපීම සහ ඔප දැමීම, සහල් ඇසුරුම් කිරීම සහ ඇඹරීම වැනි කර්මාන්ත වේ. මෙම වැඩ සටහන මගින්, අදාළ අමාත්‍යාංශවල අධීක්ෂණය යටතේ ආනයනය කරනු ලබන යන්ත්‍ර සූත්‍ර තීරුබදු වලින් නිදහස් කර ඇති අතර ඇස්තමේන්තුගත බදු අයකළ හැකි ආදායමෙන් ප්‍රාග්ධන ක්ෂයවීම් දීමනාව 33 1/3 ක ප්‍රතිශතයක් දක්වා වැඩි කර ඇත. ප්‍රාදේශීය කාර්මිකකරණ වැඩ සටහනේ පළමු අදියරේදී කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්කවලින් පිටත ප්‍රදේශවල කර්මාන්තශාලා 300 ක් පිහිටුවීමට සැළසුම් කර ඇති අතර, මෙම දිස්ත්‍රික්කවලින් පිටත පිහිටි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම අවම වශයෙන් එක් කර්මාන්තශාලාවක් බැගින් පිහිටුවීමට නියමිතය. මෙම වැඩ සටහන යටතේ දිරි දීමනා ලබා ගැනීම සඳහා කර්මාන්තශාලා 2006 අප්‍රේල් මාසයේ සිට වසර 2 ක කාලයක් තුළදී රුපියල් දශ ලක්ෂ 30 ක අවම ආයෝජනයක් සහිතව පිහිටවිය යුතු අතර අවම වශයෙන් එක් කර්මාන්ත ශාලාවක සේවකයින්

200 ක් සේවා නියුක්ත කළයුතු වේ. වසර 5 සිට 10 දක්වා ආදයම් බදු වලින් නිදහස් කිරීම, නව යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමේදි අයකරනු ලබන අනෙකුත් තීරු බදු සහ එකතු කළ අගය මත අයකරනු ලබන බදු වලින් නිදහස් කිරීම මෙම දිරිගැන්වීම්වලට ඇතුළත් වේ. කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක වලින් පිටත ප්‍රදේශයන්හි කර්මාන්ත නැවත ස්ථාපිත කිරීම වෙනුවෙන් දරන පිරිවැය සඳහා බදු අයකළ හැකි ආදායමින් අඩු කිරීමක් ලෙස හිමිකම් පෑමට මෙම කර්මාන්ත සඳහා හැකියාව ඇත. එවැනි කර්මාන්තශාලාවලට මූල්‍ය පහසුකම් සපයා දෙනු ලබන ආයතන මගින් අයකරනු ලබන පොලී ආදායම බදු වලින් නිදහස් කිරීම තුළින් එම ණය පහසුකම් සපයනු ලබන ආයතන දිරිමත් කර ඇත.

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම සඳහා දැනට ගෙන ඇති උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා 2006 අයවැය මගින් වඩාත් විස්තීර්ණ යෝජනා මාලාවක් ඉදිරිපත් කර ඇත.** මෙම යෝජනා මාලාව තුළට අමු ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර ආනයන සඳහා ඇති තීරු බදු ඉවත් කිරීම අරමුණු කරගත් තීරු බදු ව්‍යුහය තාර්කීකරණය කිරීම හා සරල කිරීමේ වැඩ පිළිවෙල, නව සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයුම් ජාලයක් ස්ථාපිත කිරීම, අන්තර් ජාතික සබඳතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරීම සහ කම්කරු සම්බන්ධතා අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරීම ආදිය ඇතුළත් වේ. සුරැකුම් රහිත ණය උපකරණයන් තුළින් සහනදායි පොලී අනුපාතික මත මූල්‍ය පහසුකම් සැපයීම පිණිස රුපියල් බිලියන 5 ක මූලික ප්‍රාග්ධනයක් සහිතව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව බැංකුව 2005 දී ස්ථාපිත කරන ලදී. පරිපාලන ක්‍රියා පටිපාටීන් වඩාත් විධිමත් කිරීම, එකතු කළ අගය මත අයකරනු ලබන බදු ක්‍රියා පටිපාටිය සරල කිරීම, රේගු නීතිරීති සහ අපනයන ක්‍රියා පටිපාටීන් සරල කිරීම, තාක්‍ෂණික හැකියාවන් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා ආයතනික පහසකම් සැපයීම, තත්ත්ව කළමනාකරණය, ඵලදයිතා වර්ධනය, අන්තර්ජාලයට පිවිසීමේ පහසුකම් වැඩි දියුණු කිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් තත්ත්ව සහතික ලබා ගැනීම සඳහා පහසුකම් සපයා දීම වැනි දැනට ක්‍රියාත්මක වෙමින් පැවති වැඩ සටහන් 2005 වසර තුළදී තවදුරටත් ශක්තිමත් කර ඇත.
- **දේශීය රෙදිපිළි කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කිරීම 2006 අයවැය මගින් අවධාරණය කර ඇත.** රෙදිපිළි කර්මාන්තය සඳහා දැනට ක්‍රියාත්මක වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල බැංකු සහ රජය අතර අවදානම බෙද ගැනීමේ පදනම යටතේ තවදුරටත් ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර දේශීය නිමැවුම්-කරුවන්ට සුරක්ෂිත වෙළෙඳපොළක් සපයාදීමේ අරමුණින් පාසැල් ළමුන් සහ හමුදා සේවාවල නියුතු වූවන්ගේ නිළ ඇඳුම් සඳහා අවශ්‍ය සම්පූර්ණ රෙදිපිළි ප්‍රමාණය ඔවුන්ගෙන් මිලදී ගැනීමට අපේක්ෂිතය. දැනට පවතින හොරණ රෙදිපිළි සැකසුම් කලාපයට අමතරව, තුල්හිරිය රෙදිපිළි සංකීර්ණය ද විශේෂිත රෙදිපිළි සැකසුම් කලාපයක් වශයෙන් සංවර්ධනය කරනු ලබන අතර මෙම කලාප සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ දැනට ලබාදෙන සියළු දිරි ගැන්වීම් ලබාදෙනු ඇත.
- **පංගු ක්‍රමය අහෝසි වීමත් සමඟ ඇඟළුම් කර්මාන්තය ජාත්‍යන්තර තරඟකාරීත්වයට දැඩි ලෙස මුහුණ දී ඇති හෙයින් රජය විසින් ඇඟළුම් කර්මාන්තයේ තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා තවත් ක්‍රියා මාර්ග රැසක් ආරම්භ කර ඇත.** ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික සභාවේ (NCED) ප්‍රතිපත්ති ලේඛනයෙහි සඳහන් කර ඇති පරිදි මේ සම්බන්ධයෙන් රජයේ ඉදිරි දක්ම වනුයේ, ඇඟළුම් කර්මාන්තය කොන්ත්‍රාත් නිමැවුම්කරුවකුගේ තත්ත්වයේ සිට පූර්ණ එකතු කළ අගයක් සහිත සේවා සපයන්නෙකුගේ තත්ත්වයට පරිවර්තනය කිරීම තුළින් ඇඟළුම් කර්මාන්තය සඳහා දැනට ක්‍රියාත්මක වන පස් අවුරුදු සැළැස්ම මගින් දක්වා ඇති වර්ධන අපේක්ෂාවන් ඉටු කර ගැනීම වේ. කළමනාකරණ පුහුණුව, මෝස්තර නිර්මාණය සහ නිමාවන් සඳහා වූ ජාත්‍යන්තර සම ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම පිණිස රෙදිපිළි සහ ඇඟළුම් කටයුතු හා සම්බන්ධ අධ්‍යයන ආයතනයක් තුල්හිරියේ පිහිටුවීමට 2006 අයවැය තුළින් යෝජනාකර ඇත. මොරටුව විශ්ව විද්‍යාලය ද මෝස්තර සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ උපාධි වැඩ සටහනක් 2005 වසරේදී හඳුන්වා දී ඇත. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සහ ඇඟළුම්කරුවන්ගේ ඒකාබද්ධ සංසදය (JAFF) විසින් ද ඵලදායිතා සංවර්ධනය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් කර්මාන්තයේ ප්‍රතිරූපය ගොඩනගා ගැනීමට සහ නිපුණතා සංවර්ධනය යනාදිය සඳහා කර්මාන්තශාලා මට්ටමින් වැඩ සටහන් රැසක් දියත් කර ඇත. අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි ශ්‍රමය, කර්මාන්ත තුළ පවතින පරිසරය සහ යහ පාලනය යනාදිය වැඩි දියුණු කර ගැනීමට රජය සහාය වී ඇති අතර, එමගින් කර්මාන්තකරුවන්ට අන්තර්ජාතික වෙළෙඳපොළ වෙත පිවිසීමේ මාර්ග පුළුල් කර ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.
- **ප්‍රධාන මුහුදු සහ ගුවන් මාර්ගවලට සමීපස්ථව ශ්‍රී ලංකාව පිහිටා තිබීම, එය කලාපය තුළ ආකර්ෂණීය ඇඟළුම් කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා දී ඇත.** මෙම අරමුණ සඳහා, කර්මාන්තයන් විසින් පවත්වා ගතයුතු අවම අපනයන ප්‍රමාණයන්ට හා එකතු කළ අගය මත අය කරනු ලබන බදු වලට යටත්ව ආයෝජන මණ්ඩලයේ දිරි ගැන්වීම් ලබාදීම තුළින් සුවිසල් වෙළෙඳ මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා කෙරෙන විදේශ ආයෝජන දිරිගන්වනු ඇත. අන්තර්ජාතික ගුවන් තොටුපොළට සහ නිදහස් වෙළෙඳ කලාපයට සමීපස්තව පිහිටීම හේතුවෙන් කටුනායක ප්‍රදේශය යෝජිත ඇඟළුම් කේන්ද්‍රස්ථානය පිහිටුවීම සඳහා සුදුසු ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත.

- **රෙදිපිළි සහ ඇඟළුම්, පාවහන්, සම් භාණ්ඩ, පිඟන් භාණ්ඩ, රබර් සහ දැව හා දැව ආශ්‍රිත කර්මාන්ත යනාදි ඉලක්කගත කර්මාන්තයන්හි තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා 2004 දී ආරම්භ කරන ලද විශේෂිත වැඩ සටහන් 2005 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.** මෙම වැඩ සටහන් යටතේ, 2005 වසරේදී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩ සටහන් වලට කම්හල් පුළුල් කිරීම හා නවීකරණය කිරීම, ධාරිතාවය පුළුල් කිරීම, ව්‍යාපාර සංවර්ධන සේවාවන් සහ පවත්නා කම්හල් නවීකරණය කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම් යනාදිය ඇතුළත් විය.

- **මුද්‍රණ සහ ඇසුරුම් කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කිරීම පිණිස විශේෂිත වැඩපිළිවෙලවල් සහ තීරු බදු සහන 2006 අයවැය තුළින් යෝජනා කර ඇත.** දේශීය මුද්‍රණ හා ඇසුරුම් කර්මාන්තයෙහි නිෂ්පාදන පිරිවැය අඩු කිරීම අරමුණු කොටගෙන සියළුම කඩදාසි වර්ග ආනයනය සඳහා දැනට පවතින සියයට 15 ක තීරු බද්ද ඉවත් කරනු ලබන අතර, ආනයනය කරනු ලබන ටින්වලට අදළ තීරු බද්ද සියයට 6 දක්වා අඩු කරනු ලැබේ. ආනයන තීරු බදු ව්‍යුහයේ දැනට පවත්නා විෂමතා ඉවත් කිරීම සඳහා අමු ද්‍රව්‍ය ආනයනය මත පනවා ඇති තීරු බදු පහළ බදු අනුපාතයකට ඇතුළත් කෙරෙනු ඇත. ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ඇසුරුම් කර්මාන්තයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පරීක්ෂණාගාර පහසුකම් ද ඇතුළත් ඇසුරුම් සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට අපේක්ෂිතය.

- **2004 දී ස්ථාපිත කරන ලද ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීමේ සංසදය** (Investor Facilitation Forum) **තුළින් කර්මාන්තකරුවන් සහ ආයෝජකයින් විසින් මුහුණ දෙන ලද කර්මාන්තවල මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ ගැටළු විසඳීමට කටයුතු කිරීම 2005 වසර තුළදී ද රජය විසින් අඛණ්ඩව සිදු කරන ලදී.** මහා පරිමාණ ආයෝජන ව්‍යාපෘතීන්ට පහසුකම් සැපයීමට මෙන්ම ඉඩම් අත්පත්කර ගැනීම, පාරිසරික කටයුතු සම්බන්ධයෙන් පවතින ගැටළු විසඳීමටත්, ප්‍රාදේශීය සහ මධ්‍යම රජයෙහි අනුමැතිය ලබා ගැනීම ආදී ක්ෂේත්‍රයන් ආශ්‍රිතව කර්මාන්තකරුවන් මුහුණ දෙන අපහසුතා ඉවත් කිරීම පිණිසත් ආයෝජකයින් සඳහා වන පහසුකම් සැපයීමේ සංසදය ස්ථාපිත කරනු ලැබීය. ආයෝජකයින් සඳහා පහසුකම් සැපයිමේ සංසදයට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ද අපනයකරුවන්ගේ සංසදය තුළින් අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු නිරාකරණය කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.

- **2005 වසරේදී එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) විසින් රජයේ සහභාගීත්වය ද ඇතිව කාර්මික පරිසරය තිසි පරිදි පවත්වා ගැනීමේ ජාතික ශක්‍යතාවය පුළුල් කිරීම අරමුණු කර ගනිමින් කර්මාන්තශාලා පිරිසිදුව පවත්වා ගැනීමේ වැඩ සටහන යටතේ ඇති කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.** මේ යටතේ රජය සහ කර්මාන්තකරුවන් අතර කතිකාවත් පැවැත්වීම දිරිගැන්වීම සහ පරිසර හිතකාමී තාක්ෂණික සංවර්ධනය හා එවැනි තාක්ෂණික භාවිතය සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම වෙනුවෙන් වූ ආයෝජන ඉහළ නැංවීම ආදී ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී. මෙම වැඩ සටහන තුළින් තරඟකාරී කාර්මික නිෂ්පාදන සහ ඒ මගින් පාරිසරික වශයෙන් ඇතිවන ගැටළු නිරාකරණය කිරීමට රජය බලාපොරොත්තු වේ.

## 2.3 නිෂ්පාදිතය

### කෘෂිකර්මය

- **2005 දී කෘෂිකර්මය, වන සහ ධීවර අංශයේ එකතු කළ අගය සියයට 1.5 ක වර්ධනයක් වාර්තා කළේය. මෙය 2004 වසරේ පැවති පසුබෑස්මෙන් යථා තත්ත්වයට පත් වීමකි.** යල සහ මහ කන්න දෙකෙහිදීම ලැබුණු වාර්තාගත වී අස්වැන්න සහ වාර්තාගත තේ නිෂ්පාදනය මෙම වර්ධනයට බලපෑ ප්‍රධාන සාධක විය. අනෙකුත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු, රබර් සහ අනෙකුත් අපනයන කෘෂි බෝගවල නිෂ්පාදනය වැඩි දියුණුවීම ද මීට දායක විය. 2004 වසර ආරම්භයේ පැවති නියඟයෙහි පසුකාලීන බලපෑම හේතුවෙන් 2005 පොල් නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත් නොවීය. 2004 දෙසැම්බර් සුනාමියෙන් දැඩි ලෙස හානියට පත්වූ මත්ස්‍ය නිෂ්පාදනය ද 2005 වසර අවසානයේදී සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් නොවීය.

- **දළ දේශීය නිෂ්පාදිතයේ කෘෂිකාර්මික අංශයේ දායකත්වය 2004 දී සියයට 17.9 සිට 2005 දී සියයට 17.2 දක්වා තව දුරටත් පහත වැටුණි.** සේවා සහ කර්මාන්ත අංශවල වැදගත්කම වර්ධනයවීමත් සමඟ අඩුවෙමින් පවතින කෘෂිකාර්මික අංශයේ දායකත්වය සුනාමියෙන් පසුව මත්ස්‍ය උප අංශය සංකෝචනයවීම නිසා තවදුරටත් අඩු විය.

**2.2 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (1997-2000=100)**

| අයිතමය | 2004(අ) | 2005(ආ) | වර්ධන වේගය(%) 2005/04 |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 102.7 | 103.7 | 1.0 |
| 1 කෘෂිකර්මය | 102.4 | 110.1 | 7.5 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 100.4 | 108.7 | 8.3 |
| තේ | 107.7 | 110.4 | 2.5 |
| රබර් | 98.3 | 108.3 | 10.2 |
| පොල් | 93.3 | 90.6 | -2.9 |
| වී | 98.6 | 121.8 | 23.5 |
| අනෙකුත් බෝග | 101.0 | 106.4 | 5.3 |
| 1.2 පශු සම්පත් | 121.0 | 122.8 | 1.5 |
| 2 මත්ස්‍ය | 104.9 | 59.8 | -43.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**අපනයන කෘෂිකර්මය**

- **2005 වසරේ සමස්ත තේ නිෂ්පාදනය සියයට 2.5 කින් වර්ධනය වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 317 ක නව වාර්තාගත මට්ටමකට ළඟා විය. තේ සඳහා වසර මුළුල්ලෙහිම ඉහළ ජාත්‍යන්තර මිලක් ද ලැබුණි.** උස් හා මැදි උන්නතාංශවල තේ නිෂ්පාදනය පිළිවෙලින් සියයට 8 කින් සහ සියයට 11 කින් වර්ධනය වීමද තේ නිෂ්පාදනය ඉහළ යාමට හේතු විය. එම ප්‍රදේශවල පැවති හිතකර කාලගුණික තත්ත්වයන් සහ තේ සඳහා ඉහළ මිලක් පැවතීම හේතුකොටගෙන තේ නිෂ්පාදනය වැඩි කිරීමට උත්සාහ දැරීමත් තේ නිෂ්පාදනය වැඩිවීමට හේතු විය. කෙසේ වුවද, පහත් උන්නතාංශ බිම්වල තේ නිෂ්පාදනය සියයට 1 කින් ආන්තිකව අඩු වූ අතර එයට හේතු වූයේ විශේෂයෙන්ම, 2005 වසරේ මුල් කාර්තුවේදී එම ප්‍රදේශවලට ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබීමයි. ප්‍රාදේශීය වැවිලි සමාගම්වල වැඩ වර්ජන හා කම්කරු ආරවුල් අඩු මට්ටමක පැවතීම ද තේ නිෂ්පාදනයේ වැඩිවීමට දායක වූවා විය හැක. මුළු තේ නිෂ්පාදනය කළු තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 315 කින් සහ හරිත තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 2 කින් සමන්විත වේ. 2005 වසරේ කළු තේ නිෂ්පාදනය, සම්ප්‍රදායික තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 299 කින් සහ කපා ඉරා අඹරන ලද තේ (CTC) කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 16 කින් ද සමන්විත විය.

- **ඉකුත් වසර වලදී මෙන්ම 2005 වසරේ දී ද කුඩා තේ වතු අංශය තේ නිෂ්පාදනයේ දී ප්‍රමුඛතාවයක් දක්වමින් සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 65 කට දායක වූ අතර. එම අංශයට වැඩි තේ වගා බිම් ප්‍රමාණයක් අයත්වීම මෙන්ම වැඩි ඵලදායීතාවයකින් යුක්ත වීම ඊට හේතු විය.** 2005 වසරේදී වතු වගා අංශයේ සාමාන්‍ය ඵලදායීතාවය වන හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,358 ට සාපේක්ෂව කුඩා තේ වතු අංශයේ ඵලදායිතාවය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,867 ක් වේ. මෙයට හේතු වී ඇත්තේ තේ වතුවල සාපේක්ෂව පැරණි තේ වගාවන් පැවතීම සහ විශේෂයෙන් උස් හා මැදි බිම් ප්‍රදේශවල තේ වතුවල පවතින බෑවුම් ස්වභාවය නිසා පස සේදී යාමෙන් පස නිසරු වීමයි. කෙසේ වුවද, මෑතකදී පැවති සංගණනයේ තොරතුරු පදනම් කරගෙන කුඩා තේ වතු අංශයේ ඵලදයිතාවය සංශෝධනය කර ඇත.[1] ඇස්තමේන්තුගත ජාතික ඵලදායිතාවය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,645 ක් වන අතර, එය ළඟාකර ගත හැකි විභව ඵලදායිතාවයට වඩා අඩු මට්ටමක පවතී. 2005 වසරේ දී තේ නිෂ්පාදනය සඳහා සාමාන්‍ය පිරිවැය කිලෝ ග්‍රෑමයකට රුපියල් 168.85 දක්වා සියයට 7.3 කින් ඉහළ ගිය අතර, ඊට හේතු වූයේ පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, ඉන්ධන වැනි යෙදවුම් මෙන්ම කම්කරු වැටුප් ද ඉහළ යාමයි.

1. 2005 වසරේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් කුඩා තේ වතු අංශයේ සිදුකරන ලද සමීක්ෂණයට අනුව කුඩා තේ වතු අංශයට අයත් වගා බිම් ප්‍රමාණය ඉහළ ගොස් ඇත. මෙය සැළකිල්ලට ගනිමින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් කුඩා තේ වතු අංශයේ ඵලදයිතාවය සංශෝධනය කර ඇත. වැවිලි සමාගම් මගින් සපයනු ලැබූ ඵල දරන බිම් ප්‍රමාණය වතු වගා අංශයේ සාමාන්‍ය ඵලදයිතාවය ගණනය කිරීම සඳහා පදනම් කර ගෙන ඇත.

**2.3 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්**

| | අයිතමය | ඒකකය | 2004(අ) | 2005(ආ) |
|---|---|---|---|---|
| **1** | **තේ** | | | |
| 1.1 | නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑම් දශ ලක්ෂ | 309.5 | 317.2 |
| 1.2 | මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 211 | 222 |
| 1.3 | දළු කැඩීම යටතේ ඇති බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 166 | 193 |
| 1.4 | නිෂ්පාදන පිරිවැය (ඈ) | රු. ශත/කි.ග්‍රෑම් | 157.34 | 168.85 |
| 1.5 | සාමාන්‍ය මිල | | | |
| | - කොළඹ වෙන්දේසිය | රු. ශත/කි.ග්‍රෑම් | 180.74 | 185.84 |
| | - අපනයන (නැ.වි.ස.) | රු. ශත/කි.ග්‍රෑම් | 248.92 | 263.31 |
| 1.6 | නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,245 | 1,333 |
| 1.7 | අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 22 | 7 |
| 1.8 | එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 2.2 | 2.0 |
| **2** | **රබර්** | | | |
| 2.1 | නිෂ්පාදනය | කි.ග්‍රෑම් දශ ලක්ෂ | 94.7 | 104.4 |
| 2.2 | මුළු වගා බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 115 | 116 |
| 2.3 | කිරි කැපීම යටතේ ඇති බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 89 | 89 |
| 2.4 | නිෂ්පාදන පිරිවැය | රු. ශත/කි.ග්‍රෑම් | 73.40 | 76.12 |
| 2.5 | සාමාන්‍ය මිල | | | |
| | - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1) | රු. ශත/කි.ග්‍රෑම් | 127.20 | 147.41 |
| | - අපනයන (නැ.වි.ස.) | රු. ශත/කි.ග්‍රෑම් | 128.51 | 147.73 |
| 2.6 | නැවත වගා කිරීම (උ) | හෙක්ටයාර දහස් | 820 | 1,448 |
| 2.7 | අළුතින් වගා කිරීම (උ) | හෙක්ටයාර දහස් | 518 | 504 |
| 2.8 | එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.7 | 0.7 |
| **3** | **පොල්** | | | |
| 3.1 | නිෂ්පාදනය | ගෙඩි දශ ලක්ෂ | 2,591 | 2,515 |
| 3.2 | මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 395 | 395 |
| 3.3 | නිෂ්පාදන පිරිවැය | රු. ශත/ගෙඩිය | 7.50 | 9.50 |
| 3.4 | සාමාන්‍ය මිල | | | |
| | - නිෂ්පාදන මිල (ඌ) | රු. ශත/ගෙඩිය | 9.83 | 12.46 |
| | - අපනයන (නැ.වි.ස.) (ඌ) | රු. ශත/ගෙඩිය | 11.03 | 13.04 |
| 3.5 | නැවත වගා කිරීම/ වගා කිරීමට යටත්ව (එ) | හෙක්ටයාර | 1,226 | 1,668 |
| 3.6 | අළුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 1,098 | 3,250 |
| 3.7 | එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 2.0 | 2.2 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරු වන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(උ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(ඌ) ප්‍රධාන පොල් නිෂ්පාදන තුනක් සඳහා පමණි.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

- **රබර් නිෂ්පාදනය නොකඩවා සිව්වන වර්ෂයටත් වර්ධනය විය.** 2005 දී නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 104 දක්වා සියයට 10.2 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ඉහළයාම නිසා කෘතීම රබර් මිල තියුණු ලෙස ඉහළ යාමෙන්, ස්වාභාවික රබර් මිල සැළකිය යුතු ලෙස

වැඩි විය. පොහොර භාවිතය වැඩිවීම හේතුකොටගෙන ඵලදාව වැඩිවීම සහ කිරි කැපීම ඉහළ යාමත්, වැසි ආවරණ යොදා ගැනීම වැනි තාක්ෂණික ක්‍රම භාවිතය සහ යහපත් වගා පිළිවෙත් අනුගමනය කිරීමත්, දේශීය නිෂ්පාදනය වැඩිවීමට හේතු විය. 2005 දී රබර්වල සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,064 සිට හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,170 දක්වා වැඩි විය. නිෂ්පාදන පිරිවැයෙහි සාමාන්‍යය සියයට 4 කින් වැඩි වූ අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සේවක වැටුප් ඉහළ යාමයි. ආකර්ෂණීය මිල ගණන් සහ සහනාධාර හේතුවෙන් රබර් නැවත වගා කිරීම ධෛර්යමත් වී තිබෙන අතර, 2005 දී නැවත වගාව හෙක්ටයාර 1,448 දක්වා සියයට 77 කින් වැඩි විය. රබර් ආශ්‍රිත කර්මාන්ත පුළුල්වීමත් සමඟ, 2005 දී ස්වාභාවික රබර් සඳහා දේශීය ඉල්ලුම ද කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 73 දක්වා සියයට 34 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.

- **2003 සහ 2004 ආරම්භයේදී පැවති නියඟයෙහි පසුකාලීන බලපෑම සහ මයිටා උවදුරෙහි බලපෑම හේතුකොටගෙන 2005 දී පොල් නිෂ්පාදනය පහත වැටුණි.** 2005 වසරේ පෙබරවාරි මාසයේ දී වසරේ අඩුම පොල් නිෂ්පාදනය වාර්තා විය. කාලගුණය වඩා යහපත් වීමත් සමඟ මයිටා උවදුර ක්‍රමයෙන් පාලනය වී 2005 අප්‍රේල් මාසය වනවිට නිෂ්පාදනය වර්ධනය වීම ආරම්භ විය. කෙසේ වුවද, 2005 මුළු පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 2,515 දක්වා සියයට 2.9 කින් පහත වැටුණි. 2005 දී නිෂ්පාදන පිරිවැය පොල් ගෙඩියකට රුපියල් 9.50 දක්වා සියයට 27 කින් වැඩි විය.

- **2005 දී කුරුඳු, කරාබු නැටි, ගම්මිරිස්, සාදික්කා, කෝපි, කොකෝවා සහ පුවක් වැනි අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනය ඉහළ ගියේය.** පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා වල දයකත්වය සහ කාළගුණික තත්ත්වයන් යහපත්වීම කරාබු නැටි (සියයට 36 කින්), ගම්මිරිස් (සියයට 27 කින්) සහ සාදික්කා (සියයට 23 කින්) නිෂ්පාදනයන් සැළකිය යුතු ලෙස වැඩිවීමට හේතු විය. පසුගිය දශක තුන තුළ වූ ඉහළම වර්ධනය වාර්තා කරමින් 2005 දී අපනයන කෘෂි බෝග නිෂ්පාදනය සියයට 28 කින් ද, වටිනාකම අනුව සියයට 24 කින් ද වැඩි විය.

**දේශීය කෘෂිකර්මය**

- **2005 වසරේදී වී නිෂ්පාදනය නව වාර්තාගත මට්ටමක් දක්වා ඉහළ ගියේය.** 2004/05 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,012,706 දක්වා සියයට 20.5 කින් ඉහළ ගිය අතර 2005 යල කන්නයේ නිෂ්පාදනය ද මෙට්‍රික් ටොන් 1,234,480 දක්වා සියයට 28.7 කින් ඉහළ යාම නිසා 2005 දී වාර්ෂික සමස්ත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3,246,186 ක වාර්තාගත මට්ටමක් දක්වා සියයට 23.5 කින් ඉහළ ගියේය. වසර පුරා පැතිර පැවතුනු වර්ෂාපතනය නිසා ප්‍රධාන වී වගාකරන ප්‍රදේශවල වගා බිම් හා ආන්තික බිම් ඇතුළුව වගාකළ බිම් ප්‍රමාණය ඉහළ නැංවිනි. 2004 දී පැවති ආකර්ෂණීය මිල ගණන් වී වගාකිරීමට වැඩි වශයෙන් යොමුකරවීමට හේතු විය. 2005 වසරේදී වැඩි දියුණු වගා ක්‍රම අනුගමනය කිරීම නිෂ්පාදනය තවදුරටත් වැඩිවීමට හේතු විය. ආන්තික බිම්වල ඵලදායීතාවය අඩු මට්ටමක පැවතීම හේතුවෙන් 2005 වසරේ සමස්ථ ඵලදායීතාවය 2004 පැවති වාර්තාගත සාමාන්‍ය ඵලදායීතාවය වූ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 4.09 සිට හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 3.97 දක්වා අඩු විය.

- **හිතකර කාලගුණික තත්ත්වයේ බලපෑම හේතුවෙන් අනෙකුත් ආහාර බෝග නිෂ්පාදනය ද ඉහළ ගියේය.** කුරක්කන්, බඩ ඉරිඟු, මුං ඇට, රතුළූණු, මිරිස් ආදී

**2.4 සංඛ්‍යා සටහන**

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 2004(අ) | | | 2005(ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් | හෙක්ටයාර දහස් | 521 | 258 | 779 | 581 | 357 | 938 |
| අස්වැන්න නෙලාගත් දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 469 | 251 | 720 | 570 | 345 | 915 |
| අස්වැන්න කපාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 417 | 226 | 643 | 509 | 310 | 819 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 1,670 | 958 | 2,628 | 2,013 | 1,233 | 3,246 |
| | බුසල් දහස් | 80,022 | 45,920 | 125,942 | 96,461 | 59,116 | 155,577 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑම් | 4,004 | 4,244 | 4,087 | 3,960 | 3,976 | 3,966 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශ ලක්ෂ | 666 | 365 | 1,031 | 675 | 462 | 1,137 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 222 | - | - | 52 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 326 | - | - | 76 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අතිරේක ආහාර බෝග මෙන්ම උඩරට සහ පහත රට එළවළු නිෂ්පාදනය ද 2005 වසරේදී ඉහළ ගියේය. අර්තාපල් නිෂ්පාදනය සියයට 1.3 කින් අඩු විය. කෙසේ වුවද, යෙදවුම් හා ප්‍රවාහනය සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීමෙන් සමහර එළවළු වර්ගවල මිල ඉහළ මට්ටමක පැවතුණි. අඹ, අන්නාසි සහ පැපොල් ආදී ප්‍රධාන පළතුරු වර්ග නිෂ්පාදනය 2005 වසරේදී ඉහළ ගිය අතර, කෙසෙල් නිෂ්පාදනයේ අඩුවීමක් වාර්තා විය.

- **2005 වසරේ සීනි නිෂ්පාදනය අඩුවිය**. 2005 වසරේ සමස්ත සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 54,000 දක්වා සියයට 7 කින් අඩු විය. පැල්වත්ත සීනි කම්හලෙහි කාර්මික දෝෂයක් පැවතීම සහ සෙවනගල සීනි කම්හලෙහි කම්කරු ආරවුල් පැවතීම මෙයට හේතුවිය. 2005 වසරේ ආනයනිත සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 418,000 වූ බැවින් දේශීය සීනි නිෂ්පාදනය මුළු සීනි සැපයුමෙන් සියයට 11 ක් පමණ විය. ජීව ඉන්ධන සෑදීම පිණිස උක් භාවිතා කිරීමෙන් ඇති වූ අධික ඉල්ලුම හේතුවෙන් 2005 වසරේදී ජාත්‍යන්තර සීනි මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ ගිය අතර, එමගින් දේශීය නිෂ්පාදන පිරිවැය තරඟකාරී බවට පත් විය.

**පශු සම්පත්**

- **2005 වසරේ සමස්ත කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂ 193 දක්වා සියයට 1.3 කින් ඉහළ ගියේය**. මෙය එළකිරි ලීටර් දශ ලක්ෂ 161.8 ක් හා මීකිරි ලීටර් දශ ලක්ෂ 30.9 කින් සමන්විත විය. රජය මගින් දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම හා නැවුම් කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා වැඩ පිළිවෙල ගණනාවක් දියත් කරන ලදී. කෙසේ වුවද, වර්තමානයේ දේශීය කිරි නිෂ්පාදනය සමස්ථ කිරි අවශ්‍යතාවයෙන් සියයට 15 ක් පමණ වන අතර ඉතිරි කොටස ප්‍රධාන වශයෙන්ම පිටි කිරි වශයෙන් ආනයනය කරනු ලැබේ.

- **ආසියාතු කලාපයේ සමහර රටවල කුරුළු උණ රෝගය පැතිර ගියද 2005 වසරේ කුකුළු පාලන අංශය යහපත් ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය**. පැටවුන් බෝ කිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජනය වැඩි වීම හේතුවෙන් දේශීය කුකුළු පැටවි නිෂ්පාදනය ඉහළ ගියේය. සුනාමි ව්‍යසනයෙන් පසු මත්ස්‍ය නිෂ්පාදනය පහත වැටීමත් සමඟ 2005 වසරේ කුකුළු මස් සඳහා ඉල්ලුම ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2005 දී කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 97,256 දක්වා සියයට 2.7 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, බිත්තර නිෂ්පාදනය 2004 ට සාපේක්ෂව දශ ලක්ෂ 865 දක්වා සියයට 1 කින් අඩු විය. කුරුළු උණ රෝගයෙන් දේශීය කුකුළු පාලන කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා රජය මගින් සජීවි කුරුල්ලන් සහ කුරුළු මස් නිෂ්පාදිත ආනයනය 2005 ඔක්තෝබර් සිට තාවකාලිකව තහනම් කරන ලදී. දෙසැම්බර් මාසයේ උත්සව සමයේදී ඇතිවන දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා මෙම තහනම ලිහිල් කරන ලද අතර, කුරුළු උණ නොපැතුරුණු රටවලින් ආනයන සිදු කිරීමට ඉඩ හරින ලදී. කුකුළු පැටවුන් සඳහා පිරිවැය අඩු කිරීමට මෙන්ම වෙනත් රටවලින් පැතිරෙන රෝගවලට නිරාවරණයවීම අවම කිරීම සඳහා පැටවුන් බෝ කරන ගොවිපොලවල් සඳහා දේශීය ආයෝජනයන් දිරි ගැන්වීම වැදගත් වේ.

**2.5 සංඛ්‍යා සටහන**

**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

| උප අංශය | 2004(අ) | 2005(ආ) |
|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 253 | 130 |
| ජල ජීවී සහ මිරිදිය මසුන් | 33 | 33 |
| **එකතුව** | **286** | **163** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලයන් : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
ජාතික ජල සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය

**ධීවර**

- **සුනාමි ව්‍යසනයේ බලපෑම හේතුකොටගෙන 2005 දී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 43 කින් තියුණු ලෙස පහත වැටුණි**. සුනාමියට පෙර පැවති තත්ත්වයන් හා සැසඳීමේදී 2005 ප්‍රථම කාර්තුව තුළ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 77.6 කින් පහත වැටුණ ද, 2005 අවසාන කාර්තුව වනවිට මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීම සියයට 18.7 ක් විය. කෙසේ වුවද, මෙම අඩුවීම සිදු වූයේ දෙසැම්බර් 26 සුනාමියේ ක්ෂණික බලපෑම පිළිබිඹු කරමින් 2004 සිව්වැනි කාර්තුවේ වාර්තා වූ සියයට 13.5 ක සංකෝචනයට අමතරවය.

- **සුනාමි ව්‍යසනයේ බලපෑමෙන් ධීවරයන් මරණයට පත්වීම සහ ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න හානියට පත්වීම හේතුකොටගෙන කරදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 48.5 කින් අඩු වූ අතර. ඉස්සන් කොටුවල සුදු පුල්ලි රෝගය පැතිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිරිදිය සහ ජලජීව නිෂ්පාදනය සියයට 1 කින් පහත වැටුණි**. සුනාමියෙන් පසු ප්‍රමාණවත් තරම් බහු දින යාත්‍රා සහ ධීවර බෝට්ටු ප්‍රමාණයක් නොතිබීම සහ ධීවර වරායන්, වෙළෙඳපොළ සහ අයිස් සෑදීමේ කම්හල් වැනි ධීවර කර්මාන්තයට උපකාරීවන යටිතල පහසුකම් නැවත ගොඩ නැගීම මන්දගාමීව සිදුවීම හේතුවෙන් 2005 දියඹේ මත්ස්‍ය සම්පත උපරිම වශයෙන් නෙලා ගැනීමට නොහැකි විය. 2006 වසරේ දී මත්ස්‍ය නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වී 2004 වසරේ වාර්තා කළ මට්ටමට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වන සම්පත්**

- **වන සංවර්ධන කටයුතු සිදුකිරීම සහ කර්මාන්තවලට අවශ්‍ය දැව සැපයීම ඒට අදාළ රජයේ ආයතන සහ පෞද්ගලික අංශය මගින් සිදු වේ**. 2005 දී, ප්‍රාදේශීය වතු සමාගම් 23 කින් සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වතු සමාගමෙන්

සමන්විත ආයතනික අංශය විසින් ප්‍රයෝජනයට නොගත් සිය වතුවලට අයත් භූමියෙන් හෙක්ටයාර 627 ක් වන වගාවට යොදා ගනු ලැබීය. මේ අතරතුර, ශ්‍රී ලංකා දැව සංස්ථාව මහජනතාවට සහ පෞද්ගලික අංශයට දැව සැපයීම නොකඩවා කරගෙන ගියේය. වර්ෂය තුළ දී දැව සංස්ථාවේ නිෂ්පාදිත, දැව, ඉරු කඳන්, සහ ඉන්ධන වශයෙන් යොදා ගන්නා දැව අලෙවිය පෙර වසරට සාපේක්ෂව ඝන මීටර් 285,634 දක්වා සියයට 64 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.


**කාර්මික**

- **පතල් සහ කැනීම්, නිමැවුම් කර්මාන්ත, ඉදිකිරීම් සහ විදුලිය සහ ජලය යන අංශ හතරෙන් සමන්විත කාර්මික අංශය 2004 දී අත්කරගත් සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව 2005 දී සියයට 8.3 කින් වර්ධනය විය.** දළ දේශීය නිෂ්පාදිතය සඳහා කාර්මික අංශයෙහි දායකත්වය 2004 දී පැවති සියයට 26.4 සිට 2005 දී සියයට 27 දක්වා ඉහළ ගිය අතර එය 2005 දී සමස්ත ආර්ථික වර්ධනයට සියයට 36 කින් දායක විය. උප අංශ හතරෙන් විශාලතම අංශය වූ නිමැවුම් කර්මාන්ත අංශය දළ දේශීය නිෂ්පාදිතයට සියයට 16 කින් දායක වූ අතර එය 2005 වසරේ සමස්ත ආර්ථික වර්ධනයට ද සියයට 16 කින් දායක විය.

- **නිමැවුම් කර්මාන්ත අංශයෙහි නිෂ්පාදිතයෙන් සියයට 80 කට වඩා වැඩි ප්‍රතිශතයකට දායක වන කම්හල් කර්මාන්ත අංශය 2005 දී සියයට 6.2 කින් වර්ධනය විය.** තෙල් මිල උච්ඡාවචනය වීම, බහුවිධ කෙඳි ගිවිසුම (Multi Fibre Arrangement) අහෝසිවීම සහ සුනාමි ව්‍යසනයෙන් ඇති වූ හානි ආදී අවිනිශ්චිතතා හමුවේ වුවද මෙම වර්ධනය ළඟා කර ගැනීමට හැකි විය. වසරේ මුල් භාගයේදී ජාත්‍යන්තර වෙළෙඳමෙහි ඇති වූ යහපත් වර්ධනය සහ දේශීය ඉල්ලුමෙහි ඇති වූ වර්ධනය හේතුකොටගෙන 2005 වසරේදී කම්හල් කර්මාන්ත අංශය විසින් මෙම වර්ධනය අත්පත් කර ගන්නා ලදී. විශාල පරාසයක නිෂ්පාදන සඳහා වූ අපනයන ඉල්ලුම ඉහළයාම, හිතකර කාළගුණික තත්ත්වය, බැංකු මගින් සපයන ලද ණය පහසුකම් වර්ධනය වීම, ධාරිතා උපයෝජනය ඉහළයාම, සමාගම් අංශයේ ඉහළ ක්‍රියාකාරිත්වය සහ ව්‍යාපාරික හා පාරිභෝගික විශ්වසනීයත්වය වර්ධනයවීම ආදිය කර්මාන්ත අංශයෙහි මෙම සතුටුදායක ක්‍රියාකාරීත්වය සඳහා උපකාරී විය. රාජ්‍ය අංශයේ කර්මාන්තවල වර්ධනය සියයට 6.2 කින් පහළ යාම හේතුවෙන් 2005 දී කම්හල් කර්මාන්ත අංශයෙහි සමස්ත වර්ධනය මුළුමනින්ම ජනිත වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්තවල ඇති වූ වර්ධනය තුළිනි.

- **අනෙකුත් රටවල් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවිෂ්ටවීමේ මාර්ග පුළුල් කිරීම සඳහා රජය විසින් ගන්නා ලද අඛණ්ඩ උත්සාහයන් තුළින් කම්හල් කර්මාන්ත අංශය ප්‍රතිලාභ ලැබීය.** ශ්‍රී ලංකාවෙහි ඉහළ ශ්‍රම සහ පාරිසරික සුරක්ෂිතතා ප්‍රමිතීන් පැවතීම, ආයෝජන ප්‍රවර්ධනය සඳහා උපකාරී වූ ප්‍රතිපත්තිමය වාතාවරණය හා ශ්‍රම බලකාය සතු ඉහළ සාක්ෂරතාවය මෙම ක්‍රියාදාමය සඳහා උපකාරී විය. ගෝලීය වෙළෙඳපොළෙහි ඇති වූ ඉහළ තරඟකාරිත්වය, ගෝලීය සැපයුම් සහ ඉල්ලුම් තත්ත්වයන්ට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.

**2.3 රූප සටහන**
**කාර්මික නිමැවුමෙහි සංයුතිය - 2005**




- **කම්හල් කර්මාන්ත අංශය සියළු කාර්මික කාණ්ඩයන් නියෝජනය වන පරිදි පුළුල් පදනමකින් යුතුව වර්ධනය වී ඇත.** කෙසේ වෙතත්, රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන, ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන මෙම වර්ධනය ජනිත කළ ප්‍රධාන කාර්මික කාණ්ඩයන් වේ. කාර්මික අංශයේ වර්ධනයෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රතිශතයක් සඳහා මෙම කාර්මික කාණ්ඩයන් හතර දායක වී ඇත.

- **රබර් අත්වැසුම්, ටයර්, ඇඟළුම්, රෙදිපිළි, පිඟන් භාණ්ඩ, ප්ලාස්ටික්, සම් භාණ්ඩ සහ සකස් කළ දියමන්ති ආදී නිෂ්පාදනයන්හි ඇති වූ වර්ධනය ප්‍රධාන වශයෙන්ම අපනයන ඉල්ලුමේ ඇති වූ වර්ධනය තුළින් සිදු විය.** ජාත්‍යන්තර ඉල්ලුම ඉහළයාම, විශේෂයෙන්ම එක්සත් ජනපද සහ යුරෝපා සංගම් වෙළෙඳපොළවලින් ඇති වූ ඉල්ලුම ඉහළයාම තුළින් මෙම කර්මාන්ත ප්‍රතිලාභ ලැබීය. සාපේක්ෂ වශයෙන් දේශීය උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම සහ සුනාමි ව්‍යසනයට පසුව ක්ෂණිකව විදේශ විනිමය අනුපාතිකය අධි ප්‍රමාණය වුවද, පිරිවැය දැඩි ලෙස පාලනය කිරීම තුළින් අපනයන තරඟකාරිත්වය පවත්වා ගැනීමට හැකි විය. නිෂ්පාදන විශේෂීකරණය, නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සහ කුඩා ප්‍රමාණයේ විශේෂිත වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ටවීම ආදිය තුළින් තරඟකාරීත්වය තවදුරටත් වර්ධනය කර ගන්නා ලදී. නිෂ්පාදන සහ වෙළෙඳම් ක්‍රියාදාමයේ විවිධ අවස්ථාවලදී තොරතුරු තාක්ෂණය බහුල වශයෙන් යොදා ගැනීම මෙම ක්‍රියාකාරීත්වය සඳහා උපකාරී විය.

**විශේෂ සටහන 5**

## බහුවිධ කෙඳි ගිවිසුම අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය

පංගු ක්‍රමය මගින් රෙදිපිළි සහ ඇඟළුම් හා සම්බන්ධ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු මෙහෙයවනු ලැබූ බහුවිධ කෙඳි ගිවිසුම (Multi Fibre Arrangement) 2005 වසර ආරම්භයේදී අවසන් විය. 2005 වසර අවසානය දක්වා ලද අත්දැකීම්වලට අනුව පෙනී යනුයේ එමගින් ඇති වූ බලපෑම රටින් රටට වෙනස්වන බවය. විශාල ලෙස ඇඟළුම් අපනයනය කරනු ලබන චීනය සහ ඉන්දියාව වැනි රටවල් මේ තුළින් ප්‍රතිලාභ ලද අතර, ඇතැම් කුඩා රටවලට මෙමගින් ලද ප්‍රතිලාභ අහිමි විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව ඇතුළු කුඩා රටවල් කිහිපයකට සිය වෙළෙඳපොළ කොටස පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබේ. (සංඛ්‍යා සටහන වි.ස. 5.1)

පංගු රහිත වෙළෙඳපොළ වාතාවරණය තුළ ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන ප්‍රධාන වශයෙන් එක්සත් ජනපදය (සියයට 58) සහ යුරෝපා සංගමය (සියයට 37) වෙත යොමු වී තිබේ. යුරෝපා සංගම් වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාව සඳහා පැවති පංගු සම්බාධක 2003 දී ඉවත් කළ අතර, 2004 අවසානය වනතුරු එක්සත් ජනපද වෙළෙඳපොළ වෙත අපනයනය කළ ඇඟළුම් වලින් සියයට 90 කට පමණ පංගු සම්බාධකවලට මුහුණ දීමට සිදු විය. පංගු රහිත වෙළෙඳපොළ වාතාවරණය යටතේ, 2005 ප්‍රථම මාස නවය තුළදී ශ්‍රී ලංකාවෙන් එක්සත් ජනපද වෙළෙඳපොළ වෙත අපනයනය කළ ඇඟළුම්වල වටිනාකම මෙන්ම ප්‍රමාණය ද ඉහළ ගොස් ඇත. ඇතැම් ප්‍රධාන ඇඟළුම් නිෂ්පාදන කාණ්ඩ සඳහා එක්සත් ජනපද වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාව සතු ඉහළ තරඟකාරිත්වය මේ සඳහා උපකාරී විය. කෙසේ වුවද, 2005 පළමු මාස නවය තුළදී ශ්‍රී ලංකාවෙන් යුරෝපා සංගම් වෙළෙඳපොළ වෙත කරන ලද ඇඟළුම් අපනයන වටිනාකම මෙන්ම ප්‍රමාණය ද පහත වැටී ඇත. පොදු වරණීය තීරු බදු ක්‍රමය (GSP+) යටතේ යුරෝපා සංගමය මගින් සහන ලබාදුන් නමුදු, ඇඟළුම් නිෂ්පාදන සඳහා ඒවා අපනයනය කරන රට තුළ සියයට 48 කට වැඩි ප්‍රමාණයකින් අගයක් එකතු කිරීමේ නීතිමය අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකිවීම හේතුවෙන් එම ක්‍රමය යටතේ ලබාදුන් සහන නිසි පරිදි ලබාගත නොහැකි විය.

ගෝලීය වෙළෙඳපොළ තුළ ඇඟළුම් සඳහා තරඟකාරිත්වය ඉහළ යාමත් සමඟ ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රධාන නිෂ්පාදකයින් විසින් ඵලදායිතාව ඉහළ නැංවීම, ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදනයන් සඳහා යොමුවීම, මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම, නව විලාසිතා හා වෙළෙඳපොළ ශක්‍යතාවයන් වර්ධනය කිරීම, නිෂ්පාදන පිරිවැය තාර්කීකරණය කිරීම, සැපයුම් ක්‍රියාදාම කළමනාකරණය ඉහළ නැංවීම සහ කර්මාන්ත තුළ ඉදිරි හා පසුබැඳීම් වැඩි දියුණු කිරීම ආදිය තුළින් තරඟකාරිත්වය වර්ධනය කරනු ලැබ ඇත.

මහා පරිමාණ නිෂ්පාදන ආයතනවලට ගෝලීය ප්‍රවනතාවයන්ට අනුගතව සිය කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා සම්පත් පැවතියත්, එවැනි සම්පත් නොමැති කුඩා සහ මධ්‍ය පරිමාණ ඇඟළුම් නිෂ්පාදකයින් වඩාත් දුෂ්කරතාවයන්ට පත්ව තිබේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සෘජු වෙළෙඳපොළ සබඳතා හෝ විදේශ ගැණුම්කරුවන් සමඟ පවත්නා සෘජු සම්බන්ධතා නොපැවතීම හේතුවෙන් ඔවුනට මහා පරිමාණ නිෂ්පාදකයින්ගේ අතුරු කොන්ත්‍රාත් කාර්යයන් මත රඳා පැවතීමට සිදුවී ඇත. අන්තර් ජාතික වෙළෙඳපොළ

**සංඛ්‍යා සටහන වි.ස. 5.1**

**තෝරා ගන්නා ලද රටවල් කීපයක් විසින් ඇ.එ.ජ. සහ යුරෝපා සංගම් වෙළෙඳපොළ වෙත අපනයනය කළ මුළු ඇඟළුම්වල වටිනාකම, ප්‍රමාණය, සහ ලෝක වෙළෙඳපොළ කොටස (ජනවාරි-සැප්තැම්බර්)**

| | ඇ.එ.ජ. වෙත කළ අපනයන | | | | | | යුරෝපා සංගමය වෙත කළ අපනයන | | | | | | ලෝක වෙළෙඳපොළ කොටස (වටිනාකම අනුව %) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම (එ.ජ.ඩො. දශ ලක්ෂ) | | | ප්‍රමාණය (ව.මී. දශ ලක්ෂ) | | | වටිනාකම (එ.ජ.ඩො. දශ ලක්ෂ) | | | ප්‍රමාණය (කෑලි/යුගල දශ ලක්ෂ) | | | | |
| | 2004 | 2005 | වර්ධනය % | 2004 | 2005 | වර්ධනය % | 2004 | 2005 | වර්ධනය % | 2004 | 2005 | වර්ධනය % | 2004 | 2005 |
| චීනය | 6,692 | 12,207 | 82.4 | 2,205 | 4,656 | 111.2 | 11,479 | 16,623 | 44.8 | 1,492 | 2,091 | 40.1 | 21.6 | 30.1 |
| ඉන්දියාව | 1,713 | 2,271 | 32.6 | 473 | 601 | 27.1 | 3,485 | 4,043 | 16.0 | 581 | 613 | 5.5 | 6.5 | 7.3 |
| ඉන්දුනීසියාව | 1,845 | 2,165 | 17.3 | 543 | 618 | 13.8 | 1,366 | 1,131 | -17.2 | 210 | 186 | -11.6 | 2.6 | 2.0 |
| බංගලාදේශය | 1,476 | 1,769 | 19.9 | 698 | 841 | 20.5 | 3,026 | 2,768 | -8.5 | 431 | 425 | -1.4 | 5.7 | 5.0 |
| ශ්‍රී ලංකාව | 1,123 | 1,252 | 11.5 | 307 | 344 | 12.1 | 642 | 602 | -6.2 | 78 | 75 | -3.8 | 1.2 | 1.1 |
| පකිස්ථානය | 845 | 920 | 8.9 | 388 | 426 | 9.8 | 1,762 | 1,542 | -12.5 | 384 | 382 | -0.5 | 3.3 | 2.8 |
| තායිලන්තය | 1,305 | 1,348 | 3.3 | 392 | 403 | 2.8 | 918 | 795 | -13.4 | 110 | 117 | 6.4 | 1.7 | 1.4 |
| මෙක්සිකෝව | 5,084 | 4,677 | -8.0 | 1,453 | 1,311 | -9.8 | 74 | 73 | -1.6 | 15 | 19 | 26.7 | 0.1 | 0.1 |
| නේපාලය | 80 | 49 | -38.8 | 28 | 15 | -46.4 | 59 | 54 | -8.5 | 6 | 5 | -16.7 | 0.1 | 0.1 |
| වියට්නාමය | 2,048 | 2,027 | -1.0 | 593 | 594 | 0.2 | 579 | 552 | -4.7 | 69 | 62 | -10.1 | 1.1 | 1.0 |

මූලයන්: එ.ජ.වාණිජ දෙපාර්තමේන්තුව, ඇඟළුම් සහ රෙදිපිළි කාර්යාලය
යුරෝපා කොමිසමෙහි වෙළෙඳ සංඛ්‍යා

තුළ මිල ගණන් පහළ බැසීම සහ නිෂ්පාදන ක්‍රියාදාමය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය සම්පත් හිඟකම වැනි ද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. මෙම දුෂ්කරතා මඟහරවා ගැනීම පිණිස රජය විසින් මූල්‍ය පහසුකම් ලබාදීම මෙන්ම අමු ද්‍රව්‍ය සපයා ගැනීම සහ පුහුණු කිරීම් ආදී ක්ෂේත්‍රයන් සඳහා උපකාරවන පියවර රැසක් ප්‍රකාශයට පත්කර තිබේ. ඇඟළුම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා කටයුතු කරන ඇඟළුම්කරුවන්ගේ ඒකාබද්ධ සංසදය (JAAF) විසින්ද ඇඟළුම් කර්මාන්තය කේවල නිෂ්පාදකයකුගේ තත්ත්වයේ සිට පූර්ණ සේවාවන් සපයනු ලබන නිෂ්පාදකයකුගේ තත්ත්වය දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පියවර රැසක් ක්‍රියාවට නංවා ඇත.

- **සකස් කළ ආහාර, පාන වර්ග, මත්පැන්, බීර, කිරි නිෂ්පාදන, සිමෙන්ති, ගොඩනැගිලි ද්‍රව්‍ය, පිඟන් භාණ්ඩ, සත්ව ආහාර, සබන් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ සකස් කළ ලෝහ වර්ග ආදී නිෂ්පාදනවල ඉහළ ක්‍රියාකාරීත්වය දේශීය වෙළෙඳපොලාභිමුඛ කර්මාන්තවල වර්ධනය සඳහා හේතු විය.** 2005 දී පැවැති පහළ පොලී අනුපාතික වාතාවරණය සහ ඒක පුද්ගල ආදායමේ ඉහළයාම හේතුවෙන් ඇති වූ පාරිභෝගික වියදම් ඉහළයාම තුළින් මෙම නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම වර්ධනය විය. පශ්චාත් සුනාමි යළි ගොඩනැගීම් කටයුතු මෙන්ම ඉදිකිරීම් කර්මාන්තයන්හි ඇති වූ වර්ධනය ද ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වූ ඉල්ලුම ඉහළ නැංවීමට හේතු විය.

- **රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන කාණ්ඩයෙහි නිමැවුම 2005 දී සියයට 4.9 ක වර්ධනයක් වාර්තා කළ අතර, කම්හල් කර්මාන්ත අංශයෙහි සමස්ත වර්ධනය සඳහා මෙම අංශය සියයට 31 කින් දායක විය.** 2005 දී මෙම උප අංශයේ මධ්‍යස්ථ වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2005 දෙවන භාගය තුළ ඇඟළුම් නිෂ්පාදනයන්හි මිල ගණන් පහළ යාමයි. කෙසේ වුවත්, ඉහළ ගුණාත්මක බැවින් යුක්ත ඇතැම් ප්‍රධාන කාණ්ඩවලට අයත් ඇඟළුම් නිෂ්පාදන, ප්‍රධාන

**2.6 සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදන වටිනාකම**
**(1990 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩයන් | රු. දශ ලක්ෂ 2004 | රු. දශ ලක්ෂ 2005(අ) | ප්‍රතිශත වෙනස 2004 | ප්‍රතිශත වෙනස 2005(අ) |
|---|---|---|---|---|
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 52,912 | 55,430 | 4.5 | 4.8 |
| 2 රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 93,062 | 97,576 | 7.9 | 4.9 |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 1,610 | 1,659 | 4.1 | 3.1 |
| 4 කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 3,882 | 4,000 | 1.9 | 3.0 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 45,098 | 50,720 | 4.6 | 12.5 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 18,631 | 19,777 | 7.6 | 6.2 |
| 7 මූලික ලෝහ නිෂ්පාදිත | 2,455 | 2,600 | 8.9 | 5.9 |
| 8 සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 10,512 | 10,825 | 4.3 | 3.0 |
| 9 කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5,207 | 5,366 | 3.2 | 3.1 |
| **එකතුව** | **233,369** | **247,953** | **6.1** | **6.2** |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වශයෙන් පංගු රහිත වෙළෙඳපොළ වාතාවරණය යටතේ එක්සත් ජනපද වෙළෙඳපොළ තුළ ශක්තිමත්ව පැවැතීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ලෝක වෙළෙඳපොළ කොටස නොවෙනස්ව පවත්වා ගැනීමට හැකියාව ලැබිණි. පොදු වරණීය තීරු බදු (GSP+) ක්‍රමය යටතේ යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන සඳහා තීරු බදු රහිත වෙළෙඳපොළ ප්‍රවේශයක් ලබාගත හැකි වුවද, තීරු බදු සහන ලැබීම පිණිස ඇඟළුම් නිෂ්පාදිත සඳහා ඒවා අපනයනය කරනු ලබන රටතුළ සියයට 48 කට වඩා වැඩි ප්‍රමාණයකින් අගයක් එකතු කිරීමේ නීතිමය අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි වීම එම ක්‍රමය යටතේ ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ අවම වීමට හේතු විය. පසුගිය වසර පහක කාල පරිච්ඡේදයක් තුළ ක්‍රියාත්මක වූ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය මෙන්ම කර්මාන්තය තුළ පෙර සහ පසු බැඳීම්වල ඇති වූ වර්ධනය 2005 දී මෙම අංශය අත්කරගත් වර්ධනය සඳහා බෙහෙවින් උපකාරී විය.

- **ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයෙහි නිමැවුම 2005 දී සියයට 4.8 කින් වර්ධනය වූ අතර එම අංශය 2005 දී කම්හල් කර්මාන්ත අංශයෙහි වර්ධනය සඳහා සියයට 17 කින් දායක විය.** ආහාර සැකසුම් (සියයට 5.1), පාන වර්ග (සියයට 3.3), මත්පැන් (සියයට 7.5) සහ දුම්කොළ නිෂ්පාදන (සියයට 3.0) යන සියළු උප අංශයන් සාපේක්ෂ වශයෙන් ඉහළ නිමැවුමක් වාර්තා කළේය. 2005 දී ආහාර උප අංශයෙහි වර්ධනය සඳහා, කිරි නිෂ්පාදන, සෝයා නිෂ්පාදන, අයිස්ක්‍රීම්, සැකසූ සහ අසුරන ලද පළතුරු හා එළවළු නිෂ්පාදන වැනි පුළුල් පරාසයක වූ නිෂ්පාදනයන්හි යහපත් ක්‍රියාකාරීත්වය හේතු විය. සාපේක්ෂ වශයෙන් පහළ පොලී අනුපාතික වතාවරණයන් පැවැතීම, ඉහළ වැටුප් සහ කෘෂිකාර්මික ප්‍රදේශවල අස්වනු ඉහළයාම හේතුකොටගෙන පාරිභෝගික වියදම් ඉහළයාම තුළින් මෙම නිෂ්පාදිතයන් සඳහා වූ දේශීය ඉල්ලුම වර්ධනය විය. මත්පැන් සඳහා වූ බදු ඉහළ ගියද දේශීය ඉල්ලුමෙහි ඇති වූ වර්ධනය හේතුවෙන් එම නිෂ්පාදනයන් සියයට 7.5 කින් ඉහළ ගියේය. පානීය ජල නිෂ්පාදනය ද ඉහළ වර්ධනයක් ලඟාකර ගන්නා ලදී.

- **රබර් ආශ්‍රිත නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය සහ පොහොර නිෂ්පාදනයන්හි හිතකර වර්ධනයක් පිළිබිඹු කරමින් කම්හල් කර්මාන්ත අංශයෙහි තෙවැනි විශාලතම අංශය වූ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික්**

**නිෂ්පාදන කාණ්ඩයෙහි නිමැවුම 2005 දී සියයට 12.5 කින් වර්ධනය විය.** මෙම අංශය කම්හල් කර්මාන්ත අංශයේ වර්ධනයට සියයට 39 කින් දායක විය. දේශීය රබර් නිෂ්පාදනයෙන් සියයට 90 ක පමණ ප්‍රතිශතයක් අවශෝෂණය කරගත් රබර් අත්වැසුම් සහ ටයර් නිෂ්පාදන සඳහා ඇති වූ බාහිර ඉල්ලුමේ ඉහළයාම හේතුවෙන් රබර් ආශ්‍රිත නිෂ්පාදනවල නිමැවුම 2005 දී සියයට 25 කින් පමණ ඉහළ නැගුණි. එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රධාන අපනයන වෙළෙඳපොළ වූ අතර එක්සත් රාජධානිය සහ ජර්මනිය මීළඟට වැදගත් වෙළෙඳපොළවල් විය. මේ අතර වියට්නාමය, රුසියානු සමූහාණ්ඩුව, රොමේනියාව සහ ආසියා පැසිෆික් කලාපය තුළ ද නව වෙළෙඳපොළවල් හඳුනාගෙන තිබේ. ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනයත් සමඟ ප්ලාස්ටික් සහ පීවීසී නිෂ්පාදන සඳහා වූ දේශීය ඉල්ලුම සැළකිය යුතු ලෙස ඉහළ නැගුණි.

- **ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන්හි නිමවුම 2005 වසරේදී සියයට 6.2 ක වර්ධනයක් වාර්තා කළ අතර, එය කම්හල් කර්මාන්ත අංශයෙහි සමස්ත වර්ධනයට සියයට 8 කින් දායක විය.** පශ්චාත් සුනාමි ඉදි කිරීම් කටයුතු, රජය විසින් ක්‍රියාත්මක කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සහ වාණිජ කටයුතු ආශ්‍රිතව ඇති වූ ඉදිකිරීම් පුළුල්වීම ආදිය හේතුකොටගෙන සිමෙන්ති, පිඟන් භාණ්ඩ සහ සෙවිලි තහඩු වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා ඉහළ ඉල්ලුමක් ඇති විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයෙන් පිඟන් භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන සඳහා වර්ධනය වූ ඉල්ලුමත් සමඟ පිඟන් කට්ටල සහ අනෙකුත් පිඟන් භාණ්ඩ නිෂ්පාදිතයන්හි නිමැවුමේ යහපත් වර්ධනයක් ඇති විය. ප්‍රමුඛ පෙළේ නිෂ්පාදකයින් විසින් බලශක්ති පිරිමැසුම් සඳහා වඩාත් නවීන තාක්ෂණය හඳුන්වාදීම තුළින් නිෂ්පාදන පිරිවැය අඩුකර ඇති අතර නිෂ්පාදන ධාරිතාවය පුළුල් කරනු ලැබ ඇත. කෙසේ වුවත්, පිඟන් මැටි වැනි අත්‍යාවශ්‍ය අමු ද්‍රව්‍යයන්හි අධි උපයෝජනය හේතුවෙන්, දිගු කාලීන වශයෙන් පිඟන් භාණ්ඩ ආශ්‍රිත කර්මාන්තය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය සපයා ගැනීම ප්‍රධාන ගැටළුවක් වනු ඇත.
- **සකස් කළ ලෝහ නිෂ්පාදනයන්හි නිමැවුම 2004 දී පැවති සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව 2005 වසරේදී සියයට 3.0 කින් වර්ධනය විය.** මෙම අංශයේ මධ්‍යස්ථ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ලෝක වෙළෙඳපොළෙහි පැවැති ඉහළ තරඟකාරිත්වය හේතුකොටගෙන විද්‍යුත් අයිතමයන් සහ පරිගණක කොටස් ආදී ඇතැම් අපනයනවල සිදු වූ පහළ යාමයි. කෙසේ වුවත්, 2005 වසරේදී කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, බෝට්ටු නිෂ්පාදනය සහ අළුත්වැඩියා කිරීම, යතුරු පැදි එකලස් කිරීම, වතුර පොම්ප, වානේ ගෘහ භාණ්ඩ සහ විදුලි උපාංග වැනි දේශීය වෙළෙඳපොළාභිමුඛ නිෂ්පාදනයන් සාපේක්ෂ වශයෙන් ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. සුනාමි ව්‍යසනයෙන් විනාශයට පත් වූ බෝට්ටු යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය හේතුකොටගෙන බෝට්ටු සහ අනෙකුත් අදාළ උපකරණ සඳහා වූ ඉල්ලුම 2005 වසරේදී සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. ආදායම් මට්ටම් ඉහළයාම, සිත් ගන්නා සුළු මූල්‍යාමය පහසුකම් සහ මිල අඩු නව මාදිලි වැඩි වශයෙන් හඳුන්වාදීම ආදිය හේතුවෙන් යතුරු පැදි සකස් කිරීමේ කර්මාන්තයෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය. ඉදිකිරීම් කර්මාන්තයෙහි ප්‍රසාරණයත් සමඟ කේබල්, විදුලි බුබුළු සහ විදුලි උපාංග සඳහා වූ ඉල්ලුම ද ඉහළ ගියේය.

**2.7 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභය(අ)**

| | කාණ්ඩයන් | මුළු නිෂ්පාදන පිරිවැය (රු. දශ ලක්ෂ) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු. දශ ලක්ෂ) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|---|
| | | 2004(ආ) | 2005(ඇ) | 2004(ආ) | 2005(ඇ) | 2004(ආ) | 2005(ඇ) |
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 77,174 | 86,052 | 90,275 | 100,950 | 14.5 | 14.8 |
| 2. | රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 21,770 | 22,662 | 24,788 | 25,902 | 12.2 | 12.5 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 1,551 | 1,704 | 1,750 | 1,935 | 11.4 | 11.9 |
| 4 | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 4,605 | 5,227 | 5,222 | 5,950 | 11.8 | 12.2 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 29,798 | 36,400 | 35,100 | 42,975 | 15.1 | 15.3 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 19,137 | 22,410 | 22,465 | 26,461 | 14.8 | 15.3 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 2,178 | 2,538 | 2,533 | 2,955 | 14.0 | 14.1 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 12,341 | 13,871 | 14,203 | 16,030 | 13.1 | 13.5 |
| 9 | කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 3,040 | 3,428 | 3,431 | 3,878 | 11.4 | 11.6 |
| | **එකතුව** | **171,594** | **194,292** | **199,768** | **227,036** | **14.1** | **14.4** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 490 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

ග්‍රාමීය ප්‍රදේශ සඳහා විදුලි බලය ලබාදීමේ වැඩ සටහන් පුළුල්වීම විද්‍යුත් උපකරණ භාවිතය සඳහා වූ ඉල්ලුම ඉහළ යාමට උපකාරී විය.

- **2004 දී රාජ්‍ය අංශයේ කර්මාන්තයන් අත්කරගත් සියයට 5.1 ක වර්ධනය හා සැසඳීමේදී එය 2005 වසරේදී මූර්ත වශයෙන් සියයට 6.2 කින් පහත වැටිණි**. රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුම පහළයාමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, නඩත්තුකිරීම් කටයුතු සඳහා 2005 වසරේදී මාසයක පමණ කාලයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදු කිරීමේ කටයුතු නවතා දැමීම වේ. රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙන් සියයට 90 කට වඩා දයකවන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිමැවුම 2005 දී සියයට 6.9 කින් පහත වැටිණි. සුනාමි ව්‍යසනය හේතුවෙන් ලුණු ලේවායන් ආශ්‍රිතව සිදු වූ අලාභහානි හේතුකොටගෙන සීමාසහිත ලංකා ලුණු කර්මාන්තශාලාවෙහි නිමැවුම සියයට 17.8 කින් පහළ ගියේය. කම්කරු නොසන්සුන්තාවල ප්‍රතිඵලයක් ලෙස 2005 දී සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තශාලාවෙහි නිමැවුම සියයට 18.9 කින් පහත වැටිණ. දේශීය කෘෂිකාර්මික සහ වතුවගා අංශයන්හි පොහොර සඳහා වූ ඉල්ලුම ඉහළයාම නිසා සීමාසහිත ලංකා පොස්පේට් සමාගමෙහි නිමැවුම සියයට 2.9 කින් ඉහළ නැගුණි.

- **ආයෝජන මණ්ඩලය යටතට නොගැනෙන කම්හල් කර්මාන්ත සම්බන්ධයෙන් නිෂ්පාදන කර්මාන්තශාලවෙන් පිටවන විට පැවති වටිනාකම් අනුව ගණනය කළ ලාභ අනුපාතිකය 2005 දී සියයට 14.4 දක්වා සියයට 2.1 කින් වර්ධනය විය**. 2005 කාර්මික සමීක්ෂණයට අනුව ආයෝජන මණ්ඩලයට අයත් නොවන කම්හල් කර්මාන්ත 490 ක මුළු නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂව, නිෂ්පාදන කර්මාන්තශාලවෙන් පිටවන විට පැවති වටිනාකමේ අතිරික්තය පදනම් කරගෙන කම්හල් කර්මාන්ත අංශයේ ලාභ අනුපාතිකය ඇස්තමේන්තු කර ඇත. දේශීය ඉල්ලුම ප්‍රසාරණය වීම සහ නිෂ්පාදකයින් විසින් අනුගමනය කළ කාර්යක්ෂම මිල නියම කිරීමේ ප්‍රතිපත්තීන් 2005 දී කර්මාන්තයන්හි ලාභදයිතාව වර්ධනය වීමට හේතු විය. පහළ පොලී අනුපාතිකයක් පැවතීම, අපතේ යාම් අවම කිරීම, මනා කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ අමු ද්‍රව්‍ය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව උපයෝජනය කිරීම ආදිය නිෂ්පාදන පිරිවැය අඩුකර ලීමට උපකාරී විය. සුනාමි ව්‍යසනය හේතුවෙන් රුපියලෙහි ඇති වූ ක්ෂණික අධි ප්‍රමාණයවීම අපනයනාභිමුඛ සහ ආනයන ආදේශන කර්මාන්තයන්හි ලාභදයිතාව කෙරෙහි අහිතතකර ලෙස බලපෑ නමුදු එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ස්ථාවරව පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස ආනයනික අමු ද්‍රව්‍යවල පිරිවැය ඉහළයාම සීමා විය. කිරිපිටි නිෂ්පාදන, තිරිඟු පිටි නිෂ්පාදන, ඇහළුම් සහ කඩදසි හා කඩදසි නිෂ්පාදන ආදී කාර්මික නිෂ්පාදිතයන්හි ආනයනික අමු ද්‍රව්‍ය ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවැතිණි.

- **සේවක සංඛ්‍යාව වැඩිවීම සහ වැටුප් අනුපාතිකයන්හි ඉහළ යාම හේතුවෙන් කම්හල් කර්මාන්ත අංශයේ වැටුප් පිරිවැය 2005 දී සියයට 16 කින් වර්ධනය විය**. සමස්ත වැටුප් පිරිවැය අඩුකර ගැනීම පිණිස බොහෝ නිෂ්පාදන ආයතන විසින් ඉහළ පිරිවැයක් සහිත නිෂ්පාදන ඒකකයන් බාහිර ආයතනවලට පවරාදීම මෙන්ම කාර්ය සාධනය මත පදනම් වූ වැටුප් වර්ධක හඳුන්වා දීම ද සිදුකරන ලදී. සේවකයින් මනා ලෙස සේවයෙහි නියුක්ත කිරීම තුළින් අතිකාල දීමනා අඩුකර ගැනීම සමස්ත වැටුප් පිරිවැය අවම කර ගැනීම සඳහා උපකාරි විය. ඛනිජ තෙල් මිල ගණන් ඉහළ නැංවීම හේතුකොටගෙන මුළු නිෂ්පාදන පිරිවැයෙහි බලශක්ති සඳහා වූ පිරිවැය 2004 දී පැවති සියයට

**2.8 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය(අ)**
**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| | කාණ්ඩයන් | දේශීය පිරිවැය (ප්‍රතිශතයන්) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමුද්‍රව්‍ය | | පොලිය | |
| | | 2004 | 2005 | 2004 | 2005 | 2004 | 2005 | 2004 | 2005 |
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 3.3 | 3.2 | 9.7 | 10.2 | 37.8 | 39.8 | 1.5 | 1.1 |
| 2. | රෙදිපිළි, ඇහළුම් සහ සම් නිෂ්පාදිත | 4.2 | 4.4 | 14.6 | 15.1 | 13.2 | 13.0 | 2.4 | 2.2 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 8.9 | 9.2 | 15.8 | 16.4 | 33.1 | 32.8 | 4.0 | 4.2 |
| 4 | කඩදසි සහ කඩදසි නිෂ්පාදිත | 3.4 | 3.9 | 12.9 | 13.1 | 18.2 | 19.1 | 3.7 | 3.6 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 5.9 | 6.0 | 12.3 | 13.0 | 29.2 | 29.8 | 3.2 | 3.4 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 18.9 | 19.3 | 15.2 | 14.9 | 28.4 | 28.9 | 2.3 | 2.9 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 9.9 | 9.7 | 11.1 | 11.2 | 35.0 | 35.8 | 3.2 | 2.5 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 4.5 | 4.9 | 11.3 | 12.1 | 26.2 | 27.0 | 3.3 | 3.9 |
| 9 | කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4.9 | 5.3 | 12.1 | 11.9 | 34.1 | 34.8 | 1.8 | 1.5 |
| | **එකතුව** | **5.9** | **6.0** | **11.7** | **12.0** | **30.7** | **31.4** | **2.2** | **2.2** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 490 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### 2.9 සංඛ්‍යා සටහන
### ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායිතා දර්ශකය(අ)

1995 = 100

| | කාණ්ඩයන් | 2004 | 2005 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 129.4 | 132.5 | 2.4 |
| 2 | රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 109.5 | 113.2 | 3.4 |
| 3 | දව හා දව නිෂ්පාදිත | 100.7 | 103.1 | 2.3 |
| 4 | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 101.4 | 103.7 | 2.3 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 134.7 | 139.5 | 3.6 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 112.0 | 114.5 | 2.2 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 100.9 | 103.0 | 2.1 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 120.0 | 123.8 | 3.2 |
| 9 | කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 107.9 | 110.7 | 2.6 |
| | **එකතුව** | **116.3** | **119.7** | **2.9** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 490 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

5.9 සිට 2005 දී සියයට 6.0 දක්වා ඉහළ ගියේය. සිමෙන්ති සහ පිහන් කර්මාන්තයන්හි නිෂ්පාදන පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් බලශක්ති පිරිවැයෙන් සමන්විත වේ. මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස පොලී පිරිවැය සාපේක්ෂ වශයෙන් පෙර වසරේ පැවැති පරිදිම සියයට 2.2 ක මට්ටමක පැවැතිණි.

- **මිනිස් පැයක එකතු කළ අගයෙහි මූර්ත වටිනාකම පදනම් කොටගෙන ඇස්තමේන්තු කර ඇති ශ්‍රම ඵලදායිතාව පෙර වසරේදී වූ සියයට 2.6 ක වර්ධනය හා සසඳන කළ 2005 දී සියයට 2.9 කින් වර්ධනය විය.** විශේෂයෙන් පිහන් භාණ්ඩ, සිමෙන්ති, බේකරි නිෂ්පාදන සහ රබර් අත්වැසුම් ආදි කර්මාන්ත සඳහා තොරතුරු තාක්ෂණය බහුල වශයෙන් යොදා ගැනීම සහ ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන නිෂ්පාදන ක්‍රමයන් ස්ථාපිත කිරීම ශ්‍රම ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා උපකාරී විය. එසේම, මෙහෙයුම් කටයුතු තාර්කීකරණය කිරීමට මෙන්ම මිනිස් ශ්‍රමය වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීම සහ උසස් කළමණාකරන ක්‍රියා පිළිවෙත් සහ නිපුණතා සංවර්ධන වැඩ සටහන් හඳුන්වාදීම සඳහා 2005 වසරේදී නිෂ්පාදකයින් විසින් දැඩි පරිශ්‍රයක් දැරීම ශ්‍රම ඵලදායිතා වර්ධනය සඳහා උපකාරී විය.

- **2004 වර්ෂයේ සියයට 1.3 ක වර්ධනය හා සැසඳීමේදී වතු භෝග සැකසීම් අංශය මෙම වර්ෂය තුළදී එකතු කළ අගය අනුව සියයට 2.7 ක වර්ධනයක් දැක්විය.** තේ සහ රබර් නිෂ්පාදන පරිමාවන් ඉහළ යාම, මෙම වර්ධනය සඳහා මූලිකවම හේතු විය. නමුත් පොල් නිෂ්පාදනය පහළ වැටීමත් සමඟම දිසිදි පොල් සහ පොල් තෙල් නිෂ්පාදනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇතිවිය.

- **පසුගිය වසරේ වූ නොසැලකිය හැකි වර්ධනයට සාපේක්ෂව, කුඩා කර්මාන්ත අංශය මෙම වසර තුළදී සියයට 9.8 ක වර්ධනයක් වාර්තා කළේය.** කෘෂිකාර්මික අංශයේ සතුටුදායක ක්‍රියාකාරීත්වය මගින් කුඩා කර්මාන්ත අංශයට වර්ධන ගාමකත්වය සපයන ලදී. වාර්තාගත වී අස්වනු සහ අතුරු ආහාර භෝග වගාවන්හි වර්ධනයන් හේතුවෙන්, වී සැකසීම් මෙන්ම අනෙකුත් ධාන්‍ය වර්ග සැකසීම් සහ ඇඹරුම් කටයුතුවල ඉහළයාමක් පෙන්නුම් කළේය. වසරේ මුල් භාගය තුළ පොල් නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් කුඩා පරිමාණ කොහු කෙඳි, පොල් කටු සහ කොප්පරා ආශ්‍රිත නිෂ්පාදන පහත වැටුණි. ඉදිකිරීම් අංශයෙහි අඛණ්ඩ වර්ධනයත් සමඟ දව කර්මාන්තය, කළු ගල් නිෂ්පාදනය සහ පිහන් ගඩොල්, ගඩොල්, සිමෙන්ති ගල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනයන්හි එකතු කළ අගය සැලකිය යුතු ලෙස වැඩි විය. තවද, පිළියෙල කළ ආහාර වර්ග, රෙදිපිළි, පාවහන් සහ ආභරණ නිෂ්පාදනය ආශ්‍රිත කුඩා කර්මාන්ත, ඒක පුද්ගල ආදායම් ඉහළ යාමට අනුකූලව, මධ්‍යස්ථ වර්ධනයක් දැක්වීය.

- **ඉදිකිරීම් අංශය පසුගිය වර්ෂයේ සියයට 6.6 ක වර්ධනය මත, මෙම වර්ෂය තුළදී ද තවදුරටත් සියයට 8.9 කින් වර්ධනය විය.** සුනාමිය මගින් විනාශ වූ නිවාස සහ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2005 වර්ෂය තුළදී නොයෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මීට තාවකාලික වාසස්ථාන මෙන්ම, ස්ථිර වාසස්ථාන ඉදිකිරීම් කටයුතු සහ දුම්රිය මාර්ග සහ මාර්ග සංවර්ධන වැනි අනෙකුත් යටිතල පහසුකම් ව්‍යාපෘතීන්ද අයත් වේ. 2005 වර්ෂය තුළදී මාර්ග සංවර්ධන, ජල සැපයුම්, සනීපාරක්ෂක සහ වාරිමාර්ග ඉදිකිරීම් කටයුතු වැනි විදේශාධාර සහිත ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක විය. ඉදිකිරීම් අංශයෙහි මෙම වර්ධනය, සිමෙන්ති ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍යවල ඉහළ අපනයන පරිමා සහ දේශීය නිෂ්පාදනයෙහි ඉහළයාම තුළින් ද පිළිබිඹු වේ. සිමෙන්ති විකුණුම්, වසරේ මුල් භාගය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, දෙවන භාගය තුළදී පළමු භාගයටත් වඩා වැඩි වේගයකින් වර්ධනය විය. මෙම වර්ෂය තුළ බොහොමයක් ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉදිකිරීම්, පුහුණුකිරීම් සහ සංවර්ධන ආයතනයට (ICTAD) අනුව, 2004 වර්ෂයට සාපේක්ෂව, සමස්ත මිල ගණන් සියයට 14 කින් ඉහළ ගොස් ඇත.

- **විදුලිය සහ ජලය අංශය පසුගිය වර්ෂයේ සියයට 2.5 ක සංකෝචනය හා සැසඳීමේදී 2005 වර්ෂය තුළ සියයට 23.3 කින් ප්‍රසාරණය විය.** 2005 වර්ෂය තුළ විදුලිය උත්පාදනය, ගෘහස්ථ, වාණිජ සහ කර්මාන්ත අංශයන්හි ඉහළ ඉල්ලුම සමග ඉහළ ගියේය. ජල විදුලි උත්පාදනය සහ තාප විදුලි උත්පාදනය යන දෙඅංශයම පිළිවෙලින් සියයට 16.7 කින් සහ සියයට 4.6 කින් ඉහළයාම හේතුවෙන් විදුලිය උත්පාදනය ප්‍රසාරණය විය. සමස්ත

**විශේෂ සටහන 6**

## පශ්චාත් සුනාමි යථා තත්ත්වයට පත්කිරීමේ හා යළි ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය

2004 දෙසැම්බර් මස 26 වන දින ඇති වූ සුනාමිය මිනිස් ජීවිත 35,322 ක් අහිමි වීමට, පුද්ගලයින් 21,441 ක් තුවාල ලැබීමට, 500,000 ක් පමණ පිරිසක් අවතැන් වීමට හා ළමුන් 1500 කට දෙමාපියන් අහිමිවීමට[1] හේතු විය. එමෙන්ම එය භෞතික දේපොළ සහ යටිතල පහසුකම් වලට විශාල හානියක් සිදු කිරීමටත්, ජීවිකා වෘත්තීන් අහිමි කිරීමටත් හේතු විය. සාමාන්‍ය ජනතාවගේ, රජයේ, පෞද්ගලික අංශයේ, ද්වි පාර්ශ්වීය හා බහු පාර්ශ්වීය ආධාර සපයන්නන්ගේ සහ දේශීය සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ද ඇතිව ක්ෂණික සහන හා බේරාගැනීමේ මෙහෙයුම් සාර්ථකව සිදු කරන ලදී. සුනාමි බලපෑම් ඇති වූ පවුල්වලට සහන සැලසීම සඳහා 2005 දී රජය රුපියල් බිලියන 12 ක් වැය කර ඇත. යථා තත්ත්වයට පත් කිරීම හා යළි ඉදිකිරීම් කටයුතු සඳහා වසර 3-5 අතර කාලයක් ගතවනු ඇතැයි ද ඒ සඳහා එ.ජ.ඩොලර් බිලියන 2.2 ක් වැය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. යථා තත්ත්වයට පත් කිරීම හා යළි ඉදිකිරීම් කටයුතු සඳහා එ.ජ.ඩොලර් බිලියන 2.8 ක් සහ ණය සහන (මුල් මුදල හා පොළී ගෙවීම්) වශයෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 258.6 ක් (රුපියල් බිලියන 26.3 ක්) ලබාදීමට ආධාර සපයන ජාත්‍යන්තර ප්‍රජාව පොරොන්දු වී ඇත.

පශ්චාත් සුනාමි යථා තත්ත්වයට පත් කිරීම හා යළි ඉදිකිරීම් කටයුතු ප්‍රධාන වැඩ සටහන් 4 ක් යටතේ ක්‍රියාත්මක වේ; (i) නිවාස ඉදි කිරීම, (ii) ජීවනෝපාය මාර්ග ප්‍රතිෂ්ඨාපනය කිරීම (iii) සෞඛ්‍ය, අධ්‍යාපනය හා ආරක්ෂාව සැලසීම සහ (iv) ජාතික යටිතල පහසුකම් ගොඩ නැගීම.

**නිවාස ඉදිකිරීම**

මුළු නිවාස අවශ්‍යතාව 87,525 ක් වන අතර ඉන් නිවාස 32,000 ක් ආධාර සපයන්නන් විසින් නිවාස ඉදිකිරීමේ වැඩ සටහන යටතේ ඉදිකිරීමටත්, ඉතිරි නිවාස 55,525 නිවාස හිමිකරුවන් විසින්ම ඉදිකිරීමේ වැඩ සටහන යටතේ ඉදි කිරීමටත් නියමිතය. ප්‍රථම වැඩ සටහන යටතේ නිවාස ඒකක 29,640 ක් ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති අතර ඉන් ඒකක 10,707 ක් 2005 අවසානයේදී ඉදි කෙරෙමින් පැවතිණ. දෙවන වැඩ සටහන යටතේ සම්පූර්ණයෙන් විනාශ වූ නිවසකට රු. 250,000 බැගින් ද අර්ධ වශයෙන් හානියට පත් වූ නිවසකට රු.100,000 බැගින් ද ලබාදීමට රජය විසින් රුපියල් බිලියන 3.6 ක් 2005 දී වැය කර ඇත.

**ජීවනෝපායමාර්ග ප්‍රතිෂ්ඨාපනය**

ඇස්තමේන්තුවල දක්වෙන ආකාරයට සුනාමිය හේතුවෙන් සේවා නියුක්තික ඉඩ ප්‍රස්ථා 150,000 ක් පමණ අහිමි වූ අතර ඉන් සියයට 50 ක් පමණ ධීවර කර්මාන්ත අංශයේද, සියයට 45 ක් සංචාරක, සුළු ව්‍යාපාර සහ වෙළෙඳම් හා ස්වයං රැකියා ඇතුළුව සේවා අංශයේද, ඉතිරි සියයට 5 කෘෂිකාර්මික අංශයේ ද විය. මුල් අදියරේ දී, මසකට එක් කුටුම්බයක් සඳහා රු. 5,000 ක මූල්‍යාධාරයක් හා සතියකට එක් පුද්ගලයෙකුට රුපියල් 375 ක් වටිනා ආහාර සලාකයක් ලබා දීමට රජය විසින් කටයුතු සම්පාදනය කරන ලදී.

සුනාමි බලපෑම් ඇති වූ ප්‍රදේශවල ජීවනෝපායමාර්ග නැවත ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික සංවර්ධන භාරකාර අරමුදල, වාණිජ බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන විසින් විවිධ මූල්‍යකරණ යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී. සුසහන ණය යෝජනා ක්‍රමය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව 2005 අවසානයේ දී ව්‍යාපෘතීන් 8,000 ක් වෙනුවෙන් රුපියල් බිලියන 3.6 ක් මූල්‍ය ආයතන හරහා ප්‍රදානය කර ඇත. ජාතික සංවර්ධන භාරකාර අරමුදල ණය ව්‍යාපෘති 5,570 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 700 ක් ප්‍රදානය කර ඇත. සුනාමි හේතුවෙන් විනාශ වූ හෝ හානියට පත් වූ ධීවර යාත්‍රා 24,185 න් සියයට 90 ක්ම 2005 අවසානය වනවිට ප්‍රතිෂ්ඨාපනය කර ඇත. සංචාරක ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත්වීම ද බොහෝ පුද්ගලයන්ගේ ජීවනෝපායමාර්ග යළි උත්පාදනය කිරීමට උපකාරී විය. බලපෑමට ලක් වූ සේවා වියුක්තිකයින්ගෙන් සියයට 70-80 පමණ ප්‍රමාණයකට 2005 අවසානය වන විට සිය ප්‍රධාන ආදායම් මාර්ගවල නැවත නියැලීමට හැකියාව ලැබිණි.

**සෞඛ්‍ය, අධ්‍යාපනය හා ආරක්ෂාව සැලසීම**

සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන 97 ක් සුනාමිය හේතුවෙන් විනාශයට පත් විය. මෙම සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන යළි ඉදිකිරීම, අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් ලබාදීම, සෞඛ්‍ය කාර්යය මණ්ඩල ඒකරාශිකරණය, රෝග නිවාරණය සහ මානසික සෞඛ්‍ය ගැටලු සඳහා පිළියම් යෙදීම යනාදිය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛත්වය හිමි වූ අංශ විය. සෞඛ්‍ය අධිකාරීන් විසින් සුනාමි ඇති වූ ප්‍රදේශ වලට ඉතා ඉක්මනින් රෝග නිවාරණ ක්‍රියා මාර්ග හඳුන්වා දීම නිසා ජලාශ්‍රිත රෝගාබාධ පැතිරීමක් හෝ අනෙකුත් බෝවන රෝගවල වාර්තාවීමක් සිදු නොවිණි. හානියට පත් වූ සියලුම සෞඛ්‍ය ආයතන පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර ලබාදෙන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත. 2005 අවසානය වනවිට මාතෘ හා ළමා සායන 10 ක් හා මධ්‍යම බෙහෙත් ශාලාවක් ඉදි කිරීමේ කටයුතු අවසන්

1. ශ්‍රී ලංකා : පශ්චාත් සුනාමි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ, ශ්‍රී ලංකා රජයේ හා සංවර්ධිත හවුල්කරුවන්ගේ ඒකාබද්ධ වාර්තාව (2005 දෙසැම්බර්)

කර ඇත. අදාළ දිස්ත්‍රික්කවල සිටින ප්‍රජා සහාය නිලධාරීන් 500 කට අධික ප්‍රමාණයක් මානසික සෞඛ්‍ය අවශ්‍යතා සඳහා පිළියම් යෙදීමට පුහුණු කරන ලදී.

සුනාමිය හේතුවෙන් අධ්‍යාපනික අංශය තුළ, සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හානියට පත් වූ පාසල් ගණන 182 ක් වන අතර එය සිසුන් 100,000 කට පමණ සෘජුවම බලපෑම් ඇති කළේය. මීට අමතරව කඳවුරු ලෙස පාසැල් 446 ක් යොදා ගැනීම නිසා තවත් සිසුන් 100,000 කගේ අධ්‍යාපන කටයුතුවලට බාධා සිදු විය. ළමුන්ට හිතකර සම්මත සැළසුම්වලට අනුව පාසල් 180 ක් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට ආධාර ලබාදෙන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්වලට අත්සන් කර ඇත. මින් පාසල් 18 ක් ඉදිකිරීමේ කටයුතු 2005 දී ආරම්භ කර තිබිණි. හානියට පත් වූ පාසල්වලින් සියයට 75 කට වඩා වැඩි ප්‍රමාණයක ඉදිකිරීම් කටයුතු 2006 අවසානයේ දී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව සහ ජාතික ළමාරක්ෂක අධිකාරිය, එක්සත් ජාතීන්ගේ සංගමයේ අදාළ නියෝජිත ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වී ළමා ආරක්ෂණය සඳහා ක්‍රියා මාර්ග ගෙන ඇත. සුනාමි බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින්ට ජාතික හැඳුනුම්පත්, උප්පැන්න සහතික හා විවාහ සහතික ආදි ලියකියවිලි හා ඒවායේ සහතික කරන ලද පිටපත් ලබාදීම සඳහා නීති සායන කිහිපයක් පවත්වන ලදී.

**ජාතික යටිතල පහසුකම් ගොඩනැගීම**

මහා මාර්ග, දුම්රිය මාර්ග, විදුලි බලය, ජල සැපයුම හා වරාය යටිතල පහසුකම් යනාදිය සුනාමිය නිසා හානියට පත් වූ ප්‍රධාන අංශ වේ. කිලෝ මීටර 800 ක පමණ ජාතික මාර්ග හා කිලෝ මීටර 1,500 ක පමණ ප්‍රාදේශීය හා ග්‍රාමීය මාර්ග හානියට පත් විය. ඒ සඳහා පුනරුත්ථාපන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 356 ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කර ඇති අතර හානියට පත් කළුතර-මාතර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2005 ඔක්තෝබර් මස ඇරඹිණි.

සුනාමිය නිසා ශ්‍රී ලංකා දුම්රිය සේවයට සිදු වූ හානියෙහි පිරිවැය රුපියල් දශ ලක්ෂ 1,485 ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. මුහුදුබඩ දුම්රිය සේවාවන් 2005 පෙබරවාරි මස නැවත ආරම්භ කරන ලදී. හානියට පත් වූ විදුලිය බෙදාහැරීමේ ජාලය සහ ඒ හා සම්බන්ධ අනෙකුත් යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම ද අවසන් කර ඇත. ජල සැපයුම් යටිතල පහසුකම් පුනරුත්ථාපන හා ඒවායේ දියුණුව සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 201 ක් වූ අතර ඒ සඳහා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 165 ක ආධාර ලැබී ඇත. ගාල්ල, ත්‍රිකුණාමලය, කන්කසන්තුරේ හා පේදුරුතුඩුව වරායන්හි අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු ද සම්පූර්ණ කර ඇත.

ඇතැම් අංශයන් හි පුනරුත්ථාපන කටයුතුවල මන්දගාමී ස්වරූපයක් තිබුණ ද ශ්‍රී ලංකාව සමස්ථයක් වශයෙන් පශ්චාත් සුනාමි යථා තත්ත්වයට පත්කිරීම හා යළි ඉදිකිරීම් කටයුතුවල සැළකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. ආර්ථිකය මත විශාල බලපෑමක් ඇති කළ ධීවර හා සංචාරක අංශ අපේක්ෂිත වේගයට වඩා වැඩි වේගයකින් යථා තත්ත්වයට පත් වෙමින් පවතී. 2005 දී මුළු රාජ්‍ය වියදම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 1.6 කින් වර්ධනය වූ අතර එය සහනදායි විදේශ ආධාර හා ණය ආපසු ගෙවීමේ සහන යටතේ වූ තාවකාලික ඉතිරිකිරීම් මගින් මූල්‍යනය කරන ලදී. 2005 ආරම්භයේදී අපේක්ෂා කළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 205 ක හිඟයට ප්‍රතිවිරුද්ධව සුනාමි ආධාර හේතුවෙන් ගෙවුම් තුලනයෙහි එ.ජ.ඩොලර් දශ ලක්ෂ 501 ක අතිරික්තයක් වාර්තා කළේය.

විදුලිය උත්පාදනයෙන් සියයට 61 ක පමණ ප්‍රමාණයක් තාප විදුලි බලය මගින් සපුරාලන ලදී. 2004 වර්ෂයේ සියයට 63 ක දයකත්වයක් දක් වූ තාප විදුලි බලයෙහි මෙම අඩුවීම කෙරෙහි මෙම වසරේ අවසාන කාර්තුව තුළ ජල විදුලිය උත්පාදනයෙහි ඉහළ යාම හේතු විනි. ජල විදුලි බල උත්පාදනය ඉහළයාම සහ ලංකා විදුලි බල මණ්ඩලය මගින් කුලියට ගනු ලබන වැඩි වියදම් තාප විදුලි බලයෙහි සිට පෞද්ගලික අංශයෙහි අඩු වියදම් තාප විදුලි බලය කෙරෙහි සංක්‍රමණය වීම හේතුවෙන් විදුලිය උප අංශයෙහි එකතු කළ අගය සියයට 26.3 කින් ඉහළ ගියේය. හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙහි ජල විදුලි බල උත්පාදනය සියයට 15.2 කින් වැඩ වූ අතර, තාප විදුලි බල උත්පාදනය සියයට 13.8 කින් අඩු විය. තවද, පෞද්ගලික අංශයෙහි ජල සහ තාප විදුලි බල උත්පාදනය පිළිවෙලින් සියයට 36.1 කින් සහ සියයට 47.3 කින් වර්ධනය විය. 2004 වර්ෂයේදී සියයට 34.5 ක් වූ පෞද්ගලික අංශයෙහි විදුලිබල උත්පාදක දයකත්වය, මෙම වර්ෂය තුළදී සියයට 39.1 දක්වා ඉහළ ගියේය. 2005 වර්ෂය තුළදී නළ ජලය බෙද හැරීම සියයට 3.8 කින් ප්‍රසාරණය වූ අතර, මෙම වර්ෂයේ මාර්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි ගෘහස්ථ සහ ගෘහස්ථ නොවන පාරිභෝගිකයන් සඳහා ජල ගාස්තු ඉහළට සංශෝධනය කරන ලදී.

- **පතල් සහ කැනීම් අංශය. පසුගිය වර්ෂයේ සියයට 7.9 ක වර්ධනය හා සැසඳීමේදී මෙම වසර තුළ එකතු කළ අගය අනුව සියයට 14.1 කින් වර්ධනය විය.** 2005 වසර තුළදී මැණික් හා අනෙකුත් පතල් කටයුතුවල සතුටුදයක ක්‍රියාකාරීත්වය හේතුවෙන්

පතල් උප අංශය සියයට 28 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. පරිමා ඒකක අනුව සැළකූ විට මැණික් අපනයනයන් සියයට 20.2 කින් ඉහළ ගිය අතර, ඛනිජ වැලි සහ පොස්පේට් නිෂ්පාදනය ඉහළයාම හේතුවෙන් අනෙකුත් පතල් කටයුතු සියයට 77.9 කින් වැඩි විය. මිනිරන් නිෂ්පාදනය පහළ වැටුණු නමුත් අපනයන වෙළෙඳපොළ සඳහා ගුණාත්මක මට්ටමින් ඉහළ මිනිරන් නිෂ්පාදනය හේතුවෙන් මෙහි එකතු කළ අගය ඉහළ ගියේය. ඉදිකිරීම් අංශයෙහි ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් කැනීම් උප අංශය සියයට 8.9 ක වර්ධනයක් වාර්තා කළේය.

**සේවා**

- **සේවා අංශය, ආර්ථිකය තුළ එහි සාපේක්ෂ වැදගත්කම පවත්වා ගනිමින්, සමස්ත ආර්ථික වර්ධනයට වැඩි වශයෙන් දායක විය.** පසුගිය වසර කිහිපය තුළදී සේවා අංශයේ බොහොමයක් උප අංශවල පැවති ස්ථායී හා යහපත් වර්ධනය අනෙකුත් ප්‍රධාන අංශ දෙක වන කෘෂිකාර්මික හා කාර්මික අංශයන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායකත්වය වැඩිවීමට ඉඩකඩ ඇති පරිසරයක් එම අංශ හා සම්බන්ධ වන සන්නිවේදන, මූල්‍ය සේවා හා වෙනත් ව්‍යාපාරික සේවාවල වර්ධනය තුළින් සපයා දෙන ලදී. කෙසේ නමුත් ධාරිතා සීමාවීම් සහ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රසාරණය එහි වර්ධන හැකියාවන්ට වඩා පහළ, යම්තාක් දුරට මධ්‍යස්ථ වර්ධනයකට සීමාකරන ලදී. ප්‍රවාහන අංශයේ මෙම සීමාවන්, දේශීය වෙළෙඳමේ වර්ධන හැකියාවන්ට ද බලපෑවේය. මේ අතර හෝටල් හා ආපනශාලා උප අංශයද සුනාමියේ ප්‍රතිඵලයක් ලෙස සංකෝචනය විය.
- **පසුගිය වර්ෂයේදී මෙන් මෙම වර්ෂයේදී ද, සේවා අංශය රටේ ආර්ථික වර්ධනයට ප්‍රධාන ගාමකත්වයක් සපයන ලදී.** 2005 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතයට සේවා අංශයේ දායකත්වය සියයට 56 ක් වූ අතර, දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට එය සියයට 59 කින් දායක විය. සේවා අංශය, 2004 වර්ෂයේදී වූ සියයට 7.6 ක වර්ධනය හා සැසඳීමේදී 2005 වර්ෂය තුළදී සියයට 6.4 ක වර්ධනයක් වාර්තා කළේය. තොග සහ සිල්ලර වෙළෙඳම සහ හෝටල් සහ ආපනශාලා අංශයේ අඩු වර්ධනය, මෙම මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය.
- **තොග හා සිල්ලර වෙළෙඳම සහ හෝටල් හා ආපනශාලා අංශය, පසුගිය වර්ෂයේ වූ සියයට 6.1 ක වර්ධනයට සාපේක්ෂව, 2005 වර්ෂය තුළදී සියයට 2.6 ක වර්ධනයක් වාර්තා කළේය.** මෙම මන්දගාමීත්වයට හේතුවූයේ ආනයන වෙළෙඳමේ අඩු වර්ධනය සහ හෝටල් සහ ආපනශාලා උප අංශයේ පැවති පසුබෑමයි.
- **පසුගිය වර්ෂයේ වූ සියයට 9 ක වර්ධනය හා සැසඳීමේදී, ආනයන වෙළෙඳම 2005 වර්ෂය තුළදී සියයට 2.3 කින් පමණ වර්ධනය විය.** පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන ප්‍රධාන ආනයන කාණ්ඩ තුනෙහිම මෙම මන්දගාමීත්වය දක්නට ලැබුණි. පරිමා ඒකකයන්ට අනුව ආයෝජන භාණ්ඩ ආනයන 2004 වර්ෂයේදී වූ සියයට 18.4 ක වර්ධනයට සාපේක්ෂව, 2005 වර්ෂය තුළදී සියයට 4.2 කින් පමණ වර්ධනය විය. මෙම කාණ්ඩය තුළ ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ සහ වෙනත් ආයෝජන භාණ්ඩ ආනයන ඉහළ ගිය අතර, යන්ත්‍ර හා උපකරණ ආනයනයන් ආන්තික වශයෙන් පහළ ගියේය. අන්තර් භාණ්ඩ ආනයන පරිමාවන් 2004 වර්ෂයේදී වූ සියයට 6.6 ක වර්ධනයට සාපේක්ෂව පොහොර ආනයන හා ඇඟළුම් කර්මාන්තය සඳහා වූ ආනයනයන්ගේ වර්ධනය හේතුවෙන් සියයට 2.7 කින් වර්ධනය විය. පාරිභෝගික භාණ්ඩ ආනයනයන් පසුගිය වසරේ වූ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.9 කින් පමණ ඉහළ ගියේය. පාරිභෝගික භාණ්ඩ ආනයනයන් අතුරින් සහල් වර්ග වැනි මූලික ආහාර ද්‍රව්‍ය ආනයනයන්, දේශීය නිෂ්පාදන ඉහළයාම හේතුවෙන් පහළ ගියේය. ප්‍රධාන වශයෙන් මෝටර් රථ, බෙහෙත් වර්ග හා ගෘහ උපකරණ අඩංගු වන වෙනත් පාරිභෝගික භාණ්ඩ ආනයනයන් 2004 වර්ෂයේ වූ සියයට 8.5 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 2.3 කින් පමණ වර්ධනය විය.
- **අපනයන වෙළෙඳ උප අංශය 2005 වර්ෂය තුළදී සියයට 6.9 කින් ප්‍රසාරණය විය.** බහු කෙඳි ගිවිසුම අහෝසි වී තිබියදීත්, කාර්මික අපනයන ඉපැයීම් වලින් සියයට 58 කට පමණ දායක වන රෙදිපිළි හා ඇඟළුම් අංශය සියයට 5.3 කින් වර්ධනය විය. මේ අතර ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හැර, අනෙකුත් සියලු කාර්මික අපනයනයන් කාණ්ඩය යහපත් ක්‍රියාකාරීත්වයෙන් යුතුව සියයට 11.5 කින් වර්ධනය විය. තේ අපනයනයේ මධ්‍යස්ථ වර්ධනය හා සුළු කෘෂිකාර්මික අපනයනයන්හි ඉහළ වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනයන් සියයට 2.9 කින් වර්ධනය විය. වර්ෂය තුළදී පොල් නිෂ්පාදනය සියයට 2.9 කින් සංකෝචනය වීම හේතුවෙන් පොල් නිෂ්පාදන අපනයනයන් සියයට 9.3 කින් පමණ පහත වැටුණි. රබර් නිෂ්පාදනය සියයට 10.2 කින් පමණ ඉහළ ගිය නමුත් දේශීය රබර් පදනම් වූ කර්මාන්තයන්ගේ අධික හා ඉහළයමින් පවතින ඉල්ලුම, ප්‍රාථමික තත්ත්වයේ රබර්වල අපනයනයන් ඉහළයාම වළක්වාලීය. මේ නිසා වූ ඉහළ එකතු කළ අගය හේතුවෙන් පවත්නා මිලගණන් අනුව රබර් පදනම් වූ අපනයන ආදායම සියයට 37 කින් වර්ෂය තුළදී වර්ධනය විය.
- **දේශීය නිෂ්පාදිත, දේශීය වෙළෙඳපොලේ අලෙවි කිරීම් ලෙස අර්ථ දක්වනු ලබන දේශීය වෙළෙඳ උප අංශය, පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 2.0 ක වර්ධනයට සාපේක්ෂව 2005 දී සියයට 4.2 කින් වර්ධනය විය.** මෙම වර්ධනය දේශීය කෘෂිකර්මාන්තය, විශේෂයෙන්ම වී නිෂ්පාදනය, එළවළු, අතිරේක ආහාර භෝග හා සුළු අපනයන භෝගවල යහපත් ක්‍රියාකාරීත්වය මගින්

උත්තේජනය විය. දේශීය වෙළෙඳමේ මෙම යහපත් වර්ධනයට නිමැවුම් කර්මාන්ත හා කුඩා කර්මාන්තවල සතුටුදායක ක්‍රියාකාරීත්වය දායක විය.

- **සංචාරකයන්ගේ පැමිණීම සියයට 3 කින් පමණ අඩුවීමත් සමග හෝටල් හා ආපනශාලා උප අංශය සියයට 29.0 ක පහත වැටීමක් වාර්තා කළේය.** දකුණු හා නැගෙනහිර වෙරළ තීරය තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 46 ක් (කාමර 14,350 න් 4,000 ක් පමණ) සුනාමි උවදුරෙන් විනාශ විය. අර්ධ වශයෙන් හානි වූ හෝටල් බොහොමයක් වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණය කරන ලදී. සංචාරකයන්ගේ පැමිණීම පසුගිය වර්ෂයේදී වූ 566,202 හා සැසඳීමේදී 2005 වර්ෂයේදී 549,308 ක් විය. බටහිර යුරෝපයෙන් සංචාරකයන්ගේ පැමිණීම තදින් පහත වැටුණ ද, ආසියාව (සියයට 12.8 කින්) උතුරු ඇමරිකාව හා ඕස්ට්‍රේලියාව යන කලාප වලින් වූ ඉහළ සංචාරක පැමිණීම මෙම පහත වැටීම යම්තාක් දුරකට සමනය කළේය. සංචාරකයන්ගේ පැමිණීම අතින් ගත් කල ඉහළම සංඛ්‍යාව වූ 113,323 ක් ඉන්දියාවෙන් පැමිණි අතර එය 2004 වර්ෂයට සාපේක්ෂව සියයට 8 ක වර්ධනයක් විය. සංචාරක පැමිණීම අතින් දෙවන ස්ථානය වූ සම්ප්‍රදායිකව වැඩි සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණෙන එක්සත් රාජධානියෙන්, සංචාරක පැමිණීම් 92,629 ක් වාර්තා වූ අතර එය සියයට 13 ක පහත වැටීමක් විය. සංචාරකයන්ගේ පැමිණීම අඩු වූයේ සුළු වශයෙන් වුවද, බොහෝ සංචාරකයින් සාපේක්ෂව අඩු කාලපරිච්ඡේද ගත කරනු ලබන වෙළෙඳ හා සංක්‍රාන්ති සංචාරකයන් වූ බැවින් හෝටල්වල විදේශ සංචාරකයන් ගත කළ රාත්‍රී ගණන 2004 වර්ෂයේදී වාර්තා වූ සියයට 14.4 ක වැඩිවීමේ සිට සියයට 40.1 කින් පහත වැටුණි. මේ අතර සංචාරකයන් සියලු ශ්‍රේණිගත හෝටල්වල ගත කළ රාත්‍රී ගණන සියයට 14.7 කින් පහළ වැටිණි.

- **ප්‍රවාහන, ගබඩා සහ සන්නිවේදන අංශය 2004 වර්ෂයේදී අත්කරගත් සියයට 13.7 ක වර්ධනයට සාපේක්ෂව, 2005 වර්ෂයේදී සියයට 12.7 කින් වර්ධනය විය.** මෙම වර්ධනයට මූලික වශයෙන් හේතු වූයේ අඛණ්ඩව ප්‍රසාරණය වෙමින් පවතින විදුලිසංදේශ අංශයේ වර්ධනයයි.

- **සන්නිවේදන ජාලයන්ගේ ප්‍රසාරණය සහ නව තාක්ෂණික වැඩි දියුණුවත් සමග හඳුන්වාදුන් නව අගය එකතු කළ සේවා සමග වර්ෂය තුළ විදුලි සංදේශ උප අංශය සියයට 27 කින් ප්‍රසාරණය විය.** මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ජංගම දුරකථන භාවිතය ඉහළයාමේ උපනතියත්, නව සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) තාක්ෂණය සහ දුරකථන සේවා සපයන්නන් අතර පවතින මිල තරඟකාරීත්වය සමග රැහැන් රහිත ස්ථාවර දුරකථන ජනප්‍රිය වීමත්ය. සාම්ප්‍රදායික ස්ථිර රැහැන් සහිත දුරකථන ග්‍රාහකයන්ගේ මට්ටම, 2004 වර්ෂය තුළ වූ සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව 2005 වර්ෂය තුළදී ග්‍රාහකයන් 950,000 දක්වා සියයට 11 කින් පමණ ඉහළ ගියේය. රැහැන් රහිත ස්ථාවර දුරකථන ග්‍රාහක මට්ටම, වසර පුරාම ප්‍රසාරණය වෙමින් ආසන්න වශයෙන් ග්‍රාහකයන් 290,000 තෙක් සියයට 122 කින් පමණ වර්ධනයක් වාර්තා කළේය. අන්තර්ජාල (Internet) හා විද්‍යුත් තැපැල (E-mail) භාවිතය, 2004 වර්ෂය තුළදී වූ සියයට 9 ක වර්ධනයට සාපේක්ෂව 2005 වර්ෂය තුළ සියයට 23 ක සැළකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ජංගම දුරකථන භාවිතය සියයට 52 කින් පමණ ඉහළ ගිය අතර, ජංගම දුරකථන ග්‍රාහකයන් සංඛ්‍යාව මිලියන 3.3 ඉක්මවා තිබුණි. එමනිසා 2004 වර්ෂය අවසානයේ සියයට 11 ක් වූ ජංගම දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100 ක් සඳහා ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව) 2005 වර්ෂයේ අවසානයේ සියයට 17 ක් පමණ විය.

- **භාණ්ඩ මෙහෙයවීම් හා ගබඩා කිරීම් උප අංශය, පසුගිය වර්ෂයේ වූ සියයට 12.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 9.8 කින් වර්ධනය විය.** මෙම මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පසුගිය වර්ෂයට සාපේක්ෂව දේශීය බහාලුම් පරිමාවේ අඩු වර්ධනයයි. අදාළ කාලය තුළදී කොළඹ වරාය, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමාගම ද ඇතුළුව අඩි විස්සේ සමාන බහාලුම් ඒකක 2,455,295 මෙහෙයවීය. මෙය සියයට 10.5 ක වැඩිවීමක් හා කොළඹ වරාය මෙහෙය වූ වාර්තාගත වැඩිම බහාලුම් සංඛ්‍යාව වේ. මෙහෙය වූ මුළු බහාලුම් ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වැඩි අන්තර් නැව් බහාලුම් පරිමාව, 2004 වර්ෂයේ වූ සියයට 13.5ක වර්ධනයට සාපේක්ෂව සියයට 12.7 කින් ප්‍රසාරණය විය. ආනයන වර්ධනය අඩුවීම හේතුවෙන් දේශීය බහාලුම් පරිමාව පසුගිය වර්ෂයේ වූ සියයට 17 ක වර්ධනයට සාපේක්ෂව සියයට 7.2 කින් වර්ධනය විය. ගුවන් සේවා කර්මාන්තයේ ප්‍රසාරණය පිළිබිඹු කරමින් ගුවන් භාණ්ඩ පරිමාව සියයට 3.6 කින් මධ්‍යස්ථව වර්ධනය විය

- **ආර්ථිකය තුළ විශාලතම ක්ෂේත්‍රයන්ගෙන් එකක් වන ප්‍රවාහන ක්ෂේත්‍රය, පසුගිය වර්ෂයේ වූ සියයට 4.2 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.3 කින් පමණ වර්ධනය විය.** 2005 වර්ෂය තුළදී බස් සහ දුම්රිය ප්‍රවාහන සේවාවල දුර්වල ක්‍රියාකාරීත්වය සහ ගුවන් සේවා ක්ෂේත්‍රයේ මධ්‍යස්ථ ක්‍රියාකාරීත්වය මෙම මන්දගාමීත්වය තුළ පිළිබිඹු විය. ශ්‍රී ලංකා දුම්රිය සේවය ධාවනය කළ මගී කිලෝ මීටර් ප්‍රමාණය 2004 වර්ෂයේ වූ සියයට 1.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 7 කින් පමණ පහත වැටුණි. 2004 වර්ෂයේ දෙසැම්බර් මස සුනාමියේ බලපෑමෙන් දකුණු මුහුදුබඩ දුම්රිය මාර්ගයට බරපතල ලෙස හානි සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස අඩු වූ දුම්රිය ධාවන කිලෝ මීටර් ගණන, 2005 වර්ෂය තුළදී මගී කිලෝ මීටර් ගණන පහළයාම තුළ පිළිබිඹු විය. පොදු ප්‍රවාහන සේවා තුළ, පෞද්ගලික බස් කාණ්ඩයේ ක්‍රියාකාරීත්වය ආන්තිකව වර්ධනය වූ අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය

සංකෝචනය විය. කෙසේ නමුත් ත්‍රීරෝද රථ, කුලී වාහන සහ පෞද්ගලික වාහන ඇතුළත් වෙනත් පෞද්ගලික ප්‍රවාහන සේවා සැළකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ගුවන් සේවා කර්මාන්තයට විශාල ලෙස බලපෑ සුනාමි ව්‍යසනය හා අධික තෙල් මිල ඇතුළු බහු විධ අර්බුදයන් තිබියදීත්, ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ වෙනත් දේශීය ගුවන් සේවා පියාසර කළ මුළු මඟී කිලෝ මීටර් සංඛ්‍යාව සියයට 2.8 කින් පමණ ඉහළ ගියේය. දේශීය නිෂ්පාදනයේ සැළකිය යුතු ඉහළයාමත් සහ ආනයන වෙළෙඳාමේ මධ්‍යස්ථ වර්ධනයත් සමඟ භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල ප්‍රසාරණය පිළිබිඹු කරමින් මාර්ගස්ථ භාණ්ඩ ප්‍රවාහනය සියයට 4.2 කින් පමණ වර්ධනය විය.

- **මූල්‍ය සේවා, දේපළ වෙළඳාම් සහ ව්‍යාපාරික සේවා අංශය සියයට 6.5 ක වර්ධනයක් වාර්තා කරමින්, මැතවිත් ක්‍රියාකාරී වූ අතර, දළ ජාතික නිෂ්පාදිතයේ සමස්ත වර්ධනයට සියයට 12.7 කින් දායක විය.** මූල්‍ය සේවා උප අංශයේ වර්ධනය මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

- **මූල්‍ය සේවා උප අංශය සියයට 7.5 ක වර්ධනයක් වාර්තා කළ අතර, බැංකු ක්ෂේත්‍රය පමණක් සියයට 3.8 කින් වර්ධනය විය.** 2005 වර්ෂය තුළ ණය සඳහා පොලී අනුපාතිකයන් සැළකිය යුතු ලෙස ඉහළ නොගිය නමුත් ණය නිකුතුවේ ඉහළ වර්ධනයක් පිළිබිඹු කරමින් පොලී ආදායම පවත්නා මිල අනුව සියයට 22 කින් පමණ ඉහළයාමක් වාර්තා කළේය. කෙසේ නමුත්, විදේශ විනිමය වෙළෙඳාමෙන් ලැබෙන පොලී නොවන ආදායම සහ සුරැකුම්පත් හා ආයෝජන වලින් ලැබෙන ලාභාංශ පහත වැටුණි. රක්ෂණ හා වෙනත් මූල්‍ය සමාගම්වල ලීසිං හා කල්බදු ආයෝජනයන්ගෙන් ලද ආදායම් සැළකිය යුතු ලෙස ඉහළයාම සහ වෙනත් මූල්‍ය ආයතනවල සතුටුදායක ක්‍රියාකාරීත්වයත් සමඟ රක්ෂණ හා වෙනත් මූල්‍ය සේවා සියයට 10.2 කින් පමණ වර්ධනය විය.

- **දේපල වෙළෙඳාම්, බදුදීම් සහ වෙළෙඳ සේවා සඳහා නොකඩවා පවතින ඉල්ලුම් පිළිබිඹු කරමින්, 2004 වර්ෂය තුළ වූ සියයට 1.7 ක වර්ධනයට සාපේක්ෂව මෙම සේවා 2005 වර්ෂයේදී සියයට 2.8 කින් පමණ වර්ධනය විය.** සුඛෝපභෝගි තට්ටු නිවාස සහ වෙනත් වර්ගයේ නිවාස ව්‍යාපෘති ඇතුළු දේපල වෙළඳාම් සංවර්ධනයේ යෙදෙන සමාගම් 2005 වර්ෂය තුළදී ඉහළ ලාභ වාර්තා කළේය. වෙළෙඳ ප්‍රචාරණ හා පරිගණක මෘදුකාංග නිෂ්පාදන කටයුතු ඇතුළත් වෙළෙඳ සේවා කටයුතු ද ඉහළ වර්ධනයක් වාර්තා කළේය.

- **රාජ්‍ය පරිපාලන, අනෙකුත් සේවා සහ ආරක්ෂක කටයුතු, අනෙකුත් ප්‍රජා, සමාජයීය සහ පෞද්ගලික සේවා අංශය පසුගිය වර්ෂය තුළ වූ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව මෙම වර්ෂයේදී සියයට 5.4 කින් පමණ වර්ධනය විය.** 2004 වර්ෂයේ හතරවන කාර්තුව තුළදී බඳවාගත් සේවා වියුක්ත උපාධිධාරීන් 42,000 ක් පමණ මෙම වර්ෂය තුළදී නොයෙකුත් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කළ අතර, ඒ අතුරින් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය අධ්‍යාපනික සේවාව විසින් අන්තර්ග්‍රහනය කරන ලදී. මෙම ප්‍රසාරණය මගින් එකතු කළ නිමැවුම, රාජ්‍ය පරිපාලන උප අංශයේ පසුගිය වසරේ වූ සියයට 2.0 ක වර්ධනයට

**2.10 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | පවත්නා මිල අනුව | | | 1996 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 (අ) | 2005 (ආ) | 2003 | 2004 (අ) | 2005 (ආ) |
| **1 දේශීය ඉල්ලුම** | | | | | | |
| පරිභෝජනය | 1,481,164 | 1,706,994 | 1,958,887 | 935,238 | 981,917 | 1,010,296 |
| (% වෙනස) | 9.4 | 15.2 | 14.8 | 6.2 | 5.0 | 2.9 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 388,757 | 506,942 | 625,983 | 263,497 | 294,255 | 325,910 |
| (% වෙනස) | 16.1 | 30.4 | 23.5 | 16.0 | 11.7 | 10.8 |
| **මුළු දේශීය ඉල්ලුම** | **1,869,921** | **2,213,936** | **2,584,870** | **1,198,735** | **1,276,172** | **1,336,206** |
| **(% වෙනස)** | **10.8** | **18.4** | **16.8** | **8.2** | **6.5** | **4.7** |
| **2 බාහිර ඉල්ලුම** | | | | | | |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 632,907 | 736,967 | 792,415 | 394,284 | 424,137 | 447,943 |
| (% වෙනස) | 10.9 | 16.4 | 7.5 | 5.4 | 7.6 | 5.6 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 741,667 | 921,537 | 1,011,583 | 566,367 | 617,732 | 636,429 |
| (% වෙනස) | 9.5 | 24.3 | 9.8 | 10.2 | 9.1 | 3.0 |
| ශුද්ධ බාහිර ඉල්ලුම | **-108,760** | **-184,571** | **-219,168** | **-172,083** | **-193,595** | **-188,486** |
| **3 මුළු ඉල්ලුම** | **1,761,161** | **2,029,365** | **2,365,702** | **1,026,652** | **1,082,577** | **1,147,720** |
| **(% වෙනස)** | **11.3** | **15.2** | **16.6** | **6.0** | **5.4** | **6.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සාපේක්ෂව 2005 වර්ෂයේ සියයට 5.1 කින් වර්ධනය වීම තුළින් පිළිබිඹු වේ. අනෙකුත් ප්‍රජා සමාජයීය සහ පෞද්ගලික සේවා උප අංශය සියයට 6.0 ක වර්ධනයක් වාර්තා කිරීමට පෞද්ගලික සෞඛ්‍යය සේවා සහ අධ්‍යාපනික සේවාවල යහපත් වර්ධනය යම් ප්‍රමාණයකට හේතු විය.

## 2.4 වියදම

- **දළ දේශීය වියදම මගින් මනිනු ලබන, දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මගින් ජනිත කරන සමස්ත ඉල්ලුම, 2005 වර්ෂය තුළදී (පවත්නා මිල අනුව) රුපියල් බිලියන 2,580 ක් දක්වා සියයට 16.8 කින් ඉහළ ගියේය.** 2004 වර්ෂයේදී දළ දේශීය වියදම (සමස්ත දේශීය ඉල්ලුම) සියයට 18.4 කින් වැඩිවිය. ආර්ථිකයෙහි, පෞද්ගලික සහ රාජ්‍ය යන අංශයන්හි පරිභෝජනය සහ ආයෝජන වියදම්වල එකතුව වන දළ දේශීය වියදම, 2004 වර්ෂයේ සියයට 6.5 ක අගය හා සැසඳීමේදී මෙම වර්ෂය තුළ මූර්ත වශයෙන් සියයට 4.7 කින් වර්ධනය විය. 2005 වර්ෂයේදී පරිභෝජනයෙහි මූර්ත වර්ධනය අඩු වර්ධන වේගයක් දක්වීය. තවද, පෙර පරිදිම, ආයෝජන වර්ධනය මූර්ත වශයෙන් මෙන්ම, පවත්නා මිල ගණන් යටතේද පරිභෝජන වර්ධනය ඉක්මවීය. දළ දේශීය වියදමෙහි සහ ශුද්ධ ආනයනවල එකතුව වන දළ දේශීය නිෂ්පාදිතය, වෙළෙඳපොළ මිල යටතේ රුපියල් බිලියන 2,366 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර, මෙය සියයට 16.6 ක ඉහළයාමකි.

**පරිභෝජනය**

- **2005 වර්ෂය තුළදී පරිභෝජන වියදම් සියයට 14.8 කින් රුපියල් බිලියන 1,959 ක් දක්වා ඉහළ ගියේය.** මෙය මූර්ත පරිභෝජනය සියයට 2.9 කින් සහ සාමාන්‍ය මිල මට්ටම් සියයට 11.5 කින් ඉහළයාමේ ප්‍රතිඵලයකි. මුළු පරිභෝජන වියදමින් 2004 වර්ෂයේදී සියයට 14.9 ක් ඉහළ ගිය පෞද්ගලික පරිභෝජන වියදම මෙම වසර තුල සියයට 14.4 කින් වර්ධනය විය. තවද, රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම් සියයට 18.3 කින් ඉහළ ගිය අතර, ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ වර්ධනය සියයට 18.4 ක් විය. 2005 වර්ෂය තුළ, මුළු පරිභෝජන වියදම් තුළ පෞද්ගලික පරිභෝජන වියදම් ප්‍රතිශතය සියයට 90 ක මට්ටමේ රැඳී තිබුණි. මුළු පෞද්ගලික පරිභෝජන වියදම සැළකූ විට, දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ හා සේවා සඳහා වන පිරිවැය සියයට 18.6 කින් වැඩි වූ අතර, භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය සඳහා වන වියදම සියයට 4.6 කින් ඉහළ ගියේය.

- **2005 වර්ෂය තුළදී ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග සඳහා වන වියදම් ප්‍රතිශතය ආන්තිකව සියයට 32.3 ක් දක්වා පහත වැටුණි.** මෙමගින් දියුණු වන ජීවන මට්ටම් සමග, කුටුම්භයන්හි වියදම් මූලික අවශ්‍යතාවයන්ගේ සිට විශේෂයෙන්ම සේවා අංශය පදනම් කරගත් වෙනත් ක්ෂේත්‍ර තුළට විවිධාංගීකරණය වන බව නැවත වතාවක් සනාථ කරනු ලබයි. බොහොමයක් ආහාර කාණ්ඩවල මිල ගණන් ඉහළයාමත් සමගම මෙම කාණ්ඩය තුළ වියදම නාමික වශයෙන් සියයට 13.5 කින් ඉහළ ගියේය. මත්ස්‍ය නිෂ්පාදනයෙහි පහත වැටීමත් සමගම ප්‍රෝටීන් අඩංගු ආහාර අනෙකුත් මස් සහ බිත්තර වැනි ආහාර පරිභෝජනය ඉහළ ගිය අතර, නිෂ්පාදනය ඉහළයාම හේතුකොට ගෙන පිටි සහිත ආහාර, ධාන්‍ය සහ මාංශ බෝගවල පරිභෝජනය ද වැඩි විය.

- **තවත් මූලික අවශ්‍යතාවන් දෙකක් වන රෙදිපිළි සහ නිවාස හා ඒ ආශ්‍රිත සේවාවන් සඳහා වූ වියදම් නාමික වශයෙන් සියයට 9-14 අතර පරාසයකින් වර්ධනය විය.** දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ පරිභෝජනය, ආනයනික භාණ්ඩ පරිභෝජනයට වඩා වැඩි ශීඝ්‍රතාවයකින් ඉහළයාමත් සමගම නිමි ඇඳුම්, රෙදිපිළි, ඇඟළුම් ආශ්‍රිත උපාංග සහ පාවහන් අයත් වන, රෙදිපිළි සහ පාවහන් ශීර්ෂය සඳහා වූ වියදම් සියයට 9 කින් වර්ධනය විය. තවද, ඉහළ යන මිල ගණන් හමුවේ නිවාස අළුත්වැඩියා කටයුතු, නල ජලය, විදුලිය, ගෑස් සහ ඉන්ධන වැනි කුටුම්භ සේවාවන් සඳහා වූ පිරිවැය සියයට 10 කින් ඉහළ ගියේය.

- **පසුගිය වර්ෂය තුළ මධ්‍යසාර, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය සඳහා වූ දයකත්වය පහළ ගියද, 2005 වර්ෂය තුළ මෙම කාණ්ඩය සඳහා වියදම සියයට 13 කින් ඉහළ ගියේය.** මධ්‍යසාර පානයන්හි නිෂ්පාදන පරිමා ප්‍රසාරණය වීම තුළින්ද, පරිභෝජනයේ මෙම ඉහළයාම පිළිබිඹු කරන ලදී. කෙසේ වුවත්, සුරාබදු මිල ගණන් ඉහළට සංශෝධනය කළද මුළු වියදම් සඳහා මෙම කාණ්ඩයේ දයකත්වය නොවෙනස්ව පැවතුණි.

- **ප්‍රවාහන අධ්‍යාපන සහ සෞඛ්‍යය සේවාවන් සඳහා වූ නාමික වියදම් සියයට 12-15 අතර පරාසයකින් වැඩි විය.** පසුගිය වර්ෂයේ සියයට 1 ක සංකෝචනයට සාපේක්ෂව, ප්‍රවාහන සේවාවන් සඳහා වූ පිරිවැය, ඉහළ නගින ඉන්ධන මිල ගණන් සහිත වාතාවරණයක් තුළ සියයට 12 කින් වර්ධනය විය. බස් සහ දුම්රිය ප්‍රවාහන ගාස්තු ඉහළ නැංවීම සහ ඉහළ ඉන්ධන මිල ගණන් හේතුවෙන් ප්‍රවාහන සේවාවන්වල මෙන්ම, පෞද්ගලික මෝටර් රථ පාවිච්චි කිරීම සඳහා වන වියදම් ඉහළ ගිය අතර 2004 වර්ෂය අග භාගයේදී හඳුන්වා දෙනු ලැබූ ආනයන තීරු බදු සමඟ මෝටර් රථ වල මිල ගණන් ඉහළයාම නිසා වාහන මිලදී ගැනීම සඳහා වූ පාරිභෝගික පිරිවැය පහත වැටුණි. පෞද්ගලික උපකාරක පංති සහ පෞද්ගලික අධ්‍යාපන ආයතනයන්හි ක්‍රියාකාරකම් ප්‍රසාරණයවීම හේතුවෙන් 2004 වර්ෂයේ පෞද්ගලික පරිභෝජන වියදම් අංශයෙන් ඉහළම වර්ධනයක් වාර්තා කළ අධ්‍යාපන කාණ්ඩය, 2005 වර්ෂය තුළදී යම් තරමක අඩු වර්ධනයක් දක්වීය.

- **නාමික වශයෙන් සියයට 63.2 ක වර්ධනයත් සමග සන්නිවේදන සේවා කාණ්ඩය මෙම වසර තුළදී වැඩීම වර්ධනයක් දක්වීය.** ස්ථාවර සහ ජංගම දුරකථන මෙන්ම, අනෙකුත් නවීන සන්නිවේදන තාක්ෂණික උපකරණ සඳහා වූ අඛණ්ඩ ඉල්ලුමට අනුකූලව, විදුලි සංදේශ අංශයෙහි වූ ශීඝ්‍ර ප්‍රසාරණය හා සමගාමීව සන්නිවේදන සේවාවන් සඳහා වූ පරිභෝජන වියදම් ඉහළ ගියේය.

- **ක්‍රීඩා සහ විනෝද සේවා මෙන්ම, ආපනශාලා සහ හෝටල් යන ශීර්ෂයන් සඳහා වූ පරිභෝජන පිරිවැය සියයට 15 ට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වූ නමුදු, 2004 වර්ෂයට සාපේක්ෂව මෙම කාණ්ඩයන්හි වර්ධන ශාමකත්වය යම් ප්‍රමාණයකට අඩු වී ඇත.** විනෝද සේවා අංශය සඳහා වූ සුනාමියෙහි බලපෑම, දේශීය සංචාරක සංඛ්‍යාවන්හි පහළයාම මගින් පිළිබිඹු විය. කෙසේ වුවත් විවිධ භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම සියයට 17 කින් වර්ධනය විය.

- **2005 වර්ෂය තුළදී බොහෝමයක් පරිභෝජන ශීර්ෂයන්හි මූර්ත වර්ධනයක් සිදු වී ඇති බව පෞද්ගලික පරිභෝජන වියදම් පිළිබඳ ඉහත විශ්ලේෂණය මගින් අනාවරණය වේ.** ඒකපුද්ගල ආදායමෙහි සිදු වූ අඛණ්ඩ ප්‍රසාරණයත් සමඟ, බොහොමයක් භාණ්ඩ වර්ග පරිභෝජනයට වඩා වැඩි වේගයකින් සේවාවන් පරිභෝජනය වර්ධනය වී ඇත. මෙය සංවර්ධනයත් සමග ශ්‍රී ලාංකික ජන සමාජයේ ජීවන රටාවන් තවදුරටත් දියුණු වන බව පෙන්නුම් කරන අතර, මූලික අවශ්‍යතාවයන් සපිරීම සඳහා වූ කාණ්ඩවල පරිභෝජනය මූලික අවශ්‍යතාවයේ සිට අභිමතය පදනම් කරගත් සේවා සඳහා විතැන්වී ඇති බව පෙන්නුම් කරයි.

- **2005 වර්ෂය තුළදී රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම්, 2004 වර්ෂයේ වර්ධනයට සමාන අනුපාතිකයකින් ඉහළ ගියේය.** භාණ්ඩ හා සේවාවන් මෙන්ම, වැටුප් හා වේතන ඉහළයාම හේතුවෙන් රාජ්‍ය වියදම් ප්‍රසාරණය විය. සුනාමි බලපෑම්වලට ලක් වූ ජීවිකාවන් පවත්වාගැනීමට සහ යළි ගොඩනැගීමට අවශ්‍ය මානුෂික ආධාර මෙන්ම, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වූ රාජ්‍ය වියදම් ඉහළ ගියේය. තවද, 2004 වර්ෂයේ අග භාගයේදී රාජ්‍ය සේවයට උපාධිධාරීන් 42,000 ක් බඳවා ගැනීම මෙන්ම, රාජ්‍ය අංශයේ වැටුප්තල ඉහළ නැංවීම, රාජ්‍ය වේතන වියදම් ඉහළ නැංවීම කෙරෙහි බලපෑමක් ඇති කළේය.

### ආයෝජන

- **ආයෝජන වියදම (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) පවත්නා වෙළෙඳපොළ මිල ගණන් යටතේ රුපියල් බිලියන 626 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2004 වර්ෂයට සාපේක්ෂව සියයට 23.5 ක ඉහළ යාමකි.** මූර්ත වශයෙන් ගත් කළ, ආයෝජන වියදම සියයට 10.8 කින් වර්ධනය විය. ආයෝජන/ද.දේ.නි. අනුපාතය 2004 වර්ෂයේ පැවති සියයට 25 සිට, 26.5 දක්වා වර්ධනය විය. මෙයට සම්පූර්ණයෙන්ම සියයට 119.4 කින් වැඩි වූ රජයේ ආයෝජන හේතු වූ අතර, පෞද්ගලික ආයෝජන වර්ධනය සියයට 14.1 ක් පමණ විය.

- **මේ අතර, පසුගිය වසර දෙකක සැලකිය යුතු ඉහළ වර්ධනයකින් පසු ආයෝජන භාණ්ඩ ආනයනය මධ්‍යස්ථ වශයෙන් ඉහළ ගියේය.** සටන් විරාමයෙන් පසුව හා බහු කෙදි ගිවිසුම අවසන් වීම සඳහා සූදානම් වීමත් සමග 2003 හා 2004 වර්ෂය තුළ විදුලි සංදේශ, ප්‍රවාහන හා නිමැවුම් කර්මාන්තවල පෞද්ගලික ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ යමින් ඉහළ මූල අගයක් ආයෝජන සඳහා ඇති කළේය. වසරේ පළමු අර්ධය තුළදී ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 0.2 ක ආන්තික පහළයාමක් වාර්තා කළද, දෙවන අර්ධය තුළදී වැඩි වේගයකින් වර්ධනය වී පරිමා ඒකකයන්ට අනුව සියයට 4.2 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනය 2004 වර්ෂයේ වූ

**2.11 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|
| | 2003 | 2004 (අ)(ආ) | 2005 (ඇ) | 2004 /2003 | 2005/2004 |
| 1 ආහාර සහ මධ්‍යසාර නොවන පානයන් | 34.3 | 32.6 | 32.3 | 9.0 | 13.5 |
| 2 මද්‍යසාර, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය | 5.1 | 4.4 | 4.3 | -1.6 | 13.0 |
| 3 රෙදි පිළි සහ පාවහන් | 5.6 | 6.0 | 5.7 | 24.6 | 8.8 |
| 4 නිවාස කටයුතු සහ උපයෝගිතා සේවා | 14.1 | 16.1 | 15.5 | 31.7 | 9.9 |
| 5 ගෘහස්ථ උපකරණ සහ සේවා | 4.4 | 5.0 | 5.0 | 30.2 | 14.2 |
| 6 සෞඛ්‍යය | 3.6 | 3.7 | 3.7 | 19.1 | 15.3 |
| 7 ප්‍රවාහනය | 14.0 | 12.1 | 11.8 | -0.9 | 11.5 |
| 8 සන්නිවේදනය | 2.2 | 2.4 | 3.4 | 22.4 | 63.2 |
| 9 ක්‍රීඩා සහ විනෝද සේවා | 3.0 | 3.5 | 3.7 | 33.7 | 21.7 |
| 10 අධ්‍යාපනය | 1.2 | 1.6 | 1.6 | 49.0 | 14.0 |
| 11 ආපන ශාලා සහ හෝටල් | 1.2 | 1.4 | 1.4 | 28.5 | 15.2 |
| 12 විවිධ භාණ්ඩ සහ සේවා (ඈ) | 11.2 | 11.3 | 11.5 | 15.4 | 17.0 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **14.9** | **14.4** |

(අ) සංශෝධිත
(ආ) පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණය (2003/04) පදනම් කර
(ඇ) තාවකාලික
(ඈ) පෞද්ගලික සේවා, පෞද්ගලික උපාංග, සමාජ ආරක්ෂණය, මූල්‍ය සේවා සහ අනෙකුත් සේවා (අන්තැනක සඳහන් නොවන) මීට ඇතුළත්වේ.


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 18.4 ක වර්ධනයෙන් පසුව වූ ඉහළ මූල අගයකට සාපේක්ෂ වේ. ජසුගිය වර්ෂයන් දෙකේදී මෙන් නොව, 2005 වර්ෂය තුළදී ආයෝජන වර්ධනය තුළ සැළකිය යුතු කාර්යභාරයක් රාජ්‍ය ආයෝජන සිදු කළේය.

- **සුනාමි ව්‍යසනයෙන් පසු පෞද්ගලික මෙන්ම, රාජ්‍ය අංශයේ ආයෝජන සුනාමි බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු අවශ්‍යතා සඳහා යොමුකොට තිබුණි**. රාජ්‍ය ආයෝජන, මහාමාර්ග, දුම්රිය හා වෙනත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා යොමු කෙරුණි. පෞද්ගලික, දේශීය හා විදේශ අරමුදල් ප්‍රවාහ වර්ෂය තුළදී පළමුව තාවකාලික නිවාස සහ වාසස්ථාන ඉදිකිරීමටත්, පසුව ස්ථිර නිවාස පහසුකම් හා වෙනත් සහන සේවා සඳහාත් ප්‍රයෝජනයට ගන්නා ලදී.
- **මුළු ආයෝජනයන්ගෙන් සියයට 84 ක් වූ පෞද්ගලික අංශයේ ආයෝජන වියදම 2005 වර්ෂය තුළදී සියයට 14.1 කින් පමණ ප්‍රසාරණය විය**. පෞද්ගලික ආයෝජන තුළ අන්තර්ගත වන රාජ්‍ය සංස්ථාවල ආයෝජන ආන්තිකව පහත වැටුණු අතර, රාජ්‍ය ආයෝජන/ද.දේ.නි. අනුපාතය ශීඝ්‍ර ලෙස ඉහළයාම නිසා 2004 වර්ෂයේ දී 22.8 ක් වූ පෞද්ගලික ආයෝජන/ද.දේ.නි. අනුපාතය 2005 වර්ෂයේ දී සියයට 22.3 දක්වා පහත වැටුණි. හානියට පත් වූ හෝටල් නැවත ගොඩනැගීම ඇතුළු සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගලා ආ පෞද්ගලික ආයෝජනවලට අමතරව, වෙනත් කාර්මික හා සේවා අංශ ද ඵලදායිතා වර්ධනය, ධාරිතා ප්‍රසාරණය සහ නව කර්මාන්ත ඇරඹීම වැනි කටයුතු සඳහා ආයෝජන ආකර්ෂණය කරගන්නා ලදී.
- **2005 වසරේදී ශ්‍රී ලංකාව විසින් ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 287 දක්වා සියයට 22.6 කින් වර්ධනය වූ අතර එය සමස්ථ ආයෝජන වලින් සියයට 5 ක් පමණ වේ**. රටෙහි ප්‍රධාන විදේශ ආයෝජන ප්‍රවර්ධන ආයතනය වන, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 යන වගන්තීන් යටතේ 2004 දී ව්‍යාපෘති 526 ක් සඳහා අනුමත කළ රුපියල් බිලියන 142.3 ක ආයෝජන ප්‍රමාණය සමඟ සැසඳීමේදී, 2005 දී ව්‍යාපෘති 374 ක් සඳහා අනුමත කළ ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 79.4 ක් විය. දේශීය සහ විදේශීය වශයෙන් අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව පහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘති අනුමත කිරීමේදී අදළ ව්‍යාපෘති ගැඹුරුන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබාදීමේ පිළිවෙතක් අනුගමනය කිරීමයි. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2004 දී 228 ක් වූ ගිවිසුම්ගත ව්‍යාපෘති සංඛ්‍යාව 2005 දී 167 දක්වා අඩු වුවද, දේශීය ආයෝජනවල වටිනාකම ඉහළයාම හේතුවෙන් ගිවිසගත් ආයෝජනවල අගය 2005 දී රුපියල් බිලියන 74.3 ක් දක්වා සියයට 8 කින් වැඩි විය. 2005 වසරේදී ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර්මාන්තවල දනට කර ඇති ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 61 ක් වූ අතර එම වසර අවසානය වන විට මෙම ආයෝජන්හි සමුච්චිත වටිනාකම රුපියල් බිලියන 380 ක් විය.
- **ආයෝජන මණ්ඩල පනතෙහි 17 වන සහ 16 වන වගන්ති යටතේ 2005 දි අනුමත කළ ව්‍යාපෘති 374 න් ව්‍යාපෘති 150 ක් විදේශීය ආයෝජකයින් සතුවද. ව්‍යාපෘති 119 ක් දේශීය හා විදේශීය බද්ධ ව්‍යාපාර සතුවද පැවැති අතර ඉතිරි ව්‍යාපෘති ශ්‍රී ලාංකිකයින් සතු විය**. විශේෂයෙන්ම නව වර්ධන ක්ෂේත්‍රයන් වන දේපොළ වෙළෙඳම් කටයුතු, සන්නිවේදන, හෝටල්, ආපනශාලා සහ ව්‍යාපාරික සේවාවන් යනාදි අංශයන් ආයෝජනයන් අඛණ්ඩව අවශෝෂණය කරගත් අංශයන් විය. 2005 දී මෙම අංශයන් විසින් ව්‍යාපෘති 245 ක් සඳහා රුපියල් බිලියන 53 ක ආයෝජන ප්‍රමාණයක් අවශෝෂණය කර ගන්නා ලදී. 2005 වසරේදී කාර්මික අංශය විසින් ව්‍යාපෘති 126 ක් සඳහා රුපියල් බිලියන 26 ක අනුමත කල ආයෝජන ප්‍රමාණයක් අවශෝෂණය

**2.4 රූප සටහන**

**අනුමතකළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි ආයෝජන**



කරගන්නා ලදී. 2005 දී කාර්මික අංශයෙහි අනුමත කළ ව්‍යාපෘති වලින් විශාලතම ආයෝජන කොටස ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන (ව්‍යාපෘති 15 ක්) අංශය විසින් අවශෝෂණය කරගත් අතර මීළඟට රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන (ව්‍යාපෘති 34 ක්), රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (ව්‍යාපෘති 12 ක්) සහ සකස් කළ ලෝහ නිෂ්පාදන (ව්‍යාපෘති 20 ක්) යන කාර්මික කාණ්ඩ විසින් අවශෝෂණය කර ගන්නා ලදී.

- **2005 දී ගිවිසගත් මුළු ආයෝජනවලින් සියයට 17 ක් කම්හල් කර්මාන්ත අංශය විසින් අවශෝෂණය කරගත් අතර ඉතිරිය අනෙකුත් අංශ විසින් අවශෝෂණය කරගන්නා ලදී.** අනුමත කළ ආයෝජනයන්හි මෙන් ගිවිසගත් ව්‍යාපෘතීන්හි වූ ආයෝජන ප්‍රධාන වශයෙන් අවශෝෂණය කර ගන්නා ලද්දේ දේපොළ වෙළෙඳාම් කටයුතු, විදුලිබල උත්පාදනය සහ සංනිවේදන අංශයන් විසිනි. කම්හල් කර්මාන්ත අංශය තුළ, ආයෝජන ප්‍රධාන වශයෙන් අවශෝෂණය කරගත් අංශයන් වූයේ රෙදිපිළි ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන, ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන සහ රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන වේ.

- **වාණිජ කටයුතුවල නිරත වූ ව්‍යවසාය සංඛ්‍යාව 2004 දී 2,360 සිට 2005 දී 2,338 ක් දක්වා ආන්තික වශයෙන් පහත වැටී ඇත.** කාර්මික අංශය තුළ වූ ව්‍යාපෘතීන්ගෙන් ව්‍යාපෘති 390 ක් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයේද, ව්‍යාපෘති 190 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයේ ද, ව්‍යාපෘති 187 ක් රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයේද විය. මෙම ව්‍යාපෘතිවල වූ විදේශ ආයෝජන ප්‍රමාණය මුළු ආයෝජනවලින් සියයට 53 ක් විය. ක්‍රියාත්මක වෙමින් පැවති මෙම ව්‍යාපෘති වලින් සියයට 54 ක් හෙවත් ව්‍යාපෘති 1,263 ක් අපනයන සැකසුම් කලාපයන්ගෙන් පිටත පිහිටා තිබූ අතර ව්‍යාපෘති 28 ක් අපනයන ප්‍රවර්ධන කලාප, තොරතුරු තාක්ෂණ උද්‍යාන හා කාර්මික ජනපද වැනි විශේෂිත කාර්මික ප්‍රදේශවල හැර සෙසු ප්‍රදේශයන්හි ස්ථානගත වී තිබුණි.

- **2005 වසර අවසානය වනවිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ව්‍යවසායයන් 1,641 ක් ලියාපදිංචිව සිටි අතර එයින් විශාල ව්‍යවසාය සංඛ්‍යාවක් (ව්‍යවසායයන් 415 ක්) රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන කාණ්ඩයෙහි විය.** මීළඟට රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (ව්‍යවසායයන් 385 ක්), සකස් කළ ලෝහ නිෂ්පාදන (ව්‍යවසාය 276 ක්), ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන (ව්‍යවසාය 195 ක්) සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (ව්‍යවසායයන් 82 ක්) අංශයෙහිද විය. ව්‍යවසායයන් 1,133 ක ඇස්තමේන්තුගත රුපියල් දශ ලක්ෂ 102,110 ක ආයෝජනයක් සහිතව කොළඹ දිස්ත්‍රික්කය තුළද, ව්‍යවසායයන් 240 ක් රුපියල් දශ ලක්ෂ 9,788 ක ඇස්තමේන්තුගත ආයෝජනයක් සහිතව ගම්පහ දිස්ත්‍රික්කය තුළ ද ස්ථානගත වී තිබුණි. ඒ අනුව, සමස්ත ආයෝජනවලින් සියයට 94 ක දායකත්වයක් ඇතිව ලියාපදිංචි වී ඇති ව්‍යවසායයන්ගෙන් සියයට 84 ක් මෙම දිස්ත්‍රික්ක දෙක තුළ ස්ථානගත වී තිබුණි.

- **රජයේ ආයෝජන වියදම් සැලකිය යුතු ලෙස රුපියල් බිලියන 99 දක්වා සියයට 119.4 කින් පමණ 2005 වර්ෂය තුළදී ඉහළ ගියේය.** මෙම ආයෝජනයන් ප්‍රධාන වශයෙන්ම සුනාමියෙන් විනාශ වූ මහා මාර්ග සහ

### 2.12 සංඛ්‍යා සටහන
### ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය


| කාණ්ඩයන් | ව්‍යාපෘති සංඛ්‍යාව | | ආයෝජන (රු. දශ ලක්ෂ) | | | | | | සේවා නියුක්තිය(සංඛ්‍යාව) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2004(අ) | 2005(ආ) | 2004(අ) | | | 2005(ආ) | | | 2004(අ) | 2005(ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| **ආයෝජන මණ්ඩලය** | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 526 | 374 | 87,629 | 54,667 | 142,296 | 31,510 | 47,859 | 79,369 | 49,131 | 35,972 |
| 17 වන වගන්තිය යටතේ | 296 | 223 | 69,706 | 53,777 | 123,483 | 27,768 | 46,765 | 74,533 | 41,002 | 29,382 |
| 16 වන වගන්තිය යටතේ | 230 | 151 | 17,923 | 890 | 18,813 | 3,742 | 1,094 | 4,836 | 8,129 | 6,590 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති | 228 | 167 | 36,536 | 32,248 | 68,784 | 32,363 | 41,902 | 74,265 | 35,614 | 24,536 |
| 17 වන වගන්තිය යටතේ දනට කර ඇති ආයෝජන | 1,867 | 1,871 | 208,696 | 110,769 | 319,465 | 233,522 | 146,607 | 380,129 | 437,698 | 410,851 |
| වානිජ කටයුතුවල නිරත වූ (ඇ) | 2,360 | 2,338 | 169,743 | 144,272 | 314,015 | 175,110 | 154,313 | 329,423 | 392,259 | 387,811 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 1,602 | 1,571 | 153,650 | 132,950 | 286,600 | 158,934 | 142,976 | 301,910 | 355,455 | 350,758 |
| 16 වන වගන්තිය යටතේ (ඇ) | 758 | 767 | 16,093 | 11,322 | 27,415 | 16,176 | 11,337 | 27,513 | 36,804 | 37,053 |
| **කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය** | | | | | | | | | | |
| ලියාපදිංචි වූ ව්‍යාපෘති (ඇ) | 1,604 | 1,641 | ලැ.නො. | ලැ.නො. | 115,498 | ලැ.නො. | ලැ.නො. | 118,502 | 278,397 | 282,036 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය


මූලයන් : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

**2.5 රූප සටහන**
**2005 වර්ෂයේ ආර්ථිකය**
**(පවත්නා මිල යටතේ)**

**භාණ්ඩ සහ සේවා සැපයුම**
**(රුපියල් බිලියන 3,377)**




**භාණ්ඩ සහ සේවා සඳහා ඉල්ලුම**
**(රුපියල් බිලියන 3,377)**




දුම්රිය මාර්ග පුනරුත්ථාපනය සහ නැවත ඉදිකිරීම සඳහා සහ දකුණු අධිවේගී මාර්ගය, බලශක්ති, ජලසම්පාදනය සහ ගුවන් තොටුපොල වැනි වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යොමු විය.

## පවත්නා සම්පත් සහ උපයෝජනය

- **රටක සමස්ත සම්පත් ප්‍රවාහය. දළ දේශීය නිෂ්පාදිතයෙන්ද (දේශීය සම්පත්) භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනයෙන්ද (විදේශ සම්පත්) සමන්විත වේ.** මෙය පවත්නා මිල ගණන් යටතේ රුපියල් බිලියන 3,377 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 14.4 ක වර්ධනයක් වේ. මෙම වර්ධනය, දේශීය සම්පත් රුපියල් බිලියන 336 ක වර්ධනයකින් සහ විදේශ සම්පත් රුපියල් බිලියන 90 ක වර්ධනයකින් සමන්විත විය. මූර්ත වශයෙන් පවත්නා සම්පත් සියයට 4.9 කින් ඉහළ ගිය අතර, මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩු අගයක් විය. මෙයට දේශීය සම්පත් සියයට 6.0 කින් ඉහළ යාමද, භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනය සියයට 3 කින් ඉහළ යාමද අයත් විය. දේශීය සම්පත් සියයට 64 ක දායකත්වයක් දැක්වූ අතර ඉතිරි සියයට 36 විදේශීය සම්පත් මගින් සැපයීය. මෙමගින් දේශීය සම්පත් කෙරෙහි ආන්තික නැඹුරුවක් පෙන්නුම් කරයි. සම්පත් මූලයන් දෙකෙහි සාපේක්ෂ වර්ධන අනුපාතයන්ගේ වෙනස මෙම විතැන් වීම තුළ පිළිඹිබු වේ.
- **2004 වර්ෂයට සාපේක්ෂව සම්පත් උපයෝජන ව්‍යුහය. මෙම වසර තුළදී පරිභෝජනවල සිට ආයෝජන දක්වා ආන්තිකව නැඹුරු වූ අතර. මූලික භාණ්ඩ තුනෙහිම පෙරට වඩා අඩු වර්ධනයක් පෙන්නුම් කළේය.** සම්පත් උපයෝජනය සැලකූ විට පරිභෝජනය (සියයට 2.9 ක වර්ධනයක් සමඟ) සියයට 57 ක් ද, ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය මූර්ත වශයෙන් සියයට 10.7 ක වර්ධනයත් සමග සියයට 18.3 ක් ද ග්‍රහණය කර ගත්තේය. භාණ්ඩ හා සාධක නොවන සේවා සියයට 5.6 කින් වර්ධනය වූ අතර එහි සාපේක්ෂ දායකත්වය 2004 දී මෙන් සියයට 25 ක් විය.
- **පවත්නා මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවාවන්හි සමස්ත සැපයුමෙන් දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල දායකත්වය සියයට 68 ක් වූ අතර, ඉතිරිය ආනයනය කෙරිණි.** දේශීය සැපයුම අතුරෙන් වෙළඳ ක්‍රියාකාරකම්, ප්‍රවාහන, සංනිවේදන සහ මූල්‍ය සේවාවන්හි අගයන් හේතුවෙන් සියයට 38 ක දායකත්වයක් දැක්වූ සේවා සැපයුම, සියයට 30 ක දායකත්වයක් දැක්වූ භාණ්ඩ සැපයුම ඉක්මවීය. එසේ වුවද ආනයන සැපයුම මූලිකවම මුළු ඉල්ලුමෙන් සියයට 28 ක දායකත්වයක් දැක්වූ භාණ්ඩ වලින් සමන්විත වූ අතර, ආනයනික සේවාවන් සියයට 4 ක දායකත්වයක් දැක්වීය.

**2.13 සංඛ්‍යා සටහන**
**සම්පත් සංයුතිය සහ උපයෝජනය**
**(1996 ස්ථාවර මිල අනුව)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2004(අ) | 2005(ආ) | 2004(අ) | 2005(ආ) |
| **1. සම්පත්** | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 63.7 | 64.3 | 5.4 | 6.0 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 36.3 | 35.7 | 9.1 | 3.0 |
| **එකතුව** | **100.0** | **100.0** | **6.7** | **4.9** |
| **2. උපයෝජනය** | | | | |
| පරිභෝජනය | 57.7 | 56.6 | 5.0 | 2.9 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 17.3 | 18.3 | 12.2 | 10.7 |
| පෞද්ගලික අංශය | 15.5 | 14.7 | 14.0 | -0.5 |
| රජය | 1.8 | 3.6 | -0.9 | 105.6 |
| තොග වෙනස්වීම් | 0.0 | 0.0 | -87.6 | 23.4 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 24.9 | 25.1 | 7.6 | 5.6 |
| **එකතුව** | **100.0** | **100.0** | **6.7** | **4.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

- **නාමිකව භාණ්ඩ හා සේවාවන් සඳහා සමස්ත ඉල්ලුමෙන්, පරිභෝජනය සියයට 57 ක නියෝජනයක් සහ ප්‍රාග්ධන සම්පාදනයන් සඳහා වූ ඉල්ලුම සියයට 19 ක් වූ අතර අපනයනයන් සියයට 24 ක් විය.** මේ අතර, මුළු දේශීය ඉල්ලුමෙන් පෞද්ගලික අංශයේ පරිභෝජනය සියයට 90 ක පමණ දායකත්වයක් දක්වූ අතර රාජ්‍ය ආයෝජන වල සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් පෞද්ගලික ආයෝජන, පසුගිය වසරට සාපේක්ෂව සියයට 84 ක අඩු දායකත්වයක් දක්විය.

**ඉතුරුම්**

- **2004 වර්ෂය හා සැසඳීමේදී මෙම වර්ෂයේදී දේශීය සහ ජාතික ඉතුරුම් තුළ සැලකිය යුතු ඉහළ වර්ධන අනුපාතිකයක් දක්විය.** පෞද්ගලික ආයතන අංශයෙහි ඉහළ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව හේතුවෙන් සහ රාජ්‍ය නිර්-ඉතුරුම් (Dis-savings) සැලකිය යුතු අන්දමින් යහපත් තත්ත්වයට පත්වීම නිසා දේශීය ඉතුරුම් ඉහළ ගියේය. තවද, විදේශ රටවල රැකියාවල නියුතු වූවන්ගේ ප්‍රේෂණ ඉහළයාම හේතුවෙන්, ජාතික ඉතුරුම් වර්ධනය විය. මේ අතර සම්පත් පරතරය, එනම් දේශීය ඉතුරුම් සහ ආයෝජන අතර වෙනස, ද.දේ.නි. හි අනුපාතයක් ලෙස සියයට 9.1 සිට සියයට 9.3 දක්වා සුළු වශයෙන් ඉහළ ගිය අතර, ආයෝජන අනුපාතය, දේශීය ඉතුරුම් අනුපාතයට වඩා වැඩි වේගයකින් වර්ධනය විය.

- **පෞද්ගලික ඉතුරුම්, සහ රාජ්‍ය ඉතුරුම්වලින් සමන්විත දේශීය ඉතුරුම් රුපියල් බිලියන 407 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 26.2 ක වර්ධනයකි.** මෙයට ප්‍රධාන දායකත්වය සැපයුවේ පෞද්ගලික ඉතුරුම්හි සියයට 17.4 ක ප්‍රසාරණයයි. 2004 වර්ෂයේදී මෙන්ම, පෞද්ගලික අංශයේ ඉතුරුම් කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආයතනික අංශයේ ලාභදායීත්වය ඉහළයාමයි. රාජ්‍ය අයවැය ලේඛනයෙහි ජංගම ගිණුම් ශේෂය වන රාජ්‍ය ඉතුරුම් තව දුරටත් පිරිහුණු අතර, 2004 වර්ෂයට සාපේක්ෂව සියයට 18.7 කින් වර්ධනය විය. ඉහළ ආදායම් උත්පාදනය සහ සුනාමියෙන් පසු සමහර විදේශීය ණය සේවා සඳහා ලැබුණු ණය පමා සහනය මේ සඳහා දායක විය. 2004 වර්ෂයේ සියයට 15.9 ක් වූ දේශීය ඉතුරුම් අනුපාතය (දේශීය ඉතුරුම්/ද.දේ.නි.) මෙම වසර තුළ සියයට 17.2 දක්වා වැඩි විය.

- **දේශීය ඉතුරුම්, විදේශ ශුද්ධ සාධක ආදායම සහ ශුද්ධ විදේශ සංක්‍රාම වල එකතුව වන ජාතික ඉතුරුම් රුපියල් බිලියන 551 දක්වා සියයට 25.8 කින් ඉහළ ගියේය.** 2005 වර්ෂය තුළදී විදේශ ශුද්ධ සාධක ආදායම තව දුරටත් සෘණ අගයක පවතිමින් සහ වඩා වැඩි වේගයකින් බිලියන 30 දක්වා පිරිහීමට ලක්විය. මීට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, 2004 දෙසැම්බර් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2005 දෙසැම්බර් මස අධි ප්‍රමාණය වීමත් සමඟ විදේශ විනිමය පාඩු, ඉහළ පොලී අනුපාතයන්ගෙන් ලද ආදායම ඉක්මවා යාමයි. මෙම පහත වැටීම සිදුවූයේ සුනාමියෙන් පසු ණය පමා සහන කාලයක් සමහර විදේශ ණය සඳහා ලැබී තිබියදීත්ය. කෙසේ වුවත් ජාතික ඉතුරුම් වල ප්‍රධාන කොටසක් වන විදේශ රැකියාවල නියුතු වූවන්ගේ ප්‍රේෂණ වලින් සමන්විත ශුද්ධ පෞද්ගලික සංක්‍රාම, රුපියල් බිලියන 174 දක්වා සියයට 28 ක වැඩි වේගයකින් වර්ධනය වූ අතර, එය විදේශ ශුද්ධ සාධක ආදායම පිරිහීමෙන් වූ සෘණ බලපෑම සම්පූර්ණයෙන් සමනය කිරීමට සමත් විය. ජාතික ඉතුරුම් අනුපාතය (ජාතික ඉතුරුම්/ද.දේ.නි.) 2004 වර්ෂයේ සියයට 21.6 සිට 2005 වර්ෂය තුළදී සියයට 23.3 දක්වා ඉහළ ගියේය.

**2.14 සංඛ්‍යා සටහන**

**පරිභොජනය, ආයෝජන සහ ඉතිරි කිරීම්**
**(පවත්නා වෙළඳ මිල අනුව)**

| ශීර්ෂය | රුපියල් මිලියන | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2004 (ආ) | 2005 (ආ) | 2004 (අ) | 2005 (ආ) | 2004 (අ) | 2005 (ආ) |
| 1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 2,029,365 | 2,365,702 | 15.2 | 16.6 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 1,706,994 | 1,958,887 | 15.2 | 14.8 | 84.1 | 82.8 |
| පෞද්ගලික | 1,542,107 | 1,763,794 | 14.9 | 14.4 | 76.0 | 74.6 |
| රජය | 164,887 | 195,093 | 18.4 | 18.3 | 8.1 | 8.2 |
| 3. ආයෝජන | 506,942 | 625,983 | 30.4 | 23.5 | 25.0 | 26.5 |
| පෞද්ගලික | 461,681 | 526,702 | 32.7 | 14.1 | 22.8 | 22.3 |
| රජය | 45,261 | 99,281 | 11.0 | 119.4 | 2.2 | 4.2 |
| 4. දේශීය ඉතුරුම් | 322,372 | 406,815 | 15.1 | 26.2 | 15.9 | 17.2 |
| පෞද්ගලික | 400,577 | 470,419 | 18.5 | 17.4 | 19.7 | 19.9 |
| රජය | -78,205 | -63,604 | 34.4 | -18.7 | -3.9 | -2.7 |
| 5. දේශීය ඉතුරුම් - ආයෝජන පරතරය | -184,571 | -219,168 | 69.7 | 18.7 | -9.1 | -9.3 |
| 6. විදේශීය ශුද්ධ සාධක ආදායම | -20,688 | -30,049 | 25.1 | 45.3 | -1.0 | -1.3 |
| 7. විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාම | 136,607 | 174,426 | 17.5 | 27.7 | 6.7 | 7.4 |
| 8. ජාතික ඉතුරුම් | 438,290 | 551,192 | 15.4 | 25.8 | 21.6 | 23.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.5 ප්‍රතිපත්ති සහ ගැටලු

- **පාරිභෝගිකයන්ට සහ කර්මාන්තවලට ප්‍රමිතියෙන් උසස් ආහාර සහ ආහාර නොවන නිෂ්පාදන හිඟයකින් තොරව ලබා ගැනීමට සැලැසීම සහ ගොවීන්ගේ ආදායම වැඩි කිරීම යන පරමාර්ථ දෙකෙහි සමබරතාවය පවත්වා ගෙනයාමට කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සමත් විය යුතුය.** සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල කෘෂිකර්මාන්ත අංශයේ ස්වභාවය වන්නේ රටෙහි වර්ධනයට කෘෂිකර්මාන්තයෙන් එකතු කළ අගයට විසමානුපාතිකව ග්‍රාමීය ජනතාවට රැකියා සැපයීමයි. මේ නිසා විදේශ තරඟකාරිත්වයෙන් කෘෂි නිෂ්පාදකයින්ගේ ජීවිකාව ආරක්ෂා කිරීමත් රැකියා නියුක්තිය සහතික කිරීමත් වෙනුවෙන් තීරු බදු, සහනාධාර සහ අනෙකුත් ක්‍රමෝපායයන් හරහා කෘෂිකර්මාන්තය ආරක්ෂා කර ගැනීම කෙරෙහි රටවල් කැමැත්තක් දක්වයි. මෙවැනි තිරසාර නොවන ක්‍රමෝපායයන් නිසා පරිභෝජනය සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවන අතර, අයවැය සම්පත් මත පීඩනයක් ද ඇති කරයි. ඵලදායීතාව ඉහළ නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය, පර්යේෂණ තුළින් නව බෝග වර්ග නිපදවීම, ව්‍යාප්ති සේවා උපයෝගී කර ගැනීමෙන් පර්යේෂණවලින් සොයාගත් තොරතුරු සහ නව තාක්ෂණය ප්‍රචලිත කිරීම සහ මිල උච්චාවචනයන් පාලනය සඳහා වෙළෙඳපොළ පාදක කරගත් ක්‍රම වැඩි දියුණු කිරීම වැනි අඩු පීඩාකාරී බවින් යුත් තිරසාර ක්‍රමෝපායයන් රටවල් විසින් උපයෝගි කරගනු ලැබේ.

- **ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය ඊට ආවේනික වූ ගැටළු පෙළකින් දුර්වල කර තිබේ.** ඒවා අතුරින් ප්‍රධාන වන්නේ භූමි සම්පත සීමාසහිතවීම සහ ඉඩම් කැබලි කිරීම හේතුවෙන් පරිමාණානුකූල ඵල නියම ආකාරයෙන් ලැබීම වළක්වාලීම, කර්මාන්ත සහ සේවා අංශ සමඟ තරඟ කිරීමට නිෂ්පාදන සාධකවලට ඇති දුෂ්කරතා සහ අවසාන නිෂ්පාදිතවලට දේශීය සහ විදේශීය තරඟකාරිත්වයට එරෙහිව නැඟී සිටීමට සිදුවීමත්ය. ජාත්‍යන්තර වශයෙන් සිදුවන තාක්ෂණික සංවර්ධනය භාණ්ඩ මිල නොකඩවා පහත හෙළීමට හේතු වූ අතර, දේශීය මෙන්ම ජාත්‍යන්තරව අනෙකුත් ක්ෂේත්‍ර ප්‍රසාරණයවීම, භූමිය සහ ශ්‍රමය වැනි යෙදවුම් මත ඇති ඉල්ලුම වැඩිවීම නිෂ්පාදන පිරිවැය ඉහළයාමට හේතු විය. මෙවැනි බාධාවන් නිසා සීමිත භූමි ප්‍රමාණයක් සහිත සිංගප්පූරුව වැනි සමහර රටවල්, මුල් අවධියේම සම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැරවීම තෝරාගෙන ඇති අතර, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය සහ යුරෝපා සංගමයට අයත් රටවල් කෘෂිකර්මාන්තයට සැළකිය යුතු තරම් සහනාධාර සහ ආරක්ෂණ ක්‍රම සපයා දී තිබෙන අතරම, ශිල්පීය ක්‍රම සහ පර්යේෂණ මාර්ගයෙන් කෘෂිකර්මාන්තයේ එකතු කළ අගය ඉහළ නංවනු ලැබේ. වඩා ලිහිල් සාධක සහ නිෂ්පාදන වෙළෙඳපොළක් ඇති කිරීම, ස්ථාවර හා පුරෝකථනය කළ හැකි ප්‍රතිපත්ති පවත්වා ගෙන යාම, යටිතල පහසුකම් සංවර්ධනය, පර්යේෂණ සහ සංවර්ධනය ඉහළ නැංවීම, අධි තාක්ෂණය යොදා ගැනීම සහ ව්‍යාප්ති සේවා පුළුල් කිරීම තුළින් කෘෂිකාර්මික සංවර්ධනයේ සීමාවන්වලට සාර්ථක ලෙස මුහුණ දිය හැකි වනු ඇත.

- **කෘෂිකර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා රජය සහ පෞද්ගලික යන දෙඅංශයම එකිනෙකට අනුරූප භූමිකාවන් සිදුකළ යුතුය.** රජය මගින් ගැලපෙන නීති පද්ධතියක් ස්ථාපිත කළ යුතු අතර, යටිතල පහසුකම් සපයාදීම සහ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්වල නිරත විය යුතුය. විශේෂයෙන් මෙවැනි සේවා සහ ක්‍රියාකාරකම් සඳහා පෞද්ගලික අංශයෙන් සැපයීමට නොහැකි තරම් අධික පිරිවැයක් දැරීමට සිදු වේ නම් හෝ ඒවා 'පොදු භාණ්ඩ' ස්වභාවයේ නම් රජය විසින් එම කටයුතු සිදුකල යුතු වේ.

- **සහනාධාර සඳහා සහ දේශීය කෘෂිකර්මාන්තය අධික ලෙස ආරක්ෂණය සඳහා වැය කරන සුබසාධන පිරිවැය හේතුවෙන් අයවැය මත ඇති කෙරෙන පීඩනය එම අංශයේ ස්වයං පැවැත්මක් ඇති වන සේ ඵලදායිතාව වැඩි කිරීම මගින් ක්‍රම ක්‍රමයෙන් ඉවත් කළ යුතුය.** සහනාධාර, ශ්‍රී ලංකාවට පමණක් නොව අනෙකුත් රටවලට ද විවාදශීලී ගැටළු ඇතිකර ඇත. සහනාධාර සඳහා යන වියදම වර්තමාන හෝ අනාගත බදු අයකර ගැනීම තුළින් පියවා ගතයුතු බැවින් එය මහජනතාව විසින් දැරිය යුතු වේ. නිෂ්පාදකයන්ට දෙන පිහිටාධාර නිසා නිෂ්පාදන පිරිවැය අඩුවීම නිෂ්පාදකයින්ට වාසිදයක වන අතරම පාරිභෝගිකයින්ට ද වාසිදයක වේ. එසේ වුවද, බදු අයකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් යන කාණ්ඩ දෙකම පීඩාවට පත් වේ. දේශීය නිෂ්පාදනය ආරක්ෂා කිරීම සඳහා, විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍ය වැනි ආනයන සඳහා තීරු බදු වැඩි කිරීමෙන් වැඩි වශයෙන් පීඩාවට පත් වන්නේ දිළිඳු ජනතාවයි. විශේෂයෙන්ම, වී ගොවියන්ට දනට ලබා දෙන පොහොර සහනාධාරය වෙනත් ගැටළු රැසක් ඇති කර තිබේ. ඊට හේතුව මෙම සහනාධාරය බෙදදීම නියාමනය කිරීමට සහ සහනාධාරය අනෙකුත් අංශ වෙත ගලායාම පාලනය කිරීම සඳහා අධික පරිපාලනමය පිරිවැයක් දැරීමට සිදුවීමයි. අවශ්‍ය මට්ටම් දක්වා ඵලදායීතාව ඉහළ යන තෙක් ඉලක්ක කරගත් සුළු ගොවීන් සඳහා පොහොර මුද්දර ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායී යාන්ත්‍රණයක් වනු ඇත.

- **ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිෂ්පාදිත සකස් කිරීම මෙන්ම අනෙකුත් රටවල අසාධාරණ වෙළෙඳ පිළිවෙත් ඉවත් කිරීමට අවශ්‍ය ප්‍රයත්න දැරීම, ඵලදායීතාව වර්ධනය කිරීම හා සමානව ම වැදගත් වේ.** යුරෝපා සංගමයට අයත් රටවල් 2006 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වන පරිදි නව ආහාර සෞඛ්‍යාරක්ෂිත නීති පනතක් ක්‍රියාවෙහි යෙදීමට සැලසුම් කිරීම 2005 දී මතුවූ ප්‍රධාන ගැටළුවක් වූ අතර, එම නීති පනතට උපද්‍රව විශ්ලේෂණ සහ අවධි ලක්ෂණ පාලන පද්ධති (HACCP) පිළිබඳ ප්‍රමිතීන් භාවිතය ද ඇතුළත් විය. මෙය ක්‍රියාවට නංවන

දිනය 2006 ජූනි දක්වා දීර්ඝ කර තිබුණ ද, මෙය කෘෂිකාර්මික අපනයන කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකිය. විශේෂයෙන්ම, නියමිත කාලයට පෙර කර්මාන්තශාලා නවීකරණය සම්පූර්ණ කිරීමට අපහසු වුවහොත් එය තේ අපනයනය කෙරෙහි බලපානු ඇත. බොහෝ රටවල්, විශේෂයෙන්, දියුණු වූ රටවල්, සහනාධාර, තීරු බදු සහ අනෙකුත් ආරක්ෂණ ක්‍රමෝපායයන් සැපයීම තුළින් කෘෂිකර්මාන්තයට අධික ආරක්ෂණයක් ලබාදීම නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල දේශීය නිෂ්පාදකයන්ට අනර්ථකාරී බලපෑමක් ඇතිකළ හැකිය. මෙම ගැටළු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකාව බහු පාර්ශ්වීය වේදිකාවල් යොදා ගැනීම නොකඩවා කළ යුතුව ඇත.

- **කුරුලු උණ වැනි ශීඝ්‍රයෙන් පැතිරෙන රෝග සම්බන්ධයෙන් සමස්ත ලෝකයේම අවධානය යොමුව පවතින සහ මාධ්‍ය ප්‍රචාරය සිදුවන වාතාවරණයක් යටතේ. රටෙහි එවැනි රෝග බෝවීම වැළැක්වීම සඳහා දැඩි නිරෝධායන ක්‍රමෝපායයන් හා අනෙකුත් ආරක්ෂාකාරී පූර්වෝපායයන් අනුගමනය කරන අතර. වර්තමාන තත්ත්වය හා රටට විය හැකි අනතුරු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම ද සිදුකළ යුතුවේ.** කුකුළු ගොවිපොළ කටයුතුවල නියැලුන ගොවීන් සහ සාමාන්‍ය මහජනතාව වෙනුවෙන් ජෛව සුරක්ෂිතතාවයෙහි වැදගත්කම සහ ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීමෙන් ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීමෙන් හා මෙම රෝගය පැතිරීම පිළිබඳව මහජනතාව තුළ පවතින දැඩි සාවද්‍ය මත දුරු කිරීම තුළින් මෙම රෝගයෙන් කුකුළු නිෂ්පාදන කර්මාන්තයට විය හැකි හානිය අඩුකර ලීමට හැකිවනු ඇත.

- **අස්වනු නෙලන කාලයේ වෙළෙඳපොළෙහි අතිරික්තයක් ඇති අවස්ථාවලදී වී මිල තියුණු ලෙස පහළ බැසීම සහ වී අලෙවියේ දුෂ්කරතාවයන් ඇතිවීම නිසා. වී ගොවීයන්ට යැපුම් මට්ටමේ ආදයමක් හෝ ලබා ගැනීමට අපහසු වේ.** වෙළෙඳපොළ මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීමේ අරමුණින් රජය වී මිලදී ගැනීමේ විශේෂිත මිලක් යටතේ වෙළෙඳපොළට මැදිහත් වුවද රජයේ උත්සාහයන් ප්‍රමාණවත් නොවීය. එයට වැඩි වශයෙන් හේතු වූයේ රාජ්‍ය ප්‍රතිපාදන හිඟකම, ප්‍රවාහන සහ ගබඩා පහසුකම් වැනි යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය ඇතුළුව මිලදී ගැනීමේ සහ මිලට ගත් වී අලෙවි කිරීමේ තිරසාර යාන්ත්‍රණයක් නොතිබීමයි. වී අස්වනු නෙලන කාලයේදී ගොවිපොළ මිල ගණන් නොකඩවා පහත වැටීමෙන් පෙන්නුම් කෙරෙන්නේ තරඟකාරී වෙළෙඳපොළ බලවේග නොමැතිකමයි. මෙයට හේතුවිය හැක්කේ වී වගා කරන ප්‍රදේශවල පවතින තරඟකාරිත්වයට බාධා පමුණුවන ක්‍රියාකාරිත්වයන්ය. එබැවින් වී අස්වනු නෙලන කාලයේදී ගොවිපොළ මිල අඩුවීම වැළැක්වීමට වෙළෙඳපොළ මත පදනම් කරගත් අවසාන විසඳුමක් ලබා ගැනීම සඳහා රජය මගින් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයන් ප්‍රවේශමෙන් අධ්‍යයනය කළ යුතුව ඇත.

- **ව්‍යාප්ති සේවාවන් දුර්වල මට්ටමක පැවතීම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වලින් එළි දක්වෙන නව සොයා ගැනීම් වගා බිම් කරා ගෙනයාමට බාධාවක් වේ.** ආයතනික රාමුවෙහි වෙනස්කම් සිදුකිරීම සහ ගම් මට්ටමින් කෘෂි ව්‍යාප්ති කාර්යාල ඉවත් කිරීම නිසා පර්යේෂකයන්, කෘෂිකාර්මික පරිපාලකයන් සහ ගොවියන් අතර ඵලදායී ලෙස තොරතුරු ගලා යාමට බාධා පැමිණ තිබේ. ගොවියන් සහ පර්යේෂකයන් අතර ඇති හිඩැස නිසා පර්යේෂණවල නව සොයාගැනීම් සහ තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයෝගි කර ගැනීමේ අවස්ථාව අඩුවීමෙන් මෙම අංශයේ ඵලදායීතාව නැංවීමේ අවස්ථා වැලකී ඇත. මේ සම්බන්ධයෙන් මෑතකදී ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගයන් කාලෝචිත සහ ප්‍රශංසනීය වන අතර, එවැනි ව්‍යාප්ති සේවා ලබා දීම වගකීමකින් යුක්තව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් සැළසුම් සහ මනා සම්බන්ධීකරණයක් වහා අවශ්‍යව ඇත.

- **කර්මාන්ත අංශයට එහි උපරිම වර්ධන ශක්‍යතාවය ළඟාකර ගැනීමට තිබූ හැකියාව බාධක කීපයක් හේතුවෙන් වැලකී ගියේය.** ඌණ මානව ප්‍රාග්ධන නිපුණතා, විශේෂයෙන්ම බලශක්ති, මහා මාර්ග හා දුම්රිය මාර්ග ආදි යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, ඉහළ බලශක්තිය පිරිවැය, රාජ්‍ය අංශයේ ව්‍යවසායයන්හි ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල ප්‍රමාණවත් නොවීම, නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් පවතින දුර්වලතා, ශ්‍රම වෙළෙඳපොළෙහි ඇති අනම්‍යශීලී බව සහ බුන්වත් භාවය පිළිබඳ යෝග්‍ය අණ පනත් නොමැතිවීම ආදිය මෙම බාධක වලට ඇතුළත් විය. බලයට පත් වූ රජයන් මෙම බාධකත් හඳුනාගෙන තිබූ අතර, ඒ සඳහා විසඳුම් සෙවීමට ද උත්සාහයක නිරත වූ නමුදු ඉන් ලද ප්‍රතිඵල ප්‍රමාණවත් නැත. කාර්මික අංශයේ වර්ධනය සඳහා රටෙහි ඇති ශක්‍යතාවය උපයෝගීකොට ගැනීම පිණිස මනා ලෙස සංවිධානය වූ සහ වගකීමකින් යුතු වූ දිගුකාලීන අරමුණු අවශ්‍ය වනු ඇත.

- **පරිපාලන අවශ්‍යතාවයන් සහ නෛතික ක්‍රියා පටිපාටීන් හා සම්බන්ධ සේවා සැපයීමේ දුර්වලතා නෛතික වියදම් ඇතුළත් ව්‍යාපාරික ගනුදෙනුවල පිරිවැය ඉහළ යාමට හේතු වී ඇත.** කල්ගත වන වාර්තා කිරීමේ අවශ්‍යතා සහ බාධාකාරී අනුමත කිරීමේ ක්‍රියා පටිපාටි වලට අමතරව උසාවි නීති ක්‍රියාපටිපාටිවල ඇති විශාල කාල පමාවන්, පවතින නීතිවල ඇති සංකීර්ණත්වය සහ රට තුළ ප්‍රමාණවත් පරිදි වාණිජ උසාවි නොපැවතීම ආදී දුර්වලතා ද මීට ඇතුළත් වේ. ඒ සමඟම, කර්මාන්තවලින් පිටවන අප ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන පරිසර දූෂණය සහ පරිසරය ආරක්ෂා කිරීම පිණිස ඇති නීතිවල පවතින අඩු පාඩුද අවධානය යොමුකළ යුතු කරුණු අතර වේ. කාර්මික අංශයේ ප්‍රසාරණයට සහ පාරිසරික වශයෙන් වැදගත් වන ද සහ ඒවා ක්‍රියාත්මක කිරීම ආශ්‍රිතව ඇති ගැටළු සම්බන්ධයෙන් පවතින නීති නැවත විමර්ශනය කිරීම කාර්මික අංශයේ තිරසාර ප්‍රසාරණය සඳහා අවශ්‍ය වනු ඇත.

**විශේෂ සටහන 7**

## කුරුලු උණ සහ එයින් ශ්‍රී ලංකාවට සිදුවන බලපෑම

ශීඝ්‍රයෙන් පැතිරෙන වසංගතයක් දක්වා කුරුලු උණ පැතිර යාමට ඇති ඉඩකඩ සහ එමගින් මිනිසුන්ට සහ ලෝක ආර්ථිකයට හා මූල්‍ය පද්ධතියට ඇතිවිය හැකි බලපෑම පිළිබඳව අවධානය වැඩිවෙමින් පවතී.[1] ඉන්ෆ්ලුවෙන්සා වෛරස විශේෂයකින් හටගන්නා ආසාදිත රෝගයක් වන කුරුලු උණ පළමුවෙන්ම කුරුල්ලන් තුළ හඳුනාගන්නා ලද්දේ මීට සියවසකට පමණ පෙර ඉතාලියේ දීය. සෞඛ්‍ය විශේෂඥයන්ගේ විශේෂ සැලකිල්ල වර්තමානයේ හඳුනාගෙන ඇති H5N1 නමැති වෛරසය වෙත යොමුවී ඇත. මෙම වෛරස් විශේෂය පක්ෂීන් අතර ශීඝ්‍රයෙන් පැතිරෙන අතර ආහාරය පිණිස ඇතිකරන කුකුළන්, තාරාවන් වැනි සතුන් විශාල ප්‍රමාණයක් මරණයට පත්කර ඇත. තවද එය කලාතුරකින් මිනිසුන්ට ආසාදනයන් ඇතිකළ අතර එම රෝගීන්ගෙන් අඩක් පමණ මරණයට පත්වී ඇත. එනමුත්, කුරුල්ලන්ගෙන් මෙම ආසාදනය මිනිසුන්ට ව්‍යාප්තවීම පහසුවෙන් සිදුනොවන නිසා මිනිසුන්ට ආසාදනය වීම කලාතුරකින් සිදුවන අතර, එක් පුද්ගලයෙකුගෙන් තව පුද්ගලයෙකුට ව්‍යාප්තවීම ද තවම සිදුවී නැත.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ඉන්ෆ්ලුවෙන්සා වෛරස පරිණාමය වීම පුරෝකථනය කළ නොහැක. එබැවින්, H5N1 වැනි වෛරසයක් පහසුවෙන්ම මිනිසුන්ට පැතිරිය හැකි ආකාරයක් බවට පත්වීම හෝ එවැන්නක් කවද සිදුවේද යන්න සහ එවැන්නක දරුණු බව පිළිබඳව දන ගැනීම අසීරුය. කෙසේ වුවද, මිනිසාගෙන් මිනිසාට සෘජු වශයෙන් පැතිරිය හැකි ආකාරයට වෛරසයක් විකෘති වුවහොත් ඉතා වේගයෙන් ව්‍යාප්ත වන වසංගතයක් ඇතිවේයැයි ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමාන කරයි. ගෝලීය වශයෙන් මානව සංචලනය සහ අන්තර් සබඳතා ඉහළයාම හේතුවෙන් රෝගය වේගයෙන් පැතිරයා හැකි අතර, වෛරසයට ඉහළ මාරාන්තික අනුපාතයක් ඇතිකිරීමේ හැකියාවක් තිබේ නම්, ලෝකයේ ජීවිත දශ ලක්ෂ ගණනාවකට තර්ජනයක් ඇති විය හැකිය. අතීතයේ සිදුවූ ශීඝ්‍රයෙන් පැතිරෙන වසංගත තත්ත්වවලදී මෙන් සති හයකට වැඩි කාලසීමාවක් සහිතව විවිධ තීව්‍රතාවයකින් නැවත නැවතත් පැමිණෙන රැල්ලක් ලෙස වසංගතය පැතිරෙන තත්ත්වයක් මතුවිය හැකිය.

1997 දී හොංකොං හි ඇති වූ H5N1 පැතිරීම එහි කුකුළු පාලන කර්මාන්තයට දැඩි විනාශයක් ඇතිකළ අතර මිනිස් ජීවිත 6 කට මරණය ළඟා කළේය. මෑත කාලයේ රෝගය පැතිරීයාම වසර 2003 දී අග්නිදිග ආසියානු රටවලින් ඇරඹුනු අතර යුරෝපය, මැද පෙරදිග, අප්‍රිකාව ඇතුළු රටවල් 47 කට (2006 මාර්තු 21 වැනි දින වන විට) රෝගය ව්‍යාප්ත වී ඇත. එම රටවලින් වාර්තා වූ රෝගී මිනිසුන් සියළු දෙනාම සජීවී රෝගී කුරුල්ලන් හෝ මියගිය රෝගී කුරුල්ලන් සමග සෘජු සම්බන්ධතා පැවැත් වූ අය වේ.

දනට ශ්‍රී ලංකාවෙන් කිසිම H5N1 රෝග තත්ත්වයක් වාර්තා වී නොමැත. කෙසේ වුවද, ශ්‍රී ලංකාව අවට ඇති ඉන්දියාව, පකිස්ථානය, කාම්බෝජය, චීනය, ඉන්දුනීසියාව, මැලේසියාව, මියන්මාරය, තායිලන්තය සහ වියට්නාමය වැනි රටවල රෝගය පැවතීම නිසා, ශ්‍රී ලංකාව ඊට පහසුවෙන් ගොදුරුවිය හැකි තත්ත්වයක පවතී. සංචාරක පක්ෂීන්, සජීවී පක්ෂීන් සහ ආහාරයට ගන්නා කුරුළු මස් නිෂ්පාදන ආනයනය සහ රෝගයට ගොදුරු වූ රටවලින් පැමිණෙන සංචාරකයන් මගින් රට තුළට රෝගය ඇතුළු විය හැකිය. වෙනත් බොහෝ ආසියානු රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද ග්‍රාමීය ජනතාව ගෙවතු ආශ්‍රිතව කුකුළන් ඇතිකිරීම නිසා මිනිසුන්ට රෝගය පැතිරයාමේ දැඩි අවදානමක් පවතී. සජීවී කුකුළන් අලෙවිකරන වෙළෙඳපොළවලදී මිනිසුන්ට වෛරසය ඇතුලුවීමේ ඉඩකඩ වැඩි බැවින් එයද දැඩි අවදනම් සහිත අංශයක් ලෙස සැලකිය හැක.

ආහාරය පිණිස ගන්නා කුකුළන් හා තාරාවුන් වැනි සතුන්ගේ නිෂ්පාදන ශ්‍රී ලංකාවේ ජනතාවට ප්‍රෝටීන් සපයන ඉතා වැදගත් ප්‍රභවයක් වන අතර මෙම කර්මාන්තයෙන් 75,000 ක් පමණ ජනතාවට සෘජු රැකියා අවස්ථා සහ දශ ලක්ෂයක් පමණ ජනතාවට වක්‍ර ලෙස රැකියා අවස්ථා සපයනු ලැබේ. වක්‍ර ලෙස මෙම කර්මාන්තයට සම්බන්ධවන අය අතරට සත්ව ආහාර සපයන්නන් සහ කර්මාන්තයට යෙදවුම් සපයන මෝල් හිමියන් ද අයත් වේ. කුකුළු පාලන ගොවියන්ගෙන් සියයට 80 ක් පමණ කුඩා ගොවීන් ගණයට අයත්වන අතර ඉතිරි සියයට 20 මධ්‍යම සහ මහා පරිමාණ ගණයට අයත් වේ. අසල්වැසි රටවල කුරුලු උණ ව්‍යාප්තවීමත් සමග පාරිභෝගික ඉල්ලුම දැඩි ලෙස පහත වැටීම නිසා, කුකුළු මස් සහ බිත්තර මිල නිෂ්පාදන පිරිවැයටත් වඩා අඩු මට්ටමකට පහළ යාමෙන් කුකුළු පාලන ගොවියන්, යෙදවුම් නිපදවන්නන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් දැඩි අපහසුතාවයකට පත්විය.

රෝගය වැළැක්වීමේ ක්‍රමෝපායක් ලෙස ආසාදිත රටවලින් ආනයනය කරන සජීවී කුරුල්ලන් හා කුරුලු මස් නිෂ්පාදන සීමා කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දනටමත් පියවර ගෙන ඇත.

1. මෙවැනි වසංගතයක් භූගෝලීය වශයෙන් රටවල්, කලාප හා ලෝකය පුරා පුළුල් ලෙස ශීඝ්‍රයෙන් පැතිරයාමට ඉඩ ඇත.

කුකුළු ගොවිපලවල යම් අධික මරණ අනුපාතිකයක් ඇති වුවහොත් වහාම වාර්තා කිරීම පිණිස අවධානයෙන් සිටීමට පශු වෛද්‍යවරුන්ට උපදෙස් දී ඇත. සංචාරක පක්ෂීන් වැඩිපුරම ගැවසෙන ජලාශ ආශ්‍රිත ස්ථාන පිළිබඳව දැඩි සෝදිසියෙන් සිටීම සඳහා ද දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. රෝග වැළැක්වීමේ වැඩපිළිවෙළවල් ඇරඹීමට සහ මුල් අවධියේ රෝගය හඳුනා ගැනීමට සහ රෝගය වළක්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා රසායනාගාර සහ විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ ධාරිතාව සවිමත් කිරීමට ප්‍රතිපාදන වෙන්කර ඇත. අනෙකුත් අදාළ ආයතන සමග ඒකාබද්ධව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් කුකුළු පාලන ගොවීන් සහ අනෙකුත් පාර්ශ්වයන් දැනුවත් කිරීම සඳහා රෝග ලක්ෂණ හඳුනාගැනීම සහ කුරුල්ලන්ට රෝගය වැළඳී ඇතැයි සැකයක් ඇති අවස්ථාවලදී ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩපිළිවෙල් ආරම්භ කරන ලදී.

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කුරුලු උණ සඳහා ජාතික තාක්ෂණික කමිටුවක් පිහිටුවනු ලැබූ අතර එමගින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ අමාත්‍යාංශවල සහයෝගය ඇතිව ඉන්ෆ්ලුවෙන්සා වසංගතයට සූදනම් වීමේ ජාතික සැලැස්මක් **(National Influenza Pandemic Preparedness Plan- NIPPP)** පිළියෙළ කර ඇත. රෝගය පැතිරයාම වැළැක්වීමේ සහ රෝගය පැතිරෙන අවස්ථාවකදී රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා අනෙකුත් අදාළ ආයතනයන් සමග සමීප සම්බන්ධතා පවත්වා ගනිමින් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් අනුගමනය කළයුතු ක්‍රමෝපායයන් හා ක්‍රියාකාරිත්වයන් මෙම සැලැස්ම මගින් දක්වා ඇත. දැඩි ලෙස ව්‍යාප්ත වන කුරුලු උණ වසංගතයට සූදනම්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රධාන ක්‍රමෝපායයන් 5 ක් මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

- සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය : මෙමගින් සූදනම්වීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී එක් එක් ආයතනයේ කාර්යභාරය හා වගකීම සහ තීරණ ගැනීම සඳහා අනුගමනය කළයුතු සම්බන්ධීකරණ ක්‍රියාමාර්ගය අර්ථ දක්වා ඇත.
- අවධානය සහ පූර්ව අනතුරු ඇඟවීම : සතුන්ගේ සහ මිනිසුන්ගේ රෝග සොයාබැලීම සහ රසායනාගාර සවිමත් කිරීම මීට ඇතුළත් වේ.
- රෝගය වැළැක්වීම සහ පාලනය : පොදු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම ක්‍රියාත්මක කිරීමෙන් මිනිසුන් අතර ඉන්ෆ්ලුවෙන්සා රෝගය පැතිරයාම අවම කිරීමට සහ එන්නත් තොග ප්‍රමාණවත් ලෙස සපයා ගැනීම සඳහා විශේෂිත වූ උපාය මාර්ග ඇතුළත් වේ.
- සෞඛ්‍ය පද්ධතියේ ප්‍රතිචාරය : හදිසි වසංගත තත්ත්වයක් ඇතිවුවහොත් රෝහල් හා සෞඛ්‍ය සේවා සඳහා ඇතිවන ඉහළ ඉල්ලුම ප්‍රමාණවත් ලෙස සපුරාලීම සඳහා සෞඛ්‍ය ආරක්ෂණ අංශය සවිබල ගැන්වීම ඇතුළත් වේ.
- අවදනම නිවේදනය කිරීම : එක් එක් වසංගත අවධිවල දී පොදු ජනතාවට, සෞඛ්‍ය ආරක්ෂක අංශවල නිලධාරීන්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට නිසි තොරතුරු ලබාදීම සඳහා පුළුල් වූ සංනිවේදන ක්‍රමෝපායක් මීට ඇතුළත් වේ.

රෝග හඳුනාගැනීම, පාලනය සහ වැළැක්වීමේ ක්‍රමෝපායයන් සවිස්තරව දක්වා ඇති 'කුරුලු උණ වසංගත තර්ජනයකට ප්‍රතිචාර දැක්වීමට සූදනම් වීමේ උපදෙස් මාලාවක්' සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ සියළුම නිලධාරීන්ට දැනටමත් නිකුත් කර ඇත. සෞඛ්‍ය ආරක්ෂක සහ පෝෂණ අමාත්‍යාංශය සහ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වසර 3 ක කාලපරිච්ඡේදයක් තුළ (2005/06 - 2008) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන අවශ්‍යතාවය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 7.5 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර ඇත. මෙම වසංගතයට සූදනම් වීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික අපහසුතා පවතින බැවින්, ප්‍රමාණවත් ලෙස ප්‍රතිවෛරස බෙහෙත්, එන්නත්, අවශ්‍ය රසායනාගාර උපකරණ සහ රෝහල් පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතා පවතී.

රටෙහි සෞඛ්‍ය ආරක්ෂිත පද්ධතියේ ධාරිතාවය, සහ රෝගයට මුහුණදීමේ සූදනම මත වසංගතයෙන් ආර්ථිකයට ඇතිවන බලපෑමේ දැඩි බව රඳා පවතී. තවද, නිසි පරිදි ප්‍රතිකාර කිරීම සඳහා ඖෂධ මිලදී ගැනීම හා බෙදහැරීම, එන්නත් සහ පහසුකම් සැලසීම ආදිය සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් තිබීම හා මිනිස් සංචලනයන් සීමාකිරීමද බලපායි. රෝග වැළැක්වීමේ හා නිවාරණ සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම, සූදනම්වීමේ සැලැස්ම යටතේ ආහාර ද්‍රව්‍ය තොග එක්රැස් කිරීම, කුකුළන් මරණයට පත්කිරීම වෙනුවෙන් කුකුළු පාලන කර්මාන්තකරුවන්ට වන්දි ගෙවීම ආදිය සඳහා පූර්ව වසංගත අවධියේ දී ද සංචාරක අංශයට පාඩු සිදුවීම මෙන්ම, වසංගත අවධියේ දී ව්‍යාපාර වලින් පාඩු සිදුවීම ආදිය ද නිසා රාජ්‍ය මූල්‍ය අංශයට දැඩි බලපෑම් ඇතිවිය හැකිය.

කුරුලු උණ වසංගත රෝගයක් බවට පත්වීමෙන් ආර්ථිකයට ඇතිවිය හැකි බලපෑම සැලකිල්ලට ගෙන සියලු ප්‍රධාන ආයතනයන් ඔවුන්ගේ සේවා බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාමේ සැලැස්මක් **(Business Continuity Plan - BCP)** පිළියෙළ කළයුතුව ඇත.

- **කර්මාන්ත ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය වී නොතිබීම එම කර්මාන්ත වලට බාහිර කම්පනවලින් ඇතිවන පීඩනය වැඩි වීමට හේතු වී ඇත.** ඇඟළුම්, රබර් ආශ්‍රිත නිෂ්පාදන, පිහන් භාණ්ඩ සහ සකස් කළ ආහාර පාන ආදී නිෂ්පාදන කාණ්ඩ කීපයක් මත ශ්‍රී ලංකාවේ කාර්මික අංශය ඒකරාශී වී ඇත. කාර්මික අංශයන්ගේ ව්‍යාප්තිය සඳහා ඇති බාධාවන් ඉවත් කිරීම, කම්පනවලට ඔරොත්තුදීමේ හැකියාවක් සහිත පුළුල් කාර්මික අංශයක් ඇති කිරීම සඳහා හේතු වනු ඇත.

- **ආර්ථික වර්ධනය 2004 වර්ෂයට වඩා 2005 වර්ෂයේ වැඩි අගයක වූ අතර, රටේ ආර්ථික ව්‍යුහයේ ශක්තිමත්භාවය සහ දුර්වලතාද පිළිබිඹු විය.** මුළු ජනගහනයෙන් සියයට 3 ක් සහ රටේ මුළු නිමැවුමෙහි සියයට 5 කට වඩා අඩුවෙන් දායක වන ධීවර හා සංචාරක අංශ දෙකට සුනාමිය ඉතා හානිකර ලෙස බලපෑවේය. කෙසේ නමුත් ආර්ථිකයේ ශක්තිමත්භාවය පෙන්නුම් කරමින්, 2005 වර්ෂය සඳහා නිමැවුමේ වර්ධනය, සුනාමි ව්‍යසනයට පෙර බලාපොරොත්තු වූ අගයට සමාන අගයක් ගැනීමට හේතු වූයේ වෙනත් අංශයන් වන කෘෂිකාර්මික අංශයේ පුරෝකථනය කළ වර්ධනයට වඩා වැඩි වර්ධනයක් වීමයි. මේ අතර ඉහළ ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ දේශීය කෘෂිකර්මාන්තයේ ඉහළ නිමැවුමට සහ විදුලි උත්පාදනයෙහි ඉහළ එකතුකල අගයට උපකාරී වූ යහපත් කාලගුණික තත්ත්වයන් වීම 2005 වර්ෂයේ නිමැවුම් ව්‍යුහයේ දුර්වලතාවයන් ලෙස දිස් විය. මෙම අංශ දෙකින් ලැබුණු දායකත්වය, ධීවර සහ හෝටල් හා ආපනශාලා අංශයේ දායකත්වය පහත වැටීම සහ ආනයනයන්ගේ දායකත්වය පහළ යාමට වඩා වැඩි විය.

- **ආර්ථික වර්ධනය, කාලගුණික හේතු මත පදනම් වූ කෘෂිකර්මාන්තය හා විදුලි උත්පාදන යන අංශයන්හි යහපත් ක්‍රියාකාරිත්වය මත විශාල වශයෙන් රඳා පැවතීම දිගුකාලීනව ස්ථිරසාර නොවනු ඇත.** ඒ අනුව ඉහත සඳහන් කළ කාර්මික, කෘෂිකාර්මික අංශ මෙන්ම, සේවා අංශයට ද අදළ වන යටිතල පහසුකම් සංවර්ධනය හා නීති පද්ධතියේ වෙනස්කම් හා කාර්යක්ෂම ක්‍රියාවට නැංවීම් ඇතුළත් වන දිගුකාලීනව ස්ථිරසාර ආර්ථිකයක වර්ධන අරමුණු සඳහා වූ දැඩි කැපවීම, ශ්‍රී ලංකාව සියයට 6 - 8 අතර ඉහළ වර්ධන මාවතක් කරා ළඟාවීමේ මූලික හා ප්‍රමුඛ ප්‍රතිපත්තිය විය යුතු වේ.

- **වියදම් පැත්තෙන් ගත් කල නිමැවුම් වර්ධනයට, දේශීය හා විදේශීය යන දෙකෙහිම ඉල්ලුමේ මූර්ත වර්ධනය ගාමකත්වයක් සැපයීය. මේ අතර, විදේශීය ඉල්ලුම මඳ වශයෙන් 2004 වර්ෂයට වඩා අඩු වුවද, ලෝක වෙළෙඳපොලේ තරඟකාරිත්වය හමුවේ එය යහපත්ව පැවතිනි.** මේ බව ඵලදායිතා වර්ධනයන්, පෞද්ගලික නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිපුණතා සංවර්ධනය හා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් කරනු ලබන පිරිවැය අවම කිරීම් සහ ගෝලීය අභියෝගයන් හමුවේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය තුළින් පිළිබිඹු විය. ආසියාවේ දැවැන්ත ආර්ථිකයන් සමඟ ඉන්දියාව, චීනය ඉතා වැඩි වේගයකින් ප්‍රසාරණය වෙමින් පවතී. ශ්‍රී ලාංකික භාණ්ඩ සඳහා වන විදේශීය ඉල්ලුමේ අඛණ්ඩභාවය සුරක්ෂිත කිරීමට මෙම ඵලදායිතා වර්ධන ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාත්මක කළයුතු වේ.

- **සටන් විරාමයට පසු එළඹී වර්ෂ දෙකෙහි වූ සුභවාදී තත්ත්වයට සාපේක්ෂව, පරිභෝජනය සහ ආයෝජනය සමන්විත වන දේශීය ඉල්ලුමෙන්, නිමැවුමට ලැබුණු ගාමකත්වය මධ්‍යස්ථ වශයෙන් අඩු විය.** 2003 හා 2004 වර්ෂවල රට තුළ වූ ඉල්ලුම හේතුවෙන් දේශීය නිමැවුම පිළිවෙලින් සියයට 8 කින් හා සියයට 6 කින් මූර්ත වශයෙන් වර්ධනය විය. ඵලදායක ආයෝජන වල ප්‍රසාරණය හා ඉහළ ඵලදායි මට්ටම් සමඟ භාණ්ඩ හා සේවා සඳහා වූ ඉල්ලුමේ මූර්ත හා ස්ථිරසාර වර්ධනය, රටේ ආර්ථික සංවර්ධනය සැළකිය යුතු ලෙස ඉහළ නංවනු ඇත. මෙම සමස්ථ වර්ධන ගාමකත්වය ලබා කර ගැනීම සඳහා අවශ්‍ය පරිසරය ඇති කරවීමට රාජ්‍ය ප්‍රතිපත්තීන් යොමුවීම අත්‍යාවශ්‍ය වේ.

- **ඉදිරි රජයන් පාරිභෝගිකයන්ගේ හා දේශීය නිෂ්පාදකයන්ගේ ප්‍රශ්න කෙටිකාලීනව ආමන්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය වන අතරම, ඵලදායී ආයෝජන ප්‍රසාරණය තුළින් අනාගත ධාරිතා ප්‍රසාරණයන්ට ඇති බාධාවන් වෙත යොමුවීම ද වැදගත් වේ.** පාරිභෝගික භාණ්ඩ නොවන ආනයනයන් වන අතරමැදි භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ යන දෙවර්ගයම 2005 වර්ෂය තුළ පහත වැටීම සුළුකොට තැකිය නොහැකි වන්නේ මෙම භාණ්ඩ අනාගත ආර්ථික ක්‍රියාකාරිත්වයේ හා ප්‍රසාරණයේ නියමු දර්ශකයන් වන බැවිනි. සමහර ක්ෂේත්‍රවල ධාරිතා සීමාවන් නිසා වර්ධනය පහත වැටී තිබූ අතර, යටිතල පහසුකම්වල ඌණතාවය හා අකාර්යක්ෂම ක්‍රියාවලි හා පරිපාටි හේතුවෙන් වෙනත් ක්ෂේත්‍රයන්ගේ වර්ධනයන් ලඟාකර ගත හැකි මට්ටමට වඩා පහළ මට්ටමක විය. ශ්‍රී ලංකාවට ඉහළ ස්ථිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කරගත හැකි වන්නේ, එම ක්ෂේත්‍රයන්ගේ වර්ධන හැකියාවන්ට අනුකූල වන පරිදි අදළ ධාරිතාවයෙන් යුත් ක්ෂේත්‍ර සඳහා පවතින යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ නම්‍යශීලී ක්‍රියාකාරීත්වය සඳහා වූ ක්‍රියාවලි හා පරිපාටි ද, ප්‍රාග්ධන, ඉඩම් හා භාණ්ඩ වෙළෙඳපොළ සංවර්ධනය කිරීමද සඳහා ප්‍රමුඛත්වය ලබා දීමෙන් පමණි.